# දායාද

අතීත අභිමන හෙටටත්

පුරාවිද්‍යා පුවත් අටුවාව

2016
ජූලි
දහවන කලාපය

පුරාවිද්‍යා
දෙපාර්තමේන්තුවේ
ප්‍රකාශනයකි

අධ්‍යාපන අමාත්‍යාංශය


## මහගල්වැව පුරාවිද්‍යා කැණීමෙන්
# පූර්ව ඓතිහාසික යුගයේ සාධක මතුවෙයි...







දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහගල්වැව ග්‍රාමයේ පුරාවිද්‍යා කැණීම් මඟින් පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි සංකීර්ණයක නටබුන් හමුව ඇත. කැණීම් මඟින් හමුවූ බරණී තුළ ඇති පබලු වර්ග, යකඩ අවශේෂ, මැටි බඳුන්, අස්ථි අවශේෂ ආදියෙන් පූර්ව ඓතිහාසික යුගයේ සුවිශේෂ සංස්කෘතික ලක්‍ෂණ ප්‍රකට කරන බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පුරාවිද්‍යා අධ්‍යක්‍ෂ ජනරාල් මහාචාර්ය සෙනරත් දිසානායක මහතාගේ උපදේශකත්වය හා මග පෙන්වීම යටතේ කැණීම් කටයුතු සිදු කෙරේ. මේ පිළිබඳව ලියැවුණු ලිපියක් 02 පිටුවේ පළ කෙරේ.

ශ්‍රී ලාංකීය ප්‍රෞඪ උරුමයේ පෙර ගමන්කරු

## සිය 125 වන වර්ෂ පූර්ණය සැමරූ වගයි...



ශ්‍රී ලාංකීය ප්‍රෞඪ උරුමයේ පෙර ගමන්කරු සිය 125 වැනි වර්ෂ පූර්ණය අතිඋත්කර්ෂවත් අයුරින් සමරනු ලැබීය. මෙම උත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ සහ ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු මැති ඇමතිවරු රැසකගේ ද රාජ්‍ය නිලධාරීන් රැසකගේ ද සහභාගිත්වයෙන් සමරනු ලැබීය. මේ පිළිබඳව විස්තර හා ඡායාරූප 03 පිටුවේ පළ කෙරේ.

පුරාවිද්‍යා උරුමය සුරැකීම වෙනුවෙන්

## දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක්



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් ප්‍රවර්ධන අංශය සහ පුරාවස්තු විනාශය වැළැක්වීමේ ඒකකය සංවිධානය කරනු ලබන පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට අමතරව ලංකාවේ සියලු පළාත් කාර්යාලයන්හි මෙහෙයවීමෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාවට නඟා ඇත. මෙවර එහි තේමාව වනුයේ "පුරාවස්තු කළමනාකරණය: ජනමත, දුර්මත, යථාර්ථය" යන්නයි.

ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයන්හි කාර්ය මණ්ඩලය ගෙයින් ගෙට ගොස් මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රායෝගික වැඩසටහනක් වූ මේ සඳහා පළාතේ ග්‍රාමසේවක, පොලිස් ස්ථානය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආදී රාජ්‍ය ආයතන නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට යෝජිතය.

ඇතුළත පිටු


ක්ෂේත්‍ර පුරාවිද්‍යාව — පිටුව 06

පුරාවිද්‍යාත්මක සාධක හා දේශීය වෛද්‍ය කර්මය — පිටුව 20

පුරා භූ දර්ශනය කළමනාකරණය — පිටුව 28

සඳකත්මිණ — පිටුව 30

නිර්මාණ පිටුව — පිටුව 37

විදෙස් පුරාවිද්‍යා තතු — පිටුව 39

# පුරාවස්තු විනාශයට එරෙහි නඩු මගින් විශාල දඩ මුදලක් උපයා ගැනේ

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශය යටතේ ස්ථාපිත කර ඇති පුරාවස්තු විනාශය වැළැක්වීමේ විශේෂ ඒකකය හා පොලිස් දෙපාර්තමේන්තුවේ අපරාධ කොට්ඨාසයට අනුයුක්තව ඇති පුරාවස්තු ආරක්ෂක ඒකකය මඟින් පුරාවස්තු විනාශය අවම කිරීම උදෙසා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අතර උරුමය සුරැකීමේ වැදගත්කම හා පුරාවස්තු පිළිබඳව මහජනතාව තුළ ඇති මිථ්‍යා මතවාද පිළිබඳව පාසල් සිසුන් මෙන්ම රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා අඛණ්ඩව දේශන, සම්මන්ත්‍රණ ආදිය සිදු කරමින් පවතී.

ඒ අනුව 2015 ජුලි මස සිට 2016 වසරේ මැයි මස දක්වා ලංකාව පුරා වැඩමුළු හා දේශන 1520ක් පමණ පවත්වා ඇත.

2015 ජුලි මස සිට මේතාක් පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන් පුරාවස්තු සොරකම, පුරාවස්තු විකෘතිය හෝ අලාභය, පුරාවස්තු සෙවීමට අනවසර කැණීම් කිරීම, පනතට ගැනෙන වෙනත් වැරදි ලෙස සිද්ධීන් 165ක් පමණ වාර්තා වී ඇති අතර අත්අඩංගුවට පත් සැකකරුවන් ප්‍රමාණය 330ක් පමණය. මීට අමතරව සිද්ධීන් 115ක පමණ විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

2015 ජුලි මස සිට දෙසැම්බර් මස දක්වා එක්කෝටි නවලක්ෂ දහසක (10,901,000.00) දඩ මුදලක් ද, 2016. 01. 01 සිට 2016. 06. 07 දක්වා එක්කෝටි හතළිස් හත්දහස් දෙසීයක දඩ මුදලක්ද අය කරගෙන ඇත.

**උදේනි වික්‍රමසිංහ**

01 පිටුවෙන් ....

## මහගල්වැව පුරාවිද්‍යා කැණීමෙන්...

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහගල්වැව ග්‍රාමයේ මෙම කැණීම් භූමිය පිහිටා ඇත.

මෙම සුසාන සංකීර්ණය 2008 වර්ෂයේ හම්බන්තොට කලාප නිලධාරී සුමේධ පණ්ඩිතවත්තගේ මහතා විසින් සොයා ගෙන ඇත. කැණීම් කටයුතු දියත් කරන ලද්දේ රුහුණු විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා විෂය හදාරන සිසුන්ට ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සඳහාත් නිධන් හොරුන්ගේ තර්ජනයට බඳුන් වී තිබූ මෙම සුසාන කැණීම් කර සංරක්ෂණය කිරීමේ අරමුණු පෙරදැරි කර ගෙනය.

කැණීම් කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සෙනරත් දිසානායක මහතාගේ මගපෙන්වීම යටතේ කැණීම් අධ්‍යක්ෂ එස්.ඒ.ටී.ජී. ප්‍රියන්ත මහතාගේ උපදෙස් මත ගාල්ල පුරාවිද්‍යා කාර්යාලය මඟින් සිදු කරනු ලැබීය.



රුහුණු විශ්ව විද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයන අංශයේ පීඨාධිපති මහාචාර්ය සුමනසිරි වාව්වගේ මහතාත්, බාහිර කථිකාචාර්ය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු කැණීම් අධ්‍යක්ෂ ආචාර්ය නිමල් පෙරේරා මහතා ද විශ්ව විද්‍යාලයේ සිසුන් සමඟ කැණීම් කටයුතු සඳහා සහභාගි වූහ.

ප්‍රාග් ඓතිහාසික යුගයත් ඓතිහාසික යුගයත් අතර සංක්‍රාන්තික අවධිය ලෙස හඳුන්වන පූර්ව ඓතිහාසික යුගය, ප්‍රොටෝ ඉතිහාසය (Proto History) පූර්ව යකඩ යුගය (Early Iron Age) ප්‍රොටෝ ඓතිහාසික යකඩ යුගය (Proto Historic Iron Age) ලෙස ද හඳුන්වයි.

මෙම යුගය ප්‍රධාන වශයෙන්, යකඩ තාක්ෂණය, ස්ථිර වාසස්ථාන, සතුන් ඇති කිරීම, ධාන්‍ය වගාව, මැටි බඳුන් තාක්ෂණය, සුසාන හා අභිචාරවිධි යන සුවිශේෂී සංස්කෘතික ලක්ෂණයන්ගෙන් පොහොසත් වේ. ආචාර්ය දැරණියගල මහතා සිදු කර ඇති පර්යේෂණ අනුව පූර්ව ඓතිහාසික යුගයේ සාධක ක්‍රි.පූ. 900-1000 දක්වා දිවේ. නමුත් මෑතදී සිදු කළ පර්යේෂණ අනුව මහාචාර්ය සෝමදේව මහතා සිදු කළ හල්දුම්මුල්ල කැණීම් තුළින් එම යුගයේ සාධක ක්‍රි.පූ. 1700 දක්වා දිවෙන බව සොයාගෙන ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කැණීම් කරන ලද භූමියෙන් සුසාන 19 ක සාධක හමු විය. ඉන් සුසාන 3 ක් කැණීම් කරන ලදී.

මෙම සුසාන වල සුවිශේෂී ලක්ෂණය වන්නේ හතර පැත්තට ගල් පුවරු 4 ක් සිටුවා සකස් කරන ලද ශිලා මංජුසා (Cist burial) වේ. ශිලා මංජුසා හැරුණ විට පොම්පරිප්පුවේ කැණීම් වලින් සොයා ගන්නා ලද බරණි සුසාන (Urn burial) මෙහි දක්නට ඇත. මේවා ශිලා මංජුසා වලට පිටතින් තැන්පත් කර ඇත.

මෙම සුසාන සංකීර්ණය සමීපයේ මීටර් 200 ක් පමණ දුරින් ඇති නයිස් පාෂාණ උද්ගතය තුළින් ඔවුන් සුසාන සඳහා අමුද්‍රව්‍ය ලබා ගන්නට ඇතැයි උපකල්පනය කළ හැක.

කැණීම් තුළින් හමු වූ බරණි තුළ තිබී හමු වූ පබලු වර්ග, යකඩ අවශේෂ, මැටි බඳුන්, අස්ථි අවශේෂ තවදුරටත් විශ්ලේෂණයට බඳුන් කළ යුතුය.



විශාල බරණි තුළ කුඩා මුට්ටි හමු වේ. සමහර ඒවා පියනකින් වසා ඇති අතර සමහර ඒවාට පියනක් නොමැත. මෙම මැටි බඳුන් කාල රක්ත වර්ණ (BRW) හා රක්ත වර්ණ (RW) බඳුන් වේ. මේවා පූර්ව ඓතිහාසික යුගයේ සුවිශේෂී සංස්කෘතික ලක්ෂණ වේ.

මෙහි ලැබී ඇති අස්ථි අවශේෂ අනුව ද්විතීයික වැළලීම් ක්‍රමයට අනුව තැන්පත් කර ඇති බව (Secondary burial System) පැහැදිලි වේ.

මෙම ස්ථානයේ පර්යේෂණ කටයුතු තවදුරටත් සිදුකරමින් පවතින අතර විශ්ලේෂණ මට්ටමේ පවතී. අනාගතයේ දී තවත් බොහෝ කරුණු මෙම පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ අනාවරණය කරගත හැකි වේ.

මෙම කැණීම් ව්‍යාපෘතියේ ව්‍යාපෘති නිලධාරී සම්පත් ගරුසිංහ මහතා සහ කැණීම් නිලධාරී බුද්ධි නාගොඩවිතාන මහතා, උදේනි අරුණසිරි මහතා, සුසන්ත නිහාල් මහතා ඇතුළු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවක මහතුන් උරුමය අනාගත පරපුරට දායාද කරන්නට දරනු ලබන ප්‍රයත්නය පිළිබඳව ආඩම්බර විය යුතුය.

**ඒ. ඩී. එම්. වසන්තා අලහකෝන්**
සහකාර අධ්‍යක්ෂ
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
කොටුව, ගාල්ල.



## ශ්‍රී ලාංකීය ප්‍රෞඪ උරුමයේ පෙර ගමන්කරු සිය 125 වන වර්ෂ පූර්ණය සැමරූ වගයි...

ලෝකයේ කුමන රටක වුව කිසියම් ආයතනයක් වසර 125ක් තරම් දිගු ඉතිහාසයකට හිමිකම් කීම විශිෂ්ටය. එම විශිෂ්ටත්වයේ අගය තවත් තීව්‍ර වනුයේ රටක අතිශයින්ම වටිනා විෂය පථයක් නියෝජනය කරමින් ශක්තිමත් ප්‍රගමනයකින් එය වර්ධනය වනු දැකීමය. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක කටයුතු ආයතනයක් ලෙස අරඹා පසුගිය වසරට වසර 125ක් සපුරාලනු ලැබීය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ සහ ශ්‍රී ලංකාවේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයීය පරිශ්‍රයේ දී උත්සවශ්‍රීයෙන් සමරන ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ඉතිහාසයට ස්මරණීය මතක සටහනක් එක්කළ එම සැමරුම් උළෙලේ අවස්ථා කිහිපයක් මෙලෙස පෙළ ගසමු.



අතිගරු ජනාධිපතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍යතුමන් ඇතුලු සම්භාවනීය අමුත්තන් උත්සවය සඳහා සහභාගී වෙමින්...



සම්භාවනීය අමුත්තන් පුරාවස්තු ප්‍රදර්ශනය නරඹින්..



පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් ජනාධිපතිතුමන් වෙත සමරු පලක හා ප්‍රකාශන පිළිගැන්වීම...



එවකට අමාත්‍යාංශ ලේකම්තුමිය විසින් ප්‍රකාශන පිළිගන්වමින්...



පුරාවස්තු ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි පාසල් ළමුන්ගෙන් කොටසක්...

ඡායාරූප :- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් දෙස් විදෙස් පුහුණු පාඨමාලා රැසක්

ලෝකයේ කවර ආයතනයකට වුව සංවර්ධනය කරා ළඟාවීමට හැකිවනු ඇත්තේ එහි මානව සම්පත ඉහළ තලයකට ඔසවා තැබීම මතය. එහිලා ඔවුන් වෙත සැපයෙන දෙස් විදෙස් පුහුණුව අතිශය තීරණාත්මක සාධකයක් වනු ඇති. මේ කාරණාව මනා සේ වටහාගත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිය ආයතනයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් දෙස් විදෙස් පුහුණු පාඨමාලා රැසක පරිචය ලබන්නට අවකාශ සලසා ඇත.

ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශාස්ත්‍රීය අංශ වෙත (ගවේෂණ, කැණීම්, සංරක්ෂණ, අභිලේඛන, නඩත්තු, ප්‍රකාශන) පාඨමාලා රැසක් මෙන්ම පාලන, ගිණුම් අංශ සඳහා ද පුහුණු පාඨමාලා තෝරා ගෙන ක්‍රියාවට නඟා ඇත. ඒ අතරින් පාලන අංශයේ හැකියා වර්ධනය, ගිණුම් අංශයේ නිලධාරී පුහුණුව ද ඵලදායිතා පුහුණු වැඩසටහන් ද විශේෂය. ඒ අතරින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් මෙහෙය වන දෙමළ භාෂා පාඨමාලා, ලිපිගොනුකරණය හා කාර්යාල ලිපි ලිවීම පිළිබඳ පුහුණු වැඩසටහන් ද, සංචාරක බංගලාකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුද කැපී පෙනේ. ශාස්ත්‍රීය අංශ වෙනුවෙන් පුරාවිද්‍යා දර්ශනපති උපාධි පාඨමාලා, බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඉංග්‍රීසි පාඨමාලා, පුරාවිද්‍යා පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා මෙන්ම වෙනත් රාජ්‍ය ආයතන මගින් මෙහෙයවන පාඨමාලා ද විශේෂිතය. මීට අමතරව ජපානය, චීනය, ඉතාලිය, ප්‍රංශය, නේපාලය වැනි රටවල පුහුණු පාඨමාලා සඳහා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සහභාගි කරවීම ද ප්‍රමුඛ වෙයි. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුහුණු පාඨමාලා සඳහා වාර්ෂිකව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් විශාල මූල්‍ය ප්‍රතිපාදනයක් වෙන් කරයි.

## සංචාරක බංගලා භාරකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව

ලංකාව පුරා ව්‍යාප්තව ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලා හා ක්ෂේත්‍ර නිවාසයන්හි බංගලා භාරකරුවන් හා සහායක මහතුන් පුහුණු කිරීමේ වැඩමුළුවක් පසුගියදා අනුරාධපුර Cey Bank Rest හිදී පවත්වන ලදී.

2016.05.09 දින අතිරේක අධ්‍යක්ෂ ජනරාල් පී. බොරලැස්ස මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එහි සමාරම්භක උත්සවය සඳහා අධ්‍යක්ෂ (නඩත්තු) වරුණි ජයතිලක,

සහකාර අධ්‍යක්ෂ (පාලන) මුදිත විමලසේන, (සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) බී. එම්. ඒ. පී. බස්නායක, (සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) ඒ. පී. අශෝක, (නඩත්තු කළමණාකරු) ඕ. ආර්. ජයතිලක යන මහත්ම මහත්මීන් සහභාගි වූහ.



පුරාවිද්‍යා අධක්‍ෂ ජනරාල්
මහාචාර්ය සෙනරත් දිසානායක මහතා වැඩමුළුව අමතමින්

"අප සතු සීමිත සම්පත් උපයෝගි කරගනිමින් විවේකයට සුදුසු සුවදායක පරිසරයක් ගොඩනගමු" යන තේමාව යටතේ පැවැත්වූ මෙම වැඩමුළුව සඳහා සංචාරක බංගලා භාරකරුවන් හා සහායකයින් 23 දෙනෙකු සහභාගි වූ අතර ආකල්ප වර්ධනය, පිළිගැනීම, භෝජනාගාර සේවය, ගෘහ පාලනය, උද්‍යාන අලංකරණය යන විෂය ආවරණය වන පරිදි විධිමත් මූලික පුහුණුවක් ලබාදෙන ලදී.

අනුරාධපුර වෘත්තීය පුහුණු අධිකාරි හෝටල් පාසලේ ප්‍රවීණ උපදේශකයින්ගේ සම්පත් දායකත්වය ලබා ගනිමින් පැවැත්වූ තෙදින වැඩමුළුවෙහි සාර්ථකත්වය උදෙසා ඇල්කාඩෝ ආයතනය (සම්පත් දායකයින් සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය) අනුරාධපුර අවස්ථා, ෆාර්ම් ගාර්ඩන්, ෆොරස්ට් රොක් විව් (ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා අනුග්‍රාහකත්වය) සංචාරක නිකේතනයන්ගේ අනුග්‍රාහකත්වය ලබාදීම මෙහිදී කැපී පෙනුනි.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සෙනරත් දිසානායකයන්ගේ ප්‍රධානත්වයෙන් දේශණ මාලාවේ දෙවැනි දිනය නිමාවට පත් වූ අතර එතුමන්ගේ සපැමිණීම බංගලාභාරකරුවන් දිරිමත් කිරීමට මහත් රුකුලක් විය. වැඩමුළුවේ අවසන් ඉලක්ක කරා ඔවුන් රැගෙන යාමට උචිත හරවත් දේශණයක් පවත්වමින් සහභාගීත්වය උදෙසා සහතික පත් පිරිනැමීම අධ්‍යක්ෂ ජනරාල් අතින් සිදු කෙරිණි.

මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා නඩත්තු අංශයේ සියලුම කාර්ය මණ්ඩලයේ නොමඳ සහයෝගය ලැබුණි.



ප්‍රායෝගික අධ්‍යයන සිදුකරමින්

**තොරතුරු සම්පාදනය**
ආර්. ඩී. ඊ. එම්. තිලකරත්න (පාලන අංශය)
පී. එම්. ආර්. ප්‍රියදර්ශනී (නඩත්තු අංශය)

# ලංකාවේ ප්‍රධාන පුරාවිද්‍යා ව්‍යාපෘති රැසක
## සංරක්ෂණ කටයුතු අවසන් අදියරේ...


පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පසුගිය වසර කිහිපය තුළ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර, නීලගිරිය, යුධගනාව, දීඝවාපිය වැනි අතිවිශාල දාගැබ් සංරක්ෂණ කටයුතු මෙන්ම ඓතිහාසික රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීමත් අවුකන, මාළිගාවිල වැනි සුවිශාල බුද්ධ ප්‍රතිමාවලට මෙන්ම පොළොන්නරුව තිවංක පිළිමගෙයට ආවරණ වහළ යෙදීමත්, මඩුවන්වෙල වලව්ව සහ නුපේ පැරණි ඕලන්ද වෙළඳසැල සංරක්ෂණය සහ යාපනය කොටුව සංරක්ෂණ කටයුතු, අනුරාධපුර නව සංචාරක බංගලාව ඉදිකිරීම ද ඉන් ප්‍රධාන වේ.

බණ්ඩාරවෙල බෝටන් බංගලාව සංරක්ෂණය සහ රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංවර්ධන කටයුතු ද මේ වසරේ සිට ක්‍රියාත්මක වේ.

වර්ෂ ගණනාවක් මුළුල්ලේ අව්වට සහ වැස්සට නිරාවරණය වෙමින් පුරාවිද්‍යාත්මක සාධක විශාල වශයෙන් වැනසී යන තත්ත්වයක පැවැති පොළොන්නරුව තිවංක පිළිමගෙය සඳහා ආවරණ වහල සකස් කර ආරක්ෂාව තහවුරු කර ඇති අතර, එහි සිතුවම් සංරක්ෂණ කටයුතු මේ වසරේ ආරම්භ කෙරේ.

මඩුවන්වෙල වලව්ව සංරක්ෂණ කටයුතු මේ වන විට සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති අතර, ලංකාවේ වලව් පැළැන්තිය විදහා දැක්වෙන පරිදි සකස් කරනු ලබන පුරාවිද්‍යා කෞතුකාගාරය ද මේ වසර අවසන් වීමට පෙර මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කෙරේ.


පොළොන්නරුව තිවංක පිළිමගෙය
ආවරණ වහල සකසා අවසන්


දැවැන්ත යුධගනාව චෛත්‍යයේ සංරක්ෂණ කටයුතු
අවසන් අදියරේ


ඓතිහාසික නීලගිරි මහා සෑයේ සංරක්ෂණ කටයුතු
සිදු කෙරෙමින්...


ඓතිහාසික මාළිගාවිල සහ අවුකන බුදුපිළිම සඳහා
ආවරණ වහල යෙදීම අවසන්

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් වැඩකටයුතු අවසන් කර ඇති ව්‍යාපෘති සහ ඉදිරියටත් ක්‍රියාත්මක දැවැන්ත ව්‍යාපෘති පිළිබඳව සවිස්තරාත්මක සටහන් 13 පිටුවේ සිට.......

සිප් සතර

# පුරාවිද්‍යා උරුමයේ අගය නිර්ණය කිරීම සහ බලපෑම් තක්සේරුව

කුමන හෝ භූමියක් තුළ පුරාවිද්‍යාත්මක අගයක් සහිත ස්ථාන හෝ පුරාවස්තු තිබේදැයි යන්න විධිමත් ලෙස පරීක්ෂා කිරීමකට ලක්කිරීමේ දී ඒ සඳහා විද්‍යාත්මකව හා නෛතිකව අනුගමනය කළයුතු ක්‍රමෝපායන් මේ තුළින් සාකච්ඡා කරනු ලබයි. ඒ අනුව පුරාවිද්‍යා හානි ඇගයුම් හෝ පුරාවිද්‍යා ගවේෂණ කාර්යන්හි දී අගය නිර්ණය කිරීම සහ බලපෑම තක්සේරු කිරීමේ දී මෙම ක්‍රමෝපායන් අනුගමනය කිරීමට ඊට වගකිවයුතු ආයතන ක්‍රියාකළ යුතුය.



පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක දී හඳුනා ගන්නා ලද සියලුම වර්ගයේ පුරාවිද්‍යා උරුම ස්ථානයන්ගේ, පුරාවිද්‍යා වටිනාකම මැනබැලීම ඉතාම අත්‍යාවශ්‍ය කරුණකි. මන්දයත් අදාළ සංවර්ධන ක්‍රියාවලියක දී හෝ වෙනත් මානව ක්‍රියාකාරකමක් සිදුවන අතරවාරයේ දී සහ ඉන්පසුව හඳුනා ගත් පුරාවිද්‍යාත්මක උරුමස්ථානයන්ගේ අනාගත පැවැත්ම සඳහා නිසි කළමනාකරණ සැලැස්මක් මේ තුළින් ආවරණය වන නිසාය.

ලොව බොහෝ රටවල ඒ ඒ රට වලට ආවේණික හා පොදු වූ පුරාවිද්‍යා උරුම වටිනාකම් මැන බැලීම සඳහා විවිධ උපමාන හා නිර්ණායකයන් භාවිත කරනු ලැබේ. උදාහරණයක් ලෙසින් ඕස්ට්‍රේලියාව තම ආදිවාසී ප්‍රාග් ඓතිහාසික උරුමය නිසිපරිදි කළමනාකරණය කිරීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය උරුම වටිනාකම් උපමානය (Common Wealth Heritage List) භාවිතා කිරීම කදිම නිදසුනකි. කිනම් උපමානයකින් බැලුව ද සමස්ත ලෝකයේ දකුණු ආසියානු රටවල් අතර අතිවිශිෂ්ට උරුමයක් ශ්‍රී ලංකාවට හිමි ව තිබේ. එම උරුමය කළමනාකරණය පිළිබඳ උසස්ම ආයතනය වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තම ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය මගින් උරුම කළමනාකරණය සඳහා නිර්ණකයක් රැසක් ඉදිරිපත්කර ඇත. පුරාවිද්‍යාත්මක ස්මාරක ක්ෂේත්‍ර සහ වංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ දී ඒවායේ වැදගත්කම පරිමාණ හතකින් අවධානයට ගැනීමට පුරාවිද්‍යා ප්‍රතිපත්තිය කටයුතු කර ඇත. අනතුරුව ඒවා ශ්‍රේණිගත කළයුත්තේ පහත සඳහන් නිර්ණායක පදනමක් සේ ගනිමින් බව ඒ තුළ පැහැදිලිවම සඳහන් කර ඇත.

(අ) දුර්ලභ බව
(ආ) පර්යේෂණ ශක්‍යතා
(ඉ) සෞන්දර්යාත්මක අගය
(ඊ) යථාභූත බව
(උ) ඓතිහාසික සබඳතාව
(ඌ) ආගමික සබඳතාව සහ
(ඍ) සමාජ ආර්ථික සංවර්ධනයට ඇති වැදගත්කම

ඒ අනුව පුරාවිද්‍යාත්මක අධ්‍යයන කලාපයන්ගේ හඳුනාගත් පුරාවිද්‍යා උරුමස්ථානවල උරුම අගයන් මැන බැලීම සඳහා පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තියේ උපමාන හා නිර්ණායකයන් අනිවාර්යයෙන්ම භාවිත කළ යුතුය. මෙම උපමාන ඇගයීම් ප්‍රතිඵල, සංවර්ධන ක්‍රියාවලියේදී සහ සංවර්ධන ක්‍රියාවලිය අවසන් වීමෙන් පසුව මෙන්ම වෙනත් මානව ක්‍රියාකාරකමක දී එහි ඇති පුරාවිද්‍යා උරුම ස්ථානවල අනාගත පැවැත්ම වෙනුවෙන් කළමනාකරණ සැලසුම් සඳහා භාවිත කිරීමට උපකාරීකර ගත යුතුය.

## දුර්ලභ බව :

කිසියම් පුරාවිද්‍යා ස්ථානයක් හෝ පුරාවස්තු ලැබීමේ හා පැවතීමේ දුර්ලභ බව මෙයින් අදහස් කෙරේ. උදාහරණ වශයෙන් වෙහෙරගලින් හමුවූ අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමාව අතිවිශිෂ්ට පුරාවිද්‍යාත්මක අගයකින් යුතු විරල පුරාවස්තුවකි. එය මෙම නිර්ණායකය අනුව අති දුර්ලභ ජාත්‍යන්තර මට්ටමේ පුරාවිද්‍යාත්මක අගයෙන් අනූන පුරාවස්තුවකි. අනෙක් අතට ඕලන්ද යුගයට අයත් ඕලන්ද කාසි ඉතා බහුලව ලැබෙන පුරාවස්තූන් ය.එය ඉතා අල්ප අගයක් ගන්නා පුරාවස්තූන් ලෙස අගය කළ හැකි ය.

## පර්යේෂණ ශක්‍යතාවය:

කිසියම් පුරාවිද්‍යාස්ථානයක් හෝ ස්මාරකයක් වර්තමාන හා අනාගත පර්යේෂණ සඳහා ඇති ශක්‍යතාවය මෙයින් අදහස් කෙරේ. උදාහරණයක් ලෙස ගිනිකොණ දිග ශ්‍රී ලංකාවේ යාල අභයභූමියට අයත් මිනිහාගල්කන්ද ප්‍රාග් ඓතිහාසික උරුමස්ථානය පර්යේෂණ ශක්‍යතාවය සම්බන්ධයෙන් ඉතා ඉහළ අගයක් ගනී. මෙය ශ්‍රී ලංකාවේ අතීත දේශගුණික රටාවන් ප්‍රතිනිර්මාණය කරගැනීමට උපයෝගී කොට ගත හැකි වැදගත් ස්ථානයකි. ඒ නිසා මෙය අති ඉහළ අගයකින් යුතු පුරාවිද්‍යාස්ථානයකි. අනෙක් අතට ඓතිහාසික යුගයට අයත් කළු, දුඹුරු මැටි බඳුන් කැබලි අල්ප පර්යේෂණ ශක්‍යතාවයකින් යුක්තය.

## සෞන්දර්යාත්මක අගය :

කිසියම් පුරාවස්තුවක, ස්මාරකයක හෝ පුරාවිද්‍යා ස්ථාන, කලාත්මක අගය හා වාස්තු විද්‍යාත්මක විශිෂ්ටත්වය තක්සේරු කිරීම මෙයින් අදහස් කෙරේ. උදාහරණයක් ලෙස සීගිරි බිතු සිතුවම් කලාත්මක හා සෞන්දර්යාත්මක අගයෙන් අනූන කෘතීන් ය. ඒවායෙහි විශිෂ්ටභාවය ජාත්‍යන්තර ඇගයීමට පාත්‍ර වී ඇත. අනෙක් අතට නුවර යුගයේ අවසාන භාගයේ සිතුවම් අඩු සෞන්දර්යාත්මක අගයකින් යුක්ත ය. එලෙසම කුරුවිට බටදොඹලෙන වැනි ඝර්ම කලාපීය ස්වාභාවික පරිසරයකින් අනූන ප්‍රාග් ඓතිහාසික ස්ථාන මෙන්ම කූරගල වැනි අතරමැදි කලාපීය ස්ථානයන්ගේ පිහිටි ප්‍රාග් ඓතිහාසික ස්ථාන සෞන්දර්යාත්මක අගය අතින් ඉතාමත් ඉහළ ය.

## යථාභූත බව:

මින් අදහස් කරන්නේ කිසියම් පුරාවිද්‍යා ස්ථානයක, ස්මාරකයක හෝ පුරාවස්තුවක මුල්ම නිර්මාණ ස්වරූපය හා ආකෘතිය ඒ අයුරින්ම ආරක්ෂා වී පැවතීමයි. බොහෝ ස්මාරක සම්බන්ධයෙන් කරන ලද මෑත කාලීන සංරක්ෂණ කටයුතු නිසා ඒවායේ මුල් ස්වරූපය වෙනස් වී ඇත. යථාභූත භාවය නිර්ණය කිරීමේ දී කිසියම් සැලැස්ම, තාක්ෂණය, පිහිටීම, භාවිතය යන උපමානයන් යොදාගත හැකිය. උදහරණයක් ලෙසින් අනුරාධපුර යුගයේ නිමවූ බිසෝ මාළිගාවට අයත් සඳකඩ පහණ දැක්විය හැකිය.

## ඓතිහාසික සබඳතාවය :

කිසියම් පුරාවිද්‍යා ස්ථානයක්, පුරා වස්තුවක් හෝ ස්මාරකයක් සම්බන්ධව බැඳී ඇති පුරාවෘත හා වංශ කථා, ඓතිහාසික තොරතුරු මෙයින් අදහස් කෙරේ. උදාහරණයක් ලෙස අනුරාධපුර ශ්‍රී මහාබෝධීන් වහන්සේ හා බැඳුණු දීර්ඝ කාලීන ඓතිහාසිකත්වයක් හා පුරාවෘත්තාන්තයක් ඇත. ඒ හා සැසඳීමේදී ග්‍රාමීය මට්ටමේ ඓතිහාසික ස්තූපයක් අඩු ඓතිහාසික සම්බන්ධතාවයක් සහිත ස්ථාන ලෙස තක්සේරු කළ හැකි ය.

## ආගමික සම්බන්ධතාවය :

මෙයින් අදහස් කරන්නේ කිසියම් පුරාවස්තුවක් හෝ ස්ථානයක් හෝ ස්මාරකයක් සමඟ සබැඳි ආගමික සම්බන්ධතාවයයි. උදහරණයක් ලෙසින් මහනුවර දළදා මාළිගාවේ තැන්පත් දන්ත ධාතූන් වහන්සේ පිළිබඳ ඉහළ ආගමික සම්බන්ධතාවයක් පවතින අතිපූජනීය වස්තුවකි.

ඒ හා සැසඳීමේදී ග්‍රාමීය මට්ටමේ අම්බලම ද අඩු ආගමික සම්බන්ධතාවයක් ඇති වන්දනීය ස්ථානයකි.

**සමාජ, ආර්ථික සංවර්ධනයට ඇති වැදගත්කම :**

කිසියම් පුරාවස්තුවක, ස්ථානයක හෝ ස්මාරකයක් වත්මන් සහ අනාගත සමාජීය හා ආර්ථික සංවර්ධනයට දක්වන දායකත්වය මෙයින් අදහස් කෙරේ. උදාහරණයක් ලෙස ලෝක උරුමස්ථානයක් ලෙස සැලකෙන ගාලු කොටුව, සුවිශේෂී ආර්ථික හා සමාජ වටිනාකමක් සහිත ස්ථානයකි. අනෙක් අතට විසිරුණු වළන් කැබිලිති සහිත පුරාවිද්‍යා ස්ථානයක් අවම සමාජ සහ ආර්ථික වටිනාමක් සහිත ස්ථානය ලෙස නිර්ණය කළ හැකිය.

ඉහත නිර්ණායක පාදක කර ගනිමින් පුරා විද්‍යාස්ථාන වල වෙන වෙනම ඒවායේ උරුම අගය තක්සේරු කළ හැකිය. ඇගයීම සිදු කිරීමේදී නිර්ණායකයක් සඳහා සංඛ්‍යාත්මක අගයක් ලබාදීමට ද හැකිය. අවසානයේදී සමස්ත, එනම් සර්වාංගවාදී උරුම ඇගයීමක් කළ හැකිය. ඉන්පසුව ඒවායේ උරුම අගය පහත සඳහන් ශ්‍රේණිවලට බෙදා දැක්විය හැකිය.

1. ඉතා අල්ප (Very low)
2. අල්ප (low)
3. මධ්‍යස්ථ (Medium)
4. ඉහළ (High)
5. ඉතා ඉහළ (Very high)

මේවා මෙලෙස තක්සේරු කරගත් උරුම වටිනාකම් අනුව එකිනෙක පුරාවිද්‍යාස්ථානයක් හෝ ස්මාරකයක් හෝ පුරාවස්තුවක් පහත සඳහන් පරිමාණ හය යටතේ ශ්‍රේණි ගත කළ හැකිය.

i. ග්‍රාම්‍ය මට්ටමින් (Village) වැදගත් පුරාවිද්‍යා ස්ථාන.
ii. ප්‍රාදේශීය මට්ටමින් (Division) වැදගත් පුරාවිද්‍යා ස්ථාන.
iii. දිස්ත්‍රික් මට්ටමින් (District) වැදගත් පුරාවිද්‍යා ස්ථාන.



iv. පළාත් මට්ටමින් (Provincial) වැදගත් පුරාවිද්‍යා ස්ථාන.
v. ජාතික මට්ටමින් (National) වැදගත් පුරාවිද්‍යා ස්ථාන.
vi. ජාත්‍යන්තර මට්ටමින් (International) වැදගත් පුරාවිද්‍යා ස්ථාන.

එමෙන්ම ඉහතින් අඳුනාගන්නා ලද උරුම ස්ථානයන් යලිත් පහත අයුරින් නැවත නිර්ණායකයන් කීපයකට වර්ගීකරණය කළ හැකිය.

I. අල්ප උරුම අගයක් ගන්නා පුරාවිද්‍යා ස්ථාන (Meagre Archaeological site) වර්ගයට ගැනෙන්නේ ඉතා අල්ප හා අල්ප උරුම අගයක් දරන (0-30 දක්වා) ස්ථානය. මෙම ස්ථාන වෙනත් ආකාරයකින් හැඳින්වුවහොත් ප්‍රමාණවත් නොවන පුරාවිද්‍යා ස්ථාන ලෙස දැක්විය හැකිය. මෙම ස්ථාන විධිමත් අධ්‍යයනයකින් හා ලේඛනගත කිරීමෙන් අනතුරුව ඉවත් කිරීම හෝ විනාශ කිරීම කළ හැකිය.

II. පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් පුරාවිද්‍යා ස්ථාන (Important Archaeological site)

මෙම කාණ්ඩයට ඇතුළත් වන්නේ උරුම ඇගයුම් අධ්‍යයනයේදී මධ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබාගත් (31-35) පුරාවිද්‍යා ස්ථානයන් ය. මේවා විනාශ කළ නොහැකි ය. එය එසේ වුවද ජාතික වශයෙන් වැදගත්, සංවර්ධන ව්‍යාපෘතිවලදී නිසි හඳුනා ගැනීමකින් හා ලේඛනගත කිරීමෙන් අනතුරුව වෙනත් ස්ථානයකට යථාභූත බව ආරක්ෂා වන පරිදි විතැන් කළ හැකිය.

III. අතිශයින් වැදගත් පුරාවිද්‍යා ස්ථාන (Extremly important heritage value site)

මෙම වර්ගයට අයත් ස්ථාන ඉතා ඉහළ උරුම අගයකින් (50-100) යුතු අතිශයින් වැදගත් පුරාවිද්‍යා ස්ථාන ලෙස හැඳින්විය හැකිය. මේවා කිසිවිටෙක ඉවත්කිරීම හෝ විතැන් කිරීම හෝ සිදු කළ නොහැකි ය.

ඉහතින් විස්තර කොට ඇති පුරාවිද්‍යා උරුම ඇගයීම් නිර්ණායක උපයෝගී කරගෙන සියලුම වර්ගයේ පුරාවිද්‍යා ස්ථානවල උරුම අගයන් වගු සටහන් මගින් ලේඛනගත කල හැකිය. මේ සියලු ස්මාරක පුරාවස්තු හෝ ස්ථාන පිළිබඳව උක්ත තොරතුරු ලබාගත යුතු අතර එහිදී විස්තරාත්මක තොරතුරු පත්‍රිකා පිරවීම්, ලේඛන ගතකිරීම්, ඡායාරූප ලබාගැනීම්, සැලසුම් ඇඳීම්, G P S තොරතුරු හා සිතියම් සැකසීම, අනිවාර්යයෙන්ම සිදුකල යුතුය.

ඒ අනුව පුරාවිද්‍යා ගවේෂණ කාර්යයන් මෙන්ම හානි ඇගයුම් ක්‍රියාවලිය සරල හෝ පහසු කටයුත්තක් නොවන බව පැහැදිලි ය. මෙරට පුරාවිද්‍යා උරුම කළමනාකරණයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නිත්‍ය උරුම කළමනාකරණ නියාමන ආයතනය වශයෙන් ඉතාම බැරෑරුම් හා වගකීම් සහගත ක්‍රියාවලියක් තුළින් සිදුකරන බව මින් ඉතාම පැහැදිලිය.

**එච්. එම්. සමන් කුමාර ඇරෑගම**
*පුරාවිද්‍යා පර්යේෂණ සහකාර (කැණීම්),*
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,*
*සීතාවක.*

## උතුරු පළාතේ පුරාවිද්‍යා ස්ථාන හඳුනා ගෙන සිතියම්ගත කිරීමේ මූලික ගවේෂණ ව්‍යාපෘතිය

දශක ගණනාවක් පුරා පැවති යුද්මය වාතාවරණයෙන් අනතුරුව උතුරු ප්‍රදේශයේ විසිර පවතින පුරාවිද්‍යාස්ථාන පිළිබඳව සිදුකරනු ලැබූ මූලික ගවේෂණ කාර්යය 2010 වසරේ සිට අඛණ්ඩව සිදුකරනු ලැබීය. අදියර 15 ක් ක්ෂේත්‍ර ගවේෂණයන් හි නිරතවී ඇති අතර මේවන විට මුලතිව් දිස්ත්‍රික්කයෙන් ස්ථාන 152 ක් ද, මන්නාරම දිස්ත්‍රික්කයෙන් ස්ථාන 62 ක් ද, කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් ස්ථාන 16 ක් ද, යාපනය දිස්ත්‍රික්කයෙන් ස්ථාන 74 ක් ද, වව්නියාව දිස්ත්‍රික්කයෙන් ස්ථාන 76 ක් ද අනාවරණය කරගනු ලැබීය. මෙම පුරාස්ථානයන්ගෙන් 80%ක් ම පැහැදිළි ලෙසම අනුරාධපුර යුගයට අයත් බෞද්ධ ආරාමික ගොඩනැගිලි බවට හඳුනාගත හැකිය. 15 වන ක්ෂේත්‍ර ගවේෂණයෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාස්ථාන 30 ක් අනාවරණය කරගත් අතර එහිදී පුතුකුඩුඉරිප්පු ප්‍රදේශයෙන් විශාල ප්‍රමාණයේ ආරාමික සංකීර්ණ කිහිපයක් අනාවරණය කරගත් අතර කුරුවිල් කෝවිල්වලින් අනාවරණය වූ ආරාමික සංකීර්ණයේ බෝධිසත්ව ප්‍රතිමාවක කොටස් දක්නට ලැබීම සුවිශේෂත්වයකි.

**එම්. වී. ජී. කල්ප අසංග**
*පුරාවිද්‍යා පර්යේෂණ සහකාර*
*ප්‍රධාන කාර්යාලය*

# ත්‍රිකුණාමලය, සේරුවිල, විල්ගම් වෙහෙර කැණීමෙන් මතු වූ අපේ යටගියාව

ත්‍රිකුණාමලය, සේරුවිල, විල්ගම් වෙහෙර නැමති ස්මාරකය 1980 වර්ෂය වනවිටත් පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස පවරා ගෙන තිබූ අතර 1984 වර්ෂයේ එවකට සිටි සේරුවිල පුරාවිද්‍යා ස්ථානභාර නිලධාරී සුනිල් දිසානායක මහතා අඟල් කැණීමක් ද සිදු කරමින් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ආරම්භ කලත් ත්‍රස්තවාදී උවදුරු නිසා එය නිෂ්ඵල වී ගියේ ය. නැවත වල්බිහිවී තිබී විශාල ගස් වැවී පස් ගොඩැල්ලක් ලෙස පැවති සමයක මහමෙවුනා අසපු භික්ෂූන් වහන්සේලා



විල්ගම් වෙහෙර සංරක්ෂණයට පෙර

විසින් මෙය සංරක්ෂණය කිරීමට උනන්දු වූහ. ඒ අනුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් සෙනරත් දිසානායක මහතාගේ නියෝගය පරිදි දැනට කැණීම් කෞතුකාගාර නියෝජ්‍ය අධ්‍යක්ෂ වන එස්. ඒ. ටී. ජී. ප්‍රියන්ත මහතාගේ උපදෙස් පරිදි අනුරාධපුර විශ්ලේෂණ දත්ත අංශය භාර කැණීම් නිලධාරී ඒ. ඒ. විජේරත්න මහතාගේ අධීක්ෂණයෙන් කැණීම් සහකාර, කැණීම් කෞතුකාගාර සැලසුම් හා පරිඝනක යන ශිල්පීන්ගෙන් සැදුම්ලත් ක්‍රියාකාරී සේවක මඬුල්ලක් මඟින් මෙම කැණීම් කටයුතු 2015. 06. 08 දින ආරම්භ විණි. විල්ගම් වෙහෙර මහමෙවුනා අසපුවෙහි වැඩ වසන ස්වාමීන් වහන්සේලා සමඟ සේරුවිල රජමහා විහාරයේ විහාරාධිපති පූජ්‍ය සරණකීර්ති හිමියන්ගේ අනුශාසනා දායකත්වයෙන් කළ මෙහෙවර ගැන විශේෂයෙන් සිහිපත් කරන අතර ශ්‍රමදාන මට්ටමින් ගත්කළ සිවිල් ආරක්ෂක සේවා මහතුන්ගේ ද නාවික හමුදා නිලධාරීන් හා දුර බැහැර මෙන්ම ප්‍රදේශවාසී බැතිමතුන්ගේ ශ්‍රම දායකත්වය ඉතාමත් බැති සිතින් අගය කළ යුතුය.

ස්මාරකය පාදා ගැනීමේ දී දක්නට ලැබුණ පූජනීය හා විශ්මිත සංස්කෘතික ලක්ෂණ දෙස බලන විට මෙය ක්‍රි. පූ. යුගයට අයත් වන බව පසක් කළ හැක. කාවන්තිස්ස නිරිඳුන් ස්ථාපිත කළ බුදුරදුන්ගේ ලලඅටධාතු තැන්පත් සේරුවිල මංගල මහා සෑරඳුන්ගේ ලක්ෂණ වශයෙන් දිසා සතරෙහි ගෘහ සහිත මල් ආසනද, ප්‍රධාන පිවිසුම් දොරටුව ඒ ලක්ෂණ ගන්නා අතර ආරුක්කු සහිත දොරටු සතර නම් තිබුණ බවක් දක්නට නොමැත. ගඩොල් ඇතිරූ සලපතල මළුව සහිත වේදිකාවක් මත ඉදිකර ඇති ස්තූපය හැඩය ගන්නා මෙම ස්මාරකය යුග දෙකක පමණ ප්‍රතිසංස්කරණ කටයුතු වලට ලක්වී ඇති බව පෙනේ. පේසා වළලු දෙකකින් සමන්විත මෙහි බොරදම් අලංකාරය සඳහා යොදාගත් හුනු බදාම යම් යම් කොටස් වල තාමත් එලෙසින්ම පවතී. නිධන් හොරුන් විසින් ගර්භය මුළුමනින්ම හාරා විනාශ කර ඇති අතර දැවැන්ත යූප ගල ද, කැඩී ගිය චක්‍ර ගලක් ද සිරිපතුල් ගල්ද සොයා ගැනීමට හැකිවූ අතර කාසි, පබළු, ලෝහමය අවශේෂ හා ලාංඡන කැටයම් හා අක්ෂර සහිත ගඩොල් කැණීමේ දී හමුවිය. දුටුගැමුණු කුමරු සමඟ ගිරිඅභය කුමරු අතර ඇති වූ අරගලයක් හේතු කොට ගෙන තම මිත්‍ර ශිව රජුගේ රාජධානිය වූ සේරුනුවරට පැමිණි ගිරි අභය රජුට විල් කෙළවරක නුවරක් තනා දී ඇත. ගිරිඅභය රජුගේ දේවිය වූ සෝමා දේවිය නමින් මෙනුවර සෝම නුවර වූ අතර තම දේවියගේ ඉල්ලීම මත භික්ෂූන් සැට දෙනෙකුන් සමඟ මහින්ද නම් තෙර තමා සතුව තිබූ බුදුන්ගේ දකුණු දළදාව නිධන් කර දාගැබක් ඉදිකරන ලදී. එය සෝමා දේවියගේ නමින් සෝමාවතී විහාරය ලෙස නම් කෙරුණු බව කියවෙයි. මෙහි පවත්වන ධාතු පෙරහැර හිරු බැස අඳුරු පැතිරීමද චන්ද්‍රෝදයද දඹුවැට පහන් දැල්වීමද සිදුවන වෙලාවෙහි තිස්මහ නුවරට පැමිණි බව (සේරුවිලට) සඳහන් වන අතර තිස්මහ නුවරත් සෝමනුවරත් නුදුරුව පිහිටා තිබූ අතර මෙම ස්තූපය සෝමාවතී ස්තූපය ලෙස සනාථ කරන කරුණු සේරුවිල තිස්ස මහා විහාර වංශයෙහි සඳහන් වී ඇත.



විල්ගම් වෙහෙර සංරක්ෂණය අතරතුර

ඉතා වියළි කාලයක කැණීම් කටයුතු ආරම්භ කළ හෙයින් ජලය යොදා පෙඟුණු පසු ඉතා දුෂ්කර ලෙස කැණීම් කටයුතු කර පාදා ගත් මෙම ස්මාරකයේ ආකර්ෂණීයභාවය වන්දනා සඳහා පැමිණෙන බැතිමතුන්ගේ පූජනීයභාවයටද පත්වී හමාරය. මෙවන් අපගේ අතීත දායාදයන් වර්තමාන පරපුර වෙනුවෙන් කැණීම්කර මතුකරලීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කළ උතුම් මෙහෙවරක් ලෙස ඉතා ආඩම්බරයෙන් සඳහන් කළ හැක.

**ඒ. ඇම්. විජේපාල (කැ. කෞ. සේ.)**
*පුරාවිද්‍යා ස්ථානය*
*දඹදෙණිය.*
*ඡායාරූප*
**අර්ජුන සමරවීර**

# අතිඋතුම් ශ්‍රී මහා බෝධියේ යටගියාව

ක්‍රි. පූ. 249 දී අනුරාධපුර රජකළ දෙවන පෑතිස් රජතුමාගේ ආරාධනයක් අනුව සංඝමිත්තා තෙරණින් වහන්සේ විසින් ශ්‍රී මහා බෝධිය දඹකොල පටුනින් මෙරටට වැඩමවන ලදී. ඒ අනුව මෙහි පැමිණි අටළොස් කුලයකට අයත් පිරිස ශ්‍රී මහා බෝධිය පිහිටුවා ඊට පුද සත්කාර සේවාවන් සපයන ලදී.

මෙම ඓතිහාසික මෙන්ම පූජනීය වස්තුවේ දියුණුව පිණිස අතීත රජවරු මහත් සේවයක් හා දායකත්වයක් දරා ඇත. දෙවන පෑතිස් රජතුමා විසින් ප්‍රකාර ප්‍රතිසංස්කරණයෙන්ද, මේඝවර්ණ රජු විසින් බෝධිඝරයේ පියස්සට උළුවහු සෙවිලි කිරීමෙන් ද, දෙවන අග්‍රබෝධි රජු බෝධිඝරය නැවත ගොඩනැංවීමක් ද වසභ රජු බුද්ධ ප්‍රතිමා සතරකින් සමන්විත බෝධි විහාරයක් කරවීය. ජෙට්ඨතිස්ස රජු පිවිසුම් දොරටු 3ක් සෑදීය. දෙවන දප්පුල රජු විහාරය ප්‍රතිසංස්කරණය කර ස්වර්ණාලේප කළේය. වර්තමානයේ දක්නට ලැබෙන ශෛලමය ප්‍රාකාරය ක්‍රි. ව. 1749 - 1781 රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ශාසනික සේවාවේ ප්‍රතිඵලයකි.

ශ්‍රී මහා බෝධිය දෝවනය කිරීම සඳහා සිරිතක් ලෙස තිසා වැවෙන් ජලය ගෙන ඇත. අනුරාධපුරය වල් බිහි වූ කාල සමයක ගම්වාසීන් විසින් බෝධිය අවට ගිනිමැල දල්වන්නට විය. ඒ වන සතුන්ගෙන් බෝධිය ආරක්ෂා කර ගැනීම පිණිසය. නිකිණි පෝය ඒ සඳහා වෙන්විනි. එම වැසියන් සෑම වර්ෂයකම නිකිණි පෝය දරම්ටි පෝය ලෙස හඳුන්වයි.

උඩ මළුව ප්‍රධාන වශයෙන් කොටස් 5කට බෙදේ. 1. වැලි මළුව, 2. විහාර මළුව 3. දේවාල මළුව 4. උඩ මළුව 5. රන් වැට මළුව වශයෙනි.

මෙහි විශාලතම මළුව හැටියට සැලකෙන්නේ වැලි මළුවයි. එහි බුදුන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා සිහිවීම පිණිස පරිවාර බෝධි 41 ක් පිහිටුවා ඇත. උඩමළුවේ 3ක් හා ඉතිරි ඒවා පහත මළුවේ පිහිටා ඇත. එසේ පිහිටුවා ඇත්තේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට බව ගැමියන්ගේ විශ්වාසයයි. ශ්‍රී මහා බෝධිය මූලික කරගෙන මංගල්‍ය කිහිපයක් පවතී. එනම් අලුත් සහල් මංගල්‍යය, පරණ අවුරුදු නානුමුර මංගල්‍යය හා කාර්තික මංගල්‍යයි. අශෝක රජු බෝධියට පැන් ඉසීම පිණිස රාජකීය කන්‍යාවන් එවනු ලැබිණි. එය ශතවර්ෂ ගණනාවක් පුරා පැවති චාරිත්‍රයකි. ක්‍රි. ව. 459-477 රජ කළ ධාතුසේන රජතුමා එම චාරිත්‍රය සිහිවීම වස් ජීවමාන කන්‍යාවන් වෙනුවට ලෝකඩ රූප 16 ක් කරවා සංකේතවත් කළේය. නියං සමයන්හිදී දැන්ද වර්ෂාව පතා ගැමියන් විසින් තිසා වැවෙන් ජලය පැන් පෙරහැරකින් ගෙනවිත් බෝධිය දෝවනය කරති.

චිරාගත සම්ප්‍රදායානුකූලව ශ්‍රී මහා බෝධිය රැකීම රාජ්‍ය නායකයාට පැවරේ. එබැවින් එහි කටයුතු යුද හමුදාවට හා උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට පවරා ඇත. උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පවසන පරිදි ලොව ඇති පැරණිතම වෘක්ෂය ලෙස අනුරාධපුර ශ්‍රී මහා බෝධිය හඳුන්වයි.

**ආර්. කේ. ඩී. තරිඳු දර්ශන**
සංචාරක හා ජනමාධ්‍ය ඩිප්ලෝමාධාරි

# ලංකාව පුරා පිහිටි ශිලා ලේඛන රැසක් පිටපත් කෙරේ

ශිලාලේඛන පුස්කොළ පොත් හා සන්නස් යන අභිලේඛන ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු අධ්‍යයනයේ දී වැදගත් වන මහඟු මූලාශ්‍ර වේ. එමෙන්ම පැරණි කාසි ද රටේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක පර්යේෂණවල දී ඉමහත් පිටුවහලක් ලබාදේ. රට පුරා විසිරී ඇති එවැනි අභිලේඛන හා කාසි පිළිබඳ දත්ත එක්රැස් කිරීමත්, ඒවා ආරක්ෂා කිරීමත්, ඒවා පිළිබඳ ජනතාව දැනුවත් කිරීම පිළිබඳව පර්යේෂණය කිරීම ආදී සියලු කටයුතු සිදු කෙරෙනුයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අභිලේඛන හා නාණක විද්‍යා අංශය මගිනි.

උක්ත කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අභිලේඛන හා නාණක විද්‍යා අංශය මගින් ව්‍යාපෘති කිහිපයක් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම එකී ව්‍යාපෘති 2016 වර්ෂයේ ද ක්‍රියාත්මක වෙමින් පවතී.


අංශය මගින් 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරනු ලැබූ එකී ව්‍යාපෘති පහත පරිදි වේ.

1. නව ශිලාලේඛන 80ක් පිටපත් කිරීමේ ව්‍යාපෘතිය
2. ශිලාලේඛන සඳහා පරිවර්තන නාම පුවරු 22ක් යෙදීමේ ව්‍යාපෘතිය
3. කාසි 950ක් සුවිගත කිරීමේ ව්‍යාපෘතිය
4. අභිලේඛන 75ක් සුවිගත කිරීමේ ව්‍යාපෘතිය
5. නව අභිලේඛන 58ක් පර්යේෂණ සංග්‍රහයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය

මේ අනුව 2015 වර්ෂයේ දී නව ශිලාලේඛන 80ට වඩා අධික ප්‍රමාණයක් පිටපත් කර ඇත. මඩකලපුව, කෑගල්ල, අම්පාර, ගම්පහ, පොළොන්නරුව, මොනරාගල, පුත්තලම, මුලතිව්, නුවරඑළිය, මාතලේ, අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වලින් ප්‍රස්තුත අලුත් ශිලා ලිපි සොයාගෙන පිටපත් කර තිබේ. මෙහි බහුතරයක් නැගෙනහිර පළාතේ අම්පාර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලට අයත් වේ. ක්‍රිස්තු පූර්ව 3 සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 12 සියවස දක්වා කාලවකවානුවට අයත් ශිලාලේඛන මේ අතර පවතී. විශේෂයෙන් මෙසේ විවිධ කාලවකවානුවලට අයත් ලිපි මගින් අක්ෂර පරිනාමය, අතීතයේ මෙරට පැවති සමාජ, ආර්ථික, දේශපාලනමය තත්ත්වය හා එදා පැවති නීතිරීති මෙන්ම කාලයෙන් කාලයට ඒවායේ ඇති වූ ප්‍රවණතා ආදී බොහෝ කරුණු අනාවරණය කර ගත හැකිය.

ශිලාලේඛන පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය යටතේ ශිලාලේඛන 22ක් සඳහා පරිවර්තන නාම පුවරු යොදා තිබේ. මහනුවර, මාතලේ, කුරුණෑගල, හම්බන්තොට, පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල, කෑගල්ල, අම්පාර ආදී වශයෙන් දිවයිනේ බොහෝ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පරිවර්තන නාම පුවරු සකසා ඇත. නාම පුවරු සැකසීමේ දී ශිලාලේඛනයේ අන්තර්ගතය පිළිබඳ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ලියා ඇති අතර ඒ තුළින් සියලු ජනකොටස් අදාළ සෙල්ලිපිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කෙරේ. එසේ ම ශිලාලේඛන සඳහා නාව පුවරු යෙදීම, එකී ශිලාලේඛනයේ ආරක්ෂාව සඳහා ද උපකාරී වන්නකි. ශිලාලේඛන සඳහා පරිවර්තන නාම පුවරු යෙදීමේ දී එකී සෙල්ලිපියේ ඓතිහාසික වැදගත්කම, අන්තර්ගතයේ ඇති වැදගත්කම, ස්ථානීය වැදගත්කම යනාදී කරුණු කෙරේ වැඩි අවධානය යොමු කර එකී සෙල්ලිපි සඳහා ප්‍රමුඛතාව ලබා දේ. නිදර්ශනයක් ලෙස 2015 වසරේ පරිවර්තන නාම පුවරු යෙදූ නිශ්ශංකමල්ල රජුගේ රුවන්වැලි සෑ පුවරු ලිපිය උක්ත සියලු කරුණු කෙරේ අවධානය යොමු කර නාම පුවරු යෙදූවකි.

ඓතිහාසික අභිලේඛන සුවිගත කිරීම යටතේ 2015 වසරේ දී අභිලේඛන 75ක් සුවිගත කර ඇත. මේ





අභිලේඛන රාශිය ගම්පහ දිස්ත්‍රික්කය දොඹවෙල ශ්‍රී සද්ධර්මගුප්ත විහාරයේ පුස්කොළ පොත් සංචිතයේ තිබී සුවිගතකර ඇති අතර ධර්ම ග්‍රන්ථ, වෛද්‍ය ග්‍රන්ථ, ඓතිහාසික විස්තර ආදිය ඒවායේ අන්තර්ගතව පවතී.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පඬුවස්නුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ කාසි 950ක් 2015 වර්ෂයේ කාසි සුවිගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ දී සුවිගත කර ඇත. මධ්‍යකාලීන කාසි හා රෝම කාසි මෙසේ සුවිගත කරන ලද කාසි අතර විය. කාසි වර්ගය, කාසිය නිෂ්පාදිත ලෝහය, කාසියේ බර, රාජ්‍ය කාලය, ඒවායේ ඇති අක්ෂර ආදී සියලු කරුණු කෙරෙහි මෙහි දී අවධානය යොමු කෙරේ.

අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය ද 2015 වර්ෂයේ ක්‍රියාත්මක විය. පත්කිරීමේ ව්‍යාපෘතිය 2015 වර්ෂයේ ක්‍රියාත්මක විය. මේ සංග්‍රහයේ අන්තර්ගත ශිලාලේඛනවලින් බහුතරයක් 2014 වර්ෂයේ දී අලුතින් පිටපත් කරන ලද ලිපි වේ. එකී ශිලාලිපි කියවා, අර්ථ නිරූපණය කර හා ඒ පිළිබඳ ශාස්ත්‍රීය වශයෙන් පර්යේෂණ කර උක්ත පර්යේෂණ සංග්‍රහයේ ලිපි සම්පාදනය කර ඇත. බොහෝ විට වංශකතා ආදී මූලාශ්‍රවලින් අනාවරණය නොවූ බොහෝ කරුණු අභිලේඛන පර්යේෂණවලින් අනාවරණය කරගත හැකිය.

මේ අතර මුල්වරට නිශ්චිතවම වෝහාරික තිස්ස (ක්‍රි.ව.2) රජුගේ බවට ශිලාලිපි කිහිපයක් මොණරාගල දිස්ත්‍රික්කයේ, ඔත්ගමුව පුරාවිද්‍යා ස්ථානයෙන් හඳුනාගනු ලැබීය.

2015 වර්ෂයේ ක්‍රියාත්මක වූ අභිලේඛන පර්යේෂණ සංග්‍රහය ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා නව ශිලාලේඛන 58ක් කියවා පර්යේෂණයට ලක්කර පිටු 150කින් යුත් ශාස්ත්‍රීය සංග්‍රහයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.



**කේ. ඒ. එස්. නාමල් කොඩිතුවක්කු**
*අධ්‍යක්ෂ*
*අභිලේඛන හා නාණක විද්‍යා*
*ධම්මිකා ප්‍රියදර්ශනී ගමගේ*
*අභිලේඛන හා නාණක විද්‍යා නිලධාරී*

# පාලම් පාරුවක සැඟවුණු කතාව


සබරගමුව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ සීතාවක නඩත්තු කලාපයට අයත් වන රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාහල්ල - 104 බී ග්‍රාම නිලධාරි වසමේ, මොරලියවත්තේ වර්තමාන රුවන්වැල්ල , නිට්ටඹුව පාර අසල පසට යට වෙමින් විනාශයට පත්වෙමින් පවතින විශාල පාලම් පාරුවක (බත්තලක) කොටස් දෙකකි.

මෙහි ඉතිහාස කථාව ඉංග්‍රීසි පාලන සමය තෙක් දිවෙයි. වැවිලි කර්මාන්තය (තේ-රබර්) ආරම්භ කළ ඉංග්‍රීසි ජාතිකයින් සිය ගමනා ගමන පහසුකම් පවත්වා ගෙන යෑම සඳහා මංමාවත් සංවර්ධනය කළාසේම ගමනාගමනයට බාධක ගෙනදුන් ගංගා, ඇළ මාර්ග ආදිය තරණය කිරීම සඳහා පාලම් පාරු සකසා එගොඩ මෙගොඩ වැවිලි කර්මාන්ත සඳහා ගමනාගමන සම්බන්ධතා වැඩිදියුණු කරගෙන ඇත. ඉහත කී පාලම් පාරුවෙ කොටස් මෙයට හොඳම නිදසුනකි. මෙය අද මොරලියවත්තේ හුදකලා කර තිබුණ ද ඉංග්‍රීසි පාලන සමයේ මිනිසුන් එහාමෙහා ගෙනයෑමටත්, බඩු, භාණ්ඩ යාන වාහන එහා මෙහා ගෙන යෑමටත් විශාල මෙහෙයක් සිදුකර ඇත.

වර්තමානයේ මෙහි හුදෙකලා කළ මෙම පෞරාණික අගයෙන් යුත් බත්තල් දෙක ඉංග්‍රීසි පාලන සමයේ තිබී ඇත්තේ වර්තමාන පල්ලෙකණුගල තොටුපල මූලික කරගෙනය. වර්තමානයේ ද මිනිසුන් එහා මෙහා ගෙන යෑම සඳහා මෙම තොටුපොළේ ඔරුවක් වේ.

මෙම පාලම් පාරුවේ බත්තල් දෙකෙහි දිග අඩි 25 කි.විශ්කම්භය ගණනය කිරීමට නොහැකිව ඇත්තේ වැඩි කොටසක් පසින් වැසී යෑම හේතුවෙනි. විශාල යකඩ බත්තල් දෙක ඇතුළත කුටීර වේ. එයට වායුව ඇතුල් කිරීම සඳහා සිදුරු දෙකකි. වායුව ප්‍රමාණවත් ලෙස ගැසීමෙන් අනතුරුව නට් සවිකර ඇත. එම සිදුරු වර්තමානයේ ද දැකිය හැකිවේ. මෙය ක්‍රියාත්මක කිරීමට ඇන්ජිමක් තිබී ඇත. ඇන්ජිමෙන් පාරුව ක්‍රියාත්මක කළ පසු එය ගෙනයෑමට තොටියන් දෙපලක් පමණ අවශ්‍යවූ බවත්, එන්ජිම ක්‍රියාවිරහිත වූ අවස්ථාවල මෙය පැදගෙන යෑම සඳහා තොටියන් 06 ක් අවශ්‍ය වූ බව ද වර්තමාන කණුගල තොටුපොළේ තොටියා වන බී. ජී. සරත් විජේදාස මහතා පැවසීය. මෙම ඇන්ජිමට කුමක් වුවා දැයි කීමට කිසිවෙක් නොදනී. කණුගල තොටුපලේ සිට එගොඩ මෙගොඩ ප්‍රවාහනය කිරීමේදී රාත්තල් 112 රබර් මිටි 40-50 අතරප්‍රමාණයක් පටවා ඇත. මිනිසුන් ප්‍රවාහනයේදී 70 ක් පමණද වෑන්, කාර්, අශ්ව කරත්ත, හාල්පිටි, සීනි, කිරිපිටි ආදිය ද මෙමගින් ප්‍රවාහනය කර ඇත.

අවිස්සාවේල්ල දුම්රිය නැවතුම් පොලේ සිට (වර්තමාන කර්මාන්තපුර පාර ඔස්සේ) ප්‍රවාහනය කරගත් බඩුබාහිරාදිය කණුගල තොටුපොලෙන් මෙගොඩට ප්‍රවාහනය කර ඇත. එසේම වර්තමාන කිරිවන්දල පිලිප් ගුණවර්ධන ක්‍රීඩාංගනය අසලින් දකුණට වැටී ඇති වතු මාර්ගය ඔස්සේ ප්‍රවාහනය කළ ද්‍රව්‍ය ද මෙම තොටුපෙලෙන් මෙගොඩට ප්‍රවාහනය කර ඇත. මෙම වතු සියල්ලම එකල පාලනය වී ඇත්තේ රුවන්වැල්ල එල්. ආර්. සී එකෙනි.








ඉංග්‍රීසි පාලන සමය අවසන් වී මෙරට රජයට මෙම ඉඩම් පවරා ගිය අවස්ථාවෙන් පසුව ඇතිවූ විශාල ගං වතුර ගැලීමකදී මෙම පාලම් පාරුව රඳවා ගැට ගසා තිබූ විශාල කුඹුක් ගස ද උදුරාගෙන වතුරේ ගසා ගෙනගොස් ඇත. අනතුරුව මෙම බත්තල් දෙක කොස්ගම සමීපයේවූ පූගොඩ තොටුපොල ආසන්නයේ රැඳී තිබී (ගොඩ ගසා තිබී) ඇත. පසුව 1970 දශකයේදී මෙම බත්තල් දෙක නැවත තොටුපොලට ගෙන ඒමට උත්සහ දැරුවද තල්දූව හරහා කණුගලට යෑමට තිබූ පාරවල් පටුවීමෙන් මාර්ග අවහිරතා ඇති වූ නිසා පහසුවෙන් මෙම බත්තල් දෙක ප්‍රවාහනය කරගෙන යා හැකි තල්දූව - රුවන්වැල්ල මාර්ගය ඔස්සේ නිට්ටඹුව පාරේ ටික දුරක් ගෙනවිත් මොරලියවත්තේ පාර උඩුපැත්තේ තබාගොස් ඇත. ඒ පිළිබඳව ලිඛිත සාධක කිසිවක් නැත. ජනප්‍රවාද ඔස්සේ ඉතිහාසයෙන් සැඟව ගිය පාලම් පාරුවේ කථාව මේ ආකාරයට අනාවරණය කර ගැනීමට හැකිවිය.

ඒ අනුව සබරගමුව පලාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පල්ලෙකණුගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ග්ලෙනෙක්ස් වත්ත හරහා රුවන්වැල්ල - කණුගල වතුයායවල් සම්බන්ධ කල කැළණි ගඟ හරහා වර්තමාන බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළවූ වතුවලට, සැපයුම් සේවා සැපයූ පාලම් පාරුවක සැඟවුණ ඉතිහාස කථාව සොයාබැලීමට මාහට අවකාශය සැපයූ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමාටත්, මාර්ග උපදේශකත්වය සැපයූ ප්‍රාදේශීය මාධ්‍යවේදී කේ. ජී. ඩබ්ලිව්. කුමාරසිංහ ගුණදාස මහතාටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

**එස්. ඒ. අමිතා විතාන**
*පුරාවිද්‍යා පර්යේෂණ සහකාර*
*සීතාවක කලාප භාරනිලධාරි*
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය*
*සීතාවක - අවිස්සාවේල්ල*

# පහන්ගලින් මතු වූ පුඬුපූලංවියේ අසිරිය


කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 81 ලස්සනගම ග්‍රාමනිලධාරී වසමට අයත් පුඬුපූලංවිය ගම මධ්‍යයේ මේ සුවිසල් පහන්ගල සහිත පුරාවිද්‍යා භූමිය පිහිටා ඇත. මෙම ස්ථානයට ගමන් කළ හැකි පහසුම මාර්ගය වන්නේ අංක 57 කුරුණෑගල - අනුරාධපුර ගමන් මාර්ගයේ ගල්ගමුව පසුකර ඉදිරියට ගමන්කළ විට හමුවන අමුණුකොලේ මංසන්ධියෙන් දකුණට ඇති මීගලෑව මාර්ගයේ කි. මී. 03ක් පමණ ද ඉන්පසු හමුවන සාලිය රාජ් පාසල් මංසන්ධියෙන් දකුණට කි. මී. 01ක් පමණ ද ගමන් කළ පසු පුඬුපූලංවිය වන අරණ දකුණින් දිස් වේ.



වයඹ පළාත තුළ පිහිටි වෙනත් පුරාවිද්‍යා ස්ථානයන්හි දක්නට නොලැබෙන දුර්ලභ ගණයේ පුරාවස්තුවක් ලෙස මෙම භූමියේ ඇති විස්මිත පහන්ගල පෙන්වා දිය හැකිය. පුරාණයේ භික්ෂූන් වහන්සේලා උදෙසා පූජාකරන ලද මෙම භූමිය ආරණ්‍ය සේනාසනයක්ව පැවතිනි. පොලෝ මට්ටමින් මීටර් එකක පමණ උසකින් පිහිටි මෙම පුරාසාධක සහිත භූමිය තුළ උසින් වැඩි ගල් පර්වත දෙකකි. එම ගල් පර්වත දෙකෙහිම පුරාසාධක දක්නට ලැබේ. එහෙත් පෙර භික්ෂූන් වහන්සේලා උදෙසා පූජා කරන ලද අරණ අද ලඳු කැලෑවක් බවට පත් වී හුදකලා වී ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මුල්වරට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තොරතුරු සොයා මෙම ස්ථානයට පියමං කරන්නේ 1986 වර්ෂයේ දීය. ඉන්පසු එහි ඇති කුඩා බෝධිඝරය ඉදිරිපස කොටස කැණීමකට ලක්කර ඇත. සිදු වූ බාධාවන් හේතුවෙන් එය අතරමග නැවතී ඇත. 1993 වර්ෂයේ දී මෙම ස්ථානය ආරක්ෂා කිරීම සඳහා දීමනා රැකවල්කරුවෙකු යොදවා ඇත. තවද 2008 ජූනි 06 දින මෙහි ආරක්ෂිත ස්මාරකයක් ලෙස අක්කර 09 ක භූමි ප්‍රමාණයක් ඇතුළත්වන සේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කර ඇත.

පුරාවස්තු බහුලව දක්නට ඇති මෙම ස්ථානයේ පැරණි ගල් කණු සහිත ගොඩැලි 02ක්, විසිරුණු ගල් කණු කිහිපයක්, සිරිපතුල් ගල් 01ක් (50cm × 50cm දිග හා පළල), ගල් කෝව, උළුවහුපාදම් ගල්, දිග 4m හා පළල 1m 20cm ප්‍රමාණයේ මල් ආසන දෙකක්, පිහිටි ගලෙහි ගල් පොකුණක්, වැසිකිළිගල් එකක්, ඉතා කුඩා වූ අලංකාර බෝධිඝරයක්, එක් ගල් පර්වතයක පිහිටි කටාරන් කෙටූ ගල්ලෙන් 03ක් වේ. මෙම ගල්ලෙන් තුනෙන් එක් ලෙනක් ඉතා විශාලය. උස 7m ක් පමණි. දිග 5m ක් හා පළල 4m වේ. මෙහි විශේෂිත ලක්ෂණයක් වන්නේ එම ලෙන තුළ පිහිටි තවත් ඉතා කුඩා ලෙනකි. එම ලෙන තුළ මැටියෙන් සකසන ලද යහනකි. එම ලෙන මැටි බිත්තිවලින් ආවරණය කර ඇත. විශාල ලෙනෙහි බිත්ති අඩි $2\,{}^{1}/_{2}$ ක් පමණ ඝනකමින් යුක්ත වේ. අධික වර්ෂාව හේතුවෙන් මෙහි බිත්ති දිය වී ගරාවැටී ඇත. මහනුවර යුගයට නෑකම් කියන මෙම ලෙනෙහි බිත්ති හා උළුවහු ඉතා ඝනකමට නිමවා ඇත. විශාල ලෙනට ඉදිරිපසින් ඇති කුඩා ලෙනෙහි බිම පිහිටි ගලෙහි නිර්මිත ගල් ඇඳන් 2කි. (1m 45cm දිග 45cm පළල සහිත වේ.) මෙම ගලෙහි පහළට බැසීමට ශෛලමය පියගැට පෙළකි. ගලෙහි සමතලා භූමියෙහි සිටගත් අයකුට ඊට යාබදව පෙනෙන ජලතලය සියඹලන්ගමුව ජලාශයයි. ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය කරගත් ජනයා තම ගොවිතැන සරුසාර කරගත්තේ සියඹලන්ගමුව ජල මූලාශ්‍රයෙනි. එදා දිය කඩිත්තක් වූ මෙය රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගමන් කරන විට සුවිසල් ජලාශයක් බවට පත්විය. එදා ගම් වැසියන් ගමන් කළ පටු මාර්ගය අද පුඬුපූලංවිය ගමට දිවෙන ප්‍රධාන මාර්ගය විය. වන අරණ මේ නිසා දෙකට බෙදී ගිය අතර සියඹලන්ගමුව ජලතලය තුළ සැඟවී ගිය පුරා වස්තු අප්‍රමාණය.



පුඬුපූලංවිය පුරාවිද්‍යා නටබුන් සහිත භූමියේ ඉතිහාසය ක්‍රි. පූ. 2වන හා පළමුවන සියවස් දක්වා දිවයයි. එකල රජකළ රජ දරුවන්ගේ අවධානය මේ කෙරෙහි ලැබී ඇත. ජන පුරාවෘත්ත අනුව දුටුගැමුණු රජ පුත් සාලිය කුමරු හා අශෝකමාලා සැඟව ගත් ස්ථානය මෙය යැයි එක් ප්‍රකට පුවතකි. එමෙන්ම වළගම්බා රජතුමා සොලීන්ට බියව පැනයන අවස්ථාවේ දී මෙම ස්ථානයේ ද සැඟව සිටිබව තවත් වෘත්තාන්තයකි.

අනුරාධපුර යුගයට අයත් පුරාසාධක බහුලව ඇති අතර මෙහි පහන්ගල පාමුල ඇති පැරණි ගොඩනැගිල්ල ක්‍රි. ව. 6, 7 සියවස්වලට අයත් බව සිතිය හැකිය. එහි ඇති පැරණි ගඩොල් එයට හොඳම සාක්ෂියකි. පහළ ගොඩනැගිලිවලට ආලෝකය සැපයීමට භාවිත කළ ඉහළ පහන්ගල මතට නැගීමට ශෛලමය පියගැට පෙළකි. එය ඉතා අලංකාරව නිමවා ඇත. දුටුවන්ගේ මන බඳින ස්වරූපයට නිමවා ඇති මෙම පුරාවස්තු විස්මිත වේ. මෙම ගල් පර්වතය දිග 30mක් පමණ වේ. පළල 25m ක් පමණ වේ. ගල වටේට පහන්වලවල් නිර්මාණය කර ඇත. ගල වටේ කාණුවක් වැනි ගල් පීල්ලක් කොටා ඇත. එය මත ඇවිද යමින් වටේට ඇති පහන් පත්තු කළ හැකිය. මෙම පහන් වලවල් ගණන 50ක් පමණ වේ. ස්වාභාවික විපත්වලට මුහුණ පා ඇති ගලෙහි ගල් පතුරු ගැලවෙන ස්වභාවයක් ඇත. පහන් වලවල්වලට හානි සිදුව ඇත. මෙම පහන්ගල නැරඹීම සඳහා නන්දෙසින් ජනයා ඇදී එයි. 15cm දිග 10cm පළල 4cm ගැඹුර වූ ගලවටා අලංකාරව නිර්මිත මෙම විස්මය අපේ අතීත උරුමයයි.

**ඒ. එම්. ආර්. සමන්කුමාරි**
*වැඩබිම් කළමනාකාරි / ස්ථානභාර නිලධාරී*
*හත්තිකුච්චි පුරාවිද්‍යා ස්ථානය*
*පඬුවස්නුවර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය*

# පැරණි සිතුවම් කලාවේ අගනා නිමැවුමක් වූ ගොනාගොල්ල

අතීත මානවයා පිළිබඳව වැදගත් මාහැඟි පුරාවිද්‍යාත්මක උරුමයක් ලාංකීය ජනයා සතුව පවතී.

මෙරට පැරණි සිතුවම් කලාව ද මේ අතරට ගැනෙන අතර එය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්ධනය වූ සිතුවම් කලාවකි. මේ පිළිබඳ විවිධ කලා විචාරකයන්, පුරාවිද්‍යාඥයින් ඇතුළු විද්වතුන්ගේ අවධානය යොමුව පර්යේෂණ රැසක්ද සිදුකර ඇත.

අම්පාර දිස්ත්‍රික්කයේ ගොනාගොල්ල මාර්ගයේ කොත්මලේ ජනපදය ආශ්‍රිතව පිහිටි ගොනාගොල්ල පුරාවිද්‍යා ස්ථානය එහිවන සිතුවමක් නිසාවෙන් මෙසේ විද්වතුන්ගේ අවධානයට ලක්වූවකි. "පුංචි සීගිරිය" යන අන්වර්ත නාමයෙන් මෙම ස්ථානය හඳුන්වන්නේ ද මෙකී සිතුවම නිසාවෙනි.

මෙම භූමියේ ලෙන් තුනක් දක්නට ලැබේ. මෙයින් තරමක් විශාල ලෙනෙහි පිටත මෙය සිතුවම් කර ඇත. මෙය 1956 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ එවකට වැඩ බලන පුරාවිද්‍යා කොමසාරිස් ලෙස කටයුතු කළ පී. ඊ. පී. දැරණියගල මහත්මා විසින් පරීක්ෂාකර වාර්තා කරන ලදී. එහි දී ඔහු විසින් මෙය මැනවින් සිතුවම් කර 1956 පාලන වාර්තාවට ඇතුළත් කර ඇත (රේඛා සටහන්).

මෙහි ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ පුරුෂ සහ ස්ත්‍රී රූපයකි. ස්ත්‍රී රූපය රැඟුමක යෙදෙන විලාසයක් නිරූපණය කරන අතර ඇය පුරුෂයා ඉදිරියෙන් ඔහුට වඳින ආකාරයක් දැක්වේ. සුදු වර්ණයෙන් යුතු පසුබිමක ඇති මෙම සිතුවමෙහි හිසවටා ඇති රශ්මි මාලාවක් සහිත පුරුෂ රූපයේ දකුණතෙහි මලක් දක්නට ලැබේ. රූපවල රතු, ලා කහ සහ කොළ වර්ණ ඇත. ආචාර්ය පී. ඊ. පී. දැරණියගල ප්‍රකාශ කර ඇති ආකාරයට මෙය මෙරට සතු පැරණි රූප චිත්‍ර කලා කෘතීන් අතරට එක් වූ අගනා වස්තුවකි.

ආදි කාලයේ පටන් වැසි රහිත සමයන්හි වර්ෂාව ප්‍රාර්ථනය කරමින් පර්ජන්‍ය දෙවියන් වන්දනය පැවතුණු හෙයින් මෙම සිතුවමින් ද නිරූපණය කරන්නේ පර්ජන්‍ය දෙවියන් වන්දනයෙහි යෙදීමේ රංගනයක් බව මහාචාර්ය සෙනරත් පරණවිතානගේ අදහසයි. ආචාර්ය චාල්ස් ගොඩකුඹුරේ මහත්මා ද මේ සිතුවම් පිළිබඳව සිය අවධානය යොමුකර ඇත. (1965 - 66 පාලන වාර්තා)

මේ පිළිබඳ වැඩිදුරටත් අධ්‍යයනයක යෙදෙන මහාචාර්ය සේනක බණ්ඩාරනායක අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කර ඇති ක්‍රි. ව. 5 - 7 සියවස්වලට අයත් හුණුගලින් නිම වූ කාන්තා රූප දෙක සීගිරි ගොනාගොල්ල සහ වෙස්සගිරියේ කාන්තා දේවතා රූප (Femail Deities) සමාන බව පවසයි. එසේම ගොනාගොල්ල සිතුවම්වල ශෛලියට හා කාලයට ද මේවා සමාන බව ද එතුමා වැඩි දුරටත් සඳහන් කර ඇත.

ආචාර්ය රාජා ද සිල්වා විග්‍රහ කර ඇති ආකාරයට මෙම සිතුවම්වල තලය හුණු පදනම් කරගත් තුනී තට්ටු දෙකකින් යුක්තය. ඉන් පළමු පිරියම ඝනකම අතින් 2.0 මී. මී. පමණ වන අතර ශාඛ මැලියම් වර්ගයක් හා වියළන තෙල් වර්ගයක් හා මිශ්‍ර කෙරුණු හුණු, වැලි හා මැටි ස්වල්පයක් යන මේවායින් සමන්විත වේ. දෙවැනි හුණු සංයෝගය අතින් පළමු වැන්නට වඩා පිරිසිදුය. මෙය වැලි ස්වල්පයකින් සමන්විතය. එය සායම් උරා ගන්නා පරිදි මටසිලුටු ලෙස කපරාරු කොට ඇත. මේ සිතුවම් අයත් වනුයේ සීගිරි යුගයට (ක්‍රි. ව. 5) පසු හා පොළොන්නරු යුගයට පෙර අවධියකට යැයි පරණවිතාන ශූරීන් අදහස් කළ ද පර්වතය මත වූ සෙල්ලිපිවලට අනුව මෙම සිතුවම් ක්‍රි. ව. 3 වන සියවසේ පමණ නිමවන ලදැයි අනුමාන කළ හැකි බව The Story of inhalese Painting Ceylon නම් ග්‍රන්ථයේ ඩී. බී. ධනපාල මහතා සඳහන් කර ඇත. එසේම මෙහි සංරක්ෂණ කටයුතු කිහිප අවස්ථාවකදී ම සිදුකළ බව ද ආචාර්ය රාජා ද සිල්වා වැඩි දුරටත් පෙන්වා දී ඇත.

පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත්වන ගොනාගොල්ලේ පිහිටි සාධක අතර අභිලේඛන පිළිබඳව ද විශේෂයෙන් සඳහන් කිරීම වටී. මෙහි ශිලාලිපි පහක් හඳුනාගෙන ඇත. ඒවා සියල්ල ගිරිලිපිය. ක්‍රිස්තු වර්ෂ 4 සහ 5 සියවස්වලට අයත් ලෙස සලකන මෙම ලිපි කොටා ඇති පර්වතයේ පියගැට පෙළක් ද දක්නට ලැබේ. මෙහි ඉහළට වන්නට කිසියම් ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ බවට සාධක හඳුනාගත හැකිය.

එක් ලිපියක (ලි. ප. අංක 2330) ගොටි ග්‍රාමයෙන් විහාරයට වී පෑල් එකොළහක් දෙන ලද බව හා එහි පින සියලු සත්වයින්ට අත්වේවා යන්න සඳහන් වේ.

දිගාමඩුලු විහාරයෙහි යැපීම සඳහා දෙන ලද දීමනාවක් හා වැවක් කරවීමක් පිළිබඳව ද එහි පින සියලු සත්වයින්ට අත්වන්නට යැයි මෙහි තවත් ලිපියක සඳහන් වේ. (ලි. ප. අංක 2329)

තවත් ලිපියකින් කියැවෙන්නේ රටික මහින්ද ගේ හා රටික බරතගේ දියණිය වූ නාගා නැමැති කාන්තාව විසින් දෙන ලද දීමනාවක් පිළිබඳවය. (ලි. ප. අංක 2326)

අභය විසින් අබ අළිතක මහා විහාරයට අරියවංස වෘත්තියට දෙන ලදී. යනුවෙන් (ලි. ප. අංක 2327) තවත් ලිපියක සඳහන් වේ.

අවසන් ලිපියෙන් ප්‍රකාශ වන්නේ (ලි. ප. අංක 2328) අළිකත මහා විහාරයේ අරියවංස වෘත්තිය සඳහා කහවණු තුන්සීයක් දුන් බවය. මේවායින් ප්‍රකාශ වන්නේ මේ ස්ථානය එසමයෙහි ආගමික අතින් වැදගත් ස්ථානයක් වූ බවයි.

පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමියන්ගේ අභිලේඛන පර්යේෂණ සංග්‍රහය - 2015 ලිපියෙන් කරුණු උපුටා ගැනුණි.

මෙම පුරාවිද්‍යාත්මක පරිශ්‍රයේ කටාරම් කොටන ලද ලෙන් අතර ප්‍රධාන සිතුවම දක්නට ලැබෙන්නේ නැගෙනහිර අන්තයේ ඇති ලෙනේය. ඊට අමතරව මීට ආසන්න තවත් ලෙනක ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් ද දක්නට ලැබේ. මෙය මෙම පොකුණු හා සම්බන්ද වූ කිසියම් ගොඩනැගිල්ලක සාධක වීමට ඉඩ ඇත.

ප්‍රධාන සිතුවම් ඇති ලෙනට ඉදිරිපසින් දක්නට ලැබෙන්නේ නෂ්ටාවශේෂ වූ දාගැබකි. මෙහි නිරිත දිශාවට වන්නට ගල්කණු සහ කිසියම් ඉදි කිරීමක සාධක හඳුනාගත හැකිය. එමපණක් ද නොව නැගෙනහිර දෙසින් පොකුණු යැයි සැලකිය හැකි ස්ථාන දෙකක් ද ඒ ආසන්නයේ පිහිටි ගල් තලාවක පාදම් ගල් 11ක් දක්නට ලැබේ.

ගොනාගොල්ල හෙවත් පුංචි සීගිරිය ලෙස හඳුන්වන මෙහි ස්තූපය කැණීම පසුගිය දා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් කාර්යාලය මගින් ආරම්භ කරන ලද්දේ විහාරාධිපති හිමියන් විසින් දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීමක් අනුවය.

ඒ අනුව මෙහි මළුව හැර ස්තූපය පමණක් කැණීමේ කටයුතු ආරම්භ කළ අතර එහි කටයුතු දැනටමත් සිදු වෙමින් පවතී.

මෙහි මූලික ව්‍යුහය හඳුනාගැනීම සඳහා උතුරු දකුණ හා නැගෙනහිර බටහිර දිශානුගතව අගල් කැණීම් සිදු කෙරිණි. මෙහි දී ශිලා පාදම, ගර්භය හා පේසාව හඳුනාගැනීමට හැකිවිය.

**රසායන සංරක්ෂණය**

පුංචි සීගිරියේ ඇති මේ අගනා සිතුවම සංරක්ෂණය සඳහා මෙම ස්ථානය හඳුනාගත් සමයේ සිටම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කළ බවට පුරාවිද්‍යා පාලන වාර්තා සාක්ෂි දරයි.

මෑත යුගයේ ද මෙම සිතුවම් ආරක්ෂා කර ගැනීමට දෙපාර්තමේන්තුවේ රසායන සංරක්ෂණ අංශය ක්‍රියා කර ඇත. ආසන්නම මැදිහත් වීම ලෙස 2016 වර්ෂයේ මැයි මස අග දී මෙහි නිලධාරින් ප්‍රධාන සිතුවම ඇති ස්ථානය ඉහළ ඇති ආවරණ කොටසින් සිතුවම තුළට ජලය ගලා ඒම වලක්වාලීම සඳහා ජල රෝධක ද්‍රව්‍ය යෙදීම පෙන්වා දිය හැකිය. එපමණක් ද නොව දිනපතා මෙහි තත්ත්වය පරීක්ෂා කොට අවශ්‍ය පිළියම් යෙදීමට රසායන සංරක්ෂණ සහායකයින් දෙදෙනෙකු ද යොදවා ඇත.





**වාසනා සිරිමල්වත්ත**
*ප්‍රකාශන නිලධාරිනී*
*පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව*

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘති


**ප්‍රෞඪ දේශයක් සහ අභිමානවත් ජාතියක් බිහි කිරීමට පුරෝගාමී වූ අපගේ අතීත උරුමයන් අදටත් හෙටටත් මතුවටත් සුරක්ෂිත කර ඉදිරි අනාගත පරපුර වෙනුවෙන් දායාද කිරීමට පුරෝගාමී වූ ආයතනයක් වන හා මෙරට පුරාවිද්‍යාත්මක උරුමයන්හි නෛතික බලය හිමි පුරෝගාමී ආයතනය වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ජාතික උරුමයන් රැකගැනීමේ අදිටනින් 2015 වර්ෂයේදී ද සුවිශේෂී ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නංවන ලදී. වෙනත් වර්ෂවලදී මෙන්ම 2015 වර්ෂයේ ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මහා පරිමාණ/මධ්‍ය පරිමාණ සහ සුළු පරිමාණ ව්‍යාපෘති 600 කට අධික ප්‍රමාණයක් ක්‍රියාවට නංවන ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරමින් පවතින මහා පරිමාණ සංරක්ෂණ ව්‍යාපෘතිවලින් කිහිපයක තොරතුරු පහත දැක්වේ.**

1. **නීලගිරිසෑය සංරක්ෂණ ව්‍යාපාතිය.**
2. **යුධගනාව දාගැබ සංරක්ෂණ ව්‍යාපාතිය.**
3. **තිවංක පිළිමගෙය සංරක්ෂණ ව්‍යාපාතිය.**
4. **මඩුවන්වෙල වලව්ව සංරක්ෂණ ව්‍යාපාතිය.**
5. **රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපාතිය.**
6. **අනුරාධපුර නව සංචාරක බංගලාව.**
7. **යාපනය කොටුව සංරක්ෂණ ව්‍යාපෘතිය**
8. **රිටිගල පුරාවිද්‍යා සංරක්ෂණ ව්‍යාපෘතිය**
9. **මාතර නූපේ පැරණි වෙළඳසැළ සංරක්ෂණ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘති සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් 2015 වර්ෂයට මූලධන වියදම් ලෙස රු. මිලියන 83 ක් ද පුනරාවර්තන වියදම් ලෙස රු. මිලියන 850.5 ක් ද, 2016 සඳහා මූලධන වියදම් ලෙස රු. මිලියන 162.5 ක් ද පුනරාවර්තන වියදම් ලෙස රු. මිලියන 860.65 ක් ද ලබා දී ඇති අතර මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ රු. මිලියන 200ක් පමණ ලබා ගැනීමට සැළසුම් කර ඇති අතර ඉන් 30% පමණ දැනටමත් ලැබී ඇත.

### නීලගිරි සෑය සංරක්ෂණ ව්‍යාපාතිය

නීලගිරිය දාගැබ සංරක්ෂණ කටයුතු සඳහා 2015 වර්ෂයට රු.මි. 8.00 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබා දී ඇත. මේ වන විට දාගැබ සංරක්ෂණයට අදාළ කැණීම් කටයුතු අවසන් කර ඇති අතර, ඊට අදාළ සංරක්ෂණ කටයුතු ද මේ වනවිට ආරම්භ කර ඇත. පේසාවේ 2/3 ක් පමණ සංරක්ෂණය අවසන් කර ඇති අතර, එහි කළුගලින් කළ කොටස සහ ගර්භය සංරක්ෂණය කිරීමේ කටයුතු මෙම වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.



දාගැබ සංරක්ෂණයට පෙර





දාගැබ සංරක්ෂණය අතරතුර

### යුධගනාව දාගැබ සංරක්ෂණ ව්‍යාපාතිය

දාගැබ සංරක්ෂණය සඳහා 2015 වර්ෂයේ රු.මි. 4.0 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති අතර මේ වනවිට පහළ ගර්භයේ සංරක්ෂණ කටයුතු අවසන් කර ඇත. උඩ දාගැබේ වළවල් සහිත කොටස් තහවුරු කිරීම හා දාගැබේ හැඩය ආරක්ෂා වන පරිදි සංරක්ෂණය කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.





දාගැබ සංරක්ෂණයට පෙර



දාගැබ සංරක්ෂණය අතරතුර

## මඩුවන්වෙල වලව්ව සංරක්‍ෂණය

වලව් ගොඩනැගිල්ලේ සංරක්ෂණ කටයුතු සඳහා 2015 වර්ෂයේ දී රු. මිලියන 2.0 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර මේ වනවිට ගොඩනැගිල්ලේ සංරක්ෂණ කටයුතු සම්පූර්ණයෙන් ම නිම කර ඇත.



වලව්වේ ඇතුළත හා පිටත බිත්ති සහ දොර ජනෙල් සංරක්ෂණය

## රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංවර්ධනය

පුරාවිද්‍යා ස්මාරක හා නටබුන් එකම ස්ථානයක විශාල වශයෙන් විසිරී ඇති නැගෙනහිර පළාතේ පිහිටි ඓතිහාසික පුරාවිද්‍යා භූමියක් ලෙස රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානයට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ සිදුකරන ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස 2012 වසරේ සිට ක්‍රියාත්මක වන අතර, එදා සිට මේ දක්වා ගවේෂණ මගින් ස්මාරක 750 ක් පමණ සොයාගෙන ඇති අතර, කැණීම් මගින් ස්මාරක 15 ක් පමණ පාදාගෙන ඇත. ඒ අතරින් ස්මාරක 08 ක පමණ සංරක්‍ෂණ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන්කර ඇති අතර, අනෙකුත් ස්මාරක සංරක්‍ෂණය කරමින් පවතී. මීට අමතරව ස්ථානය නැරඹීමට පැමිණෙන මහජනයාට තොරතුරු සැපයීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ද, නිලධාරීන්ගේ නේවාසික පහසුව සඳහා නේවාසිකාගාරයක් ද, කාර්යාල පහසුකම්, ගබඩා පහසුකම්, ආරක්ෂක කුටි ඇතුළු යටිතල පහසුකම් ද  සපයා ඇත.





සංරක්ෂණය කරන ලද ආසනඝරය



සංරක්ෂණය කරන ලද පඩිපෙල

## නවාගල, උණගලාවෙහෙර සහ හම්බේගමුව දාගැබ් සංරක්‍ෂණය



මීට අමතරව උතුරුමැද පළාතේ අනුරාධපුර නවාගල දාගැබ සහ ඌව පළාතේ හම්බේගමුව දාගැබ සංරක්‍ෂණ කටයුතු මේවනවිට සාර්ථකව සිදුකරනු ලබන අතර, පොළොන්නරුවේ උණගලා වෙහෙර දාගැබ සංරක්‍ෂණ කටයුතු ද අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම මත "පිබිදෙමු පොළොන්නරුව" සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මකවේ. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ලබාදේ.



## තිවංක පිළිමගෙය සංරක්‍ෂණ ව්‍යාපෘතිය

තිවංක පිළිමගෙය සංරක්‍ෂණ කටයුතු සඳහා 2015 වර්ෂයට රු. මිලියන 6.0 ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති අතර, මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස පිළිම ගෙය සඳහා ආවරණ වහල සකස් කිරීම මේ වන විට අවසන් කර ඇත.

# අවුකන හා මාළිගාවිල පිළිම සඳහා ආවරණ වහල යෙදීම

ලංකාවේ විශාලතම හා ඓතිහාසික වැදගත් කමකින් යුතු අවුකන හා මාළිගාවිල පිළිම දෙක සඳහා ආවරණ වහල යෙදීම ද සාර්ථකව සිදු කරන ලදි.

ක්‍රි. පූ. 05 වන සියවසේ මැද භාගයේදී ධාතුසේන මහ රජතුමා විසින් ඉදි කරන ලදැයි සැලකෙන දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් හා කලාත්මක ලක්ෂණ වලින් හෙබි දෙස් විදෙස් සංචාරකයින්ගේ නොමඳ ගෞරවයට පාත්‍රව ඇති අවුකන පිළිම වහන්සේ උදෙසා මෙන්ම,

මේ හා සමානව වැදගත් කමකින් යුත් නිදහස් ඉරියව්වෙන් යුතු ලංකාවේ තවත් විශාලතම හිටි බුද්ධ පිළිම වහන්සේ නමක් වන මාළගාවිල පිළිමය 07 වන සියවසේ අග්‍රබෝධි මහරජතුමා විසින් ඉදි කරන ලදැයි සැලකේ. වසර 400 ට පෙර කැබලිවලට කැඩී ගොස් තිබී ඇති අතර, මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් 1951 දී සොයා ගන්නා ලදි. වර්ෂ 1991 දී මහත් පරිශ්‍රමයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මෙම පිළිම වහන්සේ නැවත ඔසවා තබන ලදි.

මෙම පිළිම වහන්සේලා දෙනම සඳහා අතීතයේදී ආවරණ වහල තිබූ බවට සාධක ඇති අතර, ආවරණයක් නොමැති වීමෙන් සුළු ඉරි තැලීම්, ඇල්ගී හා පාසි පැතිර යාමේ අවධානමක් ද පැවතුනි.

මීට අමතරව උතුරුමැද පළාතේ අනුරාධපුර නවාගල දාගැබ සහ ඌව පළාතේ හම්බේගමුව දාගැබ සංරක්ෂණ කටයුතු මේ වන විට සාර්ථකව සිදු කරනු ලබන අතර, පොලොන්නරුවේ උණගලා වෙහෙර දාගැබ සංරක්ෂණ කටයුතු ද අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම මත "පිබිදෙමු පොලොන්නරුව" සංවර්ධන වැඩ සටහන යටතේ ක්‍රියාත්මක වේ. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ලබා දේ.

### මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

පළාත් මට්ටමින් පුරාවිද්‍යා ස්ථාන රැසකම මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ සංරක්ෂණ කටයුතු ආරම්භකර ඇත.

### මිහින්තලේ මහ සෑ මළුව සංරක්ෂණය



මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ මිහින්තලේ මහ සෑ මළුව සංරක්ෂණ කටයුතු සාර්ථකව සිදුකරනු ලබන අතර, මේ සඳහා යුධ හමුදා සහාය ලබාගෙන ඇත.

මීට අමතරව පහත සඳහන් ව්‍යාපෘතිද මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මකවේ.

බුදුරුවගල ශෛලමය පිළිමගෙය, කෝට්ටේ කොටුබැම්ම, කොටහේන දීපදුත්තාරාමයේ පැරණි ආවාසගෙය, අත්තනගල්ල රජමහා විහාරය, වලල්ගොඩ ටැම්පිට විහාරය සංරක්ෂණය, බලවින්න පුරාණ ගංගාරාම විහාරය සංරක්ෂණය, මාම්පිටිය විහාරයේ ආවාසගෙය සංරක්ෂණය, සපුගස්කන්ද විහාරයේ පැරණි විහාරගෙය සංරක්ෂණය, කොටවාය රජමහා විහාරයේ ධර්ම ශාලාව සංරක්ෂණය, හියාරේ අශ්වාරාම විහාරයේ ධර්මශාලාව සංරක්ෂණය, වලස්මුල්ල අතුබෝදේ පුරාණ විහාරයේ විහාරගෙය සංරක්ෂණය, තෙල්වත්ත රන්පත් විහාරයේ ආවාසගෙය සංරක්ෂණය, මෝරගම්මන ආවාසගෙය සංරක්ෂණය, වට්ටාරම චෛත්‍ය සංරක්ෂණය, මීගමුව වෙඩි බෙහෙත් ගබඩාව සංරක්ෂණය, බොල්තුඹේ සමන්දේවාලය සංරක්ෂණය, ශිලා පොක්බරණී පුරාණ විහාරය සංරක්ෂණය, පරමධම්ම පිරිවෙන ශිෂ්‍ය නේවාසිකාගාරය අලුතෙන් සැකසීම, ගොමදියගාල පුරාණ විහාරය සංරක්ෂණය, කටුබලන්ද පුරාණ විහාරයේ වහල සංරක්ෂණය, ඉංගිරිය දීපාලෝක විහාරය සංරක්ෂණය, නාලන්දාගෙඩිගේ සංරක්ෂණය, යාපනය සක්කෝට්ටේ ඕලන්ද පල්ලිය සංරක්ෂණය, දඹුල්ල රජමහා විහාරය සංරක්ෂණය, මඩහපොළ ටැම්පිට විහාරයේ බිතු සිතුවම් හා මූර්ති සංරක්ෂණය, පිළිකුත්තුව රජමහා විහාරයේ ලෙන් සිතුවම් සංරක්ෂණය, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ශෛලමය පුරාවස්තු සංරක්ෂණය, හැබැස්ස පිළිම සංරක්ෂණය, දාබරේ නිවස අලුත්වැඩියා කිරීම, හොරවඩුන්න ශ්‍රී සුදර්ශන ශෛලබිම්බාරාම විහාරය පිළිමගෙය සංරක්ෂණය, පඬුවස්නුවර පුරාවිද්‍යා භූමියට වැටක් ඉදිකිරීම, යාපනය ශාන්ත ජේම්ස් දේවස්ථානයේ ප්‍රාකාර බැම්ම ප්‍රතිසංස්කරණය, වීදණ්ඩාවල විහාරයේ සංඝාවාසය සංරක්ෂණය, වෙලේකඩේ පැරණි වෙළඳපළ නඩත්තුව හා භූ දර්ශනය සකස් කිරීම

### පනාවිටිය දැව අම්බලමේ සංරක්ෂණය

වයඹ පළාතේ පිහිටි ඉතා දුර්ලභ ලී කැටයම් සහිත පනාවිටිය දැව අම්බලමේ සංරක්ෂණ කටයුතු මේ වන විට සාර්ථකව සිදු කෙරේ.



යාපනය කොටුව සංරක්ෂණ කටයුතු



**පී.කේ. සුජීවා ප්‍රියංගනී**
සංවර්ධන සම්බන්ධීකරණ නිලධාරී
ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් අංශය

# 2015 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද මෙහෙවර

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන අතුරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. ඒ මේ රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සුවිශේෂී මෙහෙවර නිසාමය. භූමි ප්‍රමාණයෙන් කුඩා වූ දිවයිනක පිහිටා ඇති ලක්ෂ සංඛ්‍යාත පුරාවස්තු අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කරදීම එම මෙහෙවරේ එක් පැතිකඩකි. ප්‍රෞඪ ඉතිහාසයක සාඩම්බර හිමිකරුවන් බවට පත් වන්නට ශ්‍රී ලංකාවාසීන්ට නිරායාසයෙන් අත්වැල් සපයන, පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කරමින් එය සුරක්ෂිත කිරීමේ අධිකාරී බලය සතු ප්‍රධානතම ආයතනය වනුයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවයි.**

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව උරුම කළමනාකරණය වඩාත් සක්‍රිය මට්ටමකට ගෙන ඒම වෙනුවෙන් සිය ආයතනික ව්‍යුහය විවිධ දිශානතීන් ඔස්සේ ස්ථාපිත කර ඇත. ගවේෂණ, කැණීම්, වාස්තු විද්‍යා, රසායන සංරක්ෂණ, ප්‍රකාශන ආදී ලෙස ශාස්ත්‍රීය සේවාවන් ආයතනය තුළ ස්ථාපිත කරමින් මහජනතාව වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටුකරයි.**

**2015 වර්ෂයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවූ සුවිශාල ව්‍යාපෘති ප්‍රමාණය 600 ඉක්මවයි. යථෝක්ත දැවැන්ත ව්‍යාපෘති අතුරින් කිහිපයක් පමණක් පළාත් මට්ටමින් මෙලෙස පෙළ ගස්වමු.**

## බස්නාහිර පළාත

බස්නාහිර පළාතට අයත් කොළඹ, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්ක තුළ ප්‍රාග් ඓතිහාසික යුගවල සිට සියළු ඓතිහාසික යුගවලට අයත් පුරාවිද්‍යාත්මක ස්ථාන රාශියක් පිහිටා තිබීම සුවිශේෂී කරුණකි. පූර්ව ඓතිහාසික සියවස්වලට අයත් ලෙන් විහාර, සුසාන භූමි, ජනාවාස, ඓතිහාසික යුගවල ආගමික ගොඩනැගිලි මෙන්ම යටත් විජිත සමයේ බලකොටු, රෝහල්, ඇල මාර්ග වැනි වාස්තු විද්‍යාත්මක හා තාක්ෂණික අතින් ඉතාමත් වැදගත් ස්ථාන රාශියක උරුමය කළමනාකරණය කිරීමේ වගකීම අප සතුව ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මගින් මෙහෙයවනු ලබන ගවේෂණ, කැණීම්, වාස්තු විද්‍යා, සංරක්ෂණ, රසායන සංරක්ෂණ, නඩත්තු, කෞතුකාගාර හා ප්‍රවර්ධන යන සියලුම අංශ නියෝජනය වන පරිදි කලාප 06ක් ඇතුළත ව්‍යාපෘති රාශියක් 2015 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත.

2015 වසර සඳහා මූල්‍යමය ප්‍රතිපාදන හිඟවීම හේතුවෙන් ගවේෂණ සිදු නොවිය. එහෙත් ඛනිජ නිස්සාරණ කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම ඇතුළු දෛනික ස්ථාන පරීක්ෂා කිරීම විශාල ප්‍රමාණයන් සිදු කරන ලදී. එසේම අඛණ්ඩව සිදු කරන චංචල පුරාවස්තු ලේඛණගත කිරීමේ ව්‍යාපෘතිය තවදුරටත් සිදුකරමින් කොළඹ කොටුවේ ඕලන්ද කෞතුකාගාරයේ චංචල පුරාවස්තු ලේඛණගත කිරීමේ ප්‍රථම අදියර ලෙස එහි ඇති ඕලන්ද ගෘහ භාණ්ඩ මැදිරි හා පහත පැරණි සොහොන් ගල් මැදිරිවල ඇති පුරාවස්තු ලේඛණගත කොට අවසන් කර ඇත. තවද 2015 වර්ෂයේ බෝවන රෝග විද්‍යායතනයෙහි (IDH) ඉල්ලීම පරිදි එහි ඇති පැරණි ස්මාරක වර්තාගත කොට පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

2016 වර්ෂයේ දී ඉහත ඕලන්ද කෞතුකාගාරයෙහි චංචල පුරාවස්තු ලේඛණගත කිරීමේ ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත අතර කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ගවේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීමට නියමිතය. එසේම කැළණි ගඟ පහළ නිම්න ප්‍රදේශයේ දකුණු ඉවුර ආශ්‍රිත ගවේෂණ ව්‍යාපෘතියක් දියත් කිරීම ද දෛනික ස්ථාන පරීක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ද සිදු කෙරේ.

මෙම වසරෙහි කොළඹ කොටුව ජනාධිපති මන්දිරය මහජන ප්‍රදර්ශනයට විවෘත කිරීම සඳහා අවශ්‍ය අත්පත්‍රිකාවක් මුද්‍රණය කිරීම හා පොතක් මුද්‍රණය කිරීමට අවශ්‍ය සවිස්තරාත්මක වාර්තාකරණයක් සිදු කරන ලදී.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ කෝට්ටේ මහ නගර සභාව එක්ව කෝට්ටේ පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා අත්සන් කළ ද්විපාර්ශ්වීය ගිවිසුමට අනුව 2014 වර්ෂයේ ආරම්භ කළ උමඟ කැණීම II වන අදියර 2015 වර්ෂයේ දී සිදුකරන ලදී. එහි වන III අදියර 2016 වසරේ මේ වන විටත් සිදුකරමින් පවතී. උක්ත කැණීමෙන් ප්‍රධාන ප්‍රවේශය උතුරු දිශාවට යොදා පිහිටි කබොක කපා සකස් කළ කුටියක්, පේසා තුනකින් සමන්විත පිහිටි කබොක කපා සකස් කළ චෛත්‍යයක් හා පියගැට දාහතරකින් හා සඳකඩ පහනකින් සමන්විත සෝපානයක් මතුකර ගැනීමට හැකි විය.



බොලොස්සගම විහාරය

මීට අමතරව නිරවුල් සහතික නිකුත් කිරීම සඳහා හදිසි පරීක්ෂණ කැණීම් ව්‍යාපෘති 5ක් සිදුකර නිරවුල් සහතික ලබා දී ඇත. (පුරාවිද්‍යා වටිනාකමින් යුතු ප්‍රදේශ ආශ්‍රිතව යම්කිසි සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් කැණීමක් සිදුකරන අවස්ථාවලදී මේ ආකාරයෙන් නිරවුල් සහතික ලබාගත යුතුය.)

වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය යටතේ ව්‍යාපෘති 05ක සංරක්ෂණ කටයුතු අවසන් කර ඇත. 2015 වර්ෂයේ දී දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණය අනුව කෝට්ටේ අංගම්පිටිය පාරේ පැරණි කොටු බැම්ම දිග අඩි 100ක පමණ කොටසක් සංරක්ෂණය කර ඇත.

මීට අමතරව මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් ව්‍යාපෘති 03ක වැඩ අවසන් කර ඇත. කළුතර දිස්ත්‍රික්කයේ බොලොස්සගම වැලිකන්ද සුනන්දාරාමයේ පැරණි පිළිමගේ වහල ඇතුලු සම්පූර්ණ ගොඩනැගිල්ල





කෝට්ටේ පැරණි උමඟ කැණීම
II අදියර අතරතුර

සංරක්ෂණය කිරීම, දෙහිවල සුබෝධාරාමයේ පැරණි පිළිමගේ වහල හා ගෙබිම සංරක්ෂණය කිරීම, දිවුලපිටිය බලගල්ල සරස්වතී පිරිවෙන් විහාරයේ පැරණි ආවාසගේ වහල හා ඉදිරි කණු පෙළ සංරක්ෂණය කිරීම, කෝට්ටේ රජමහා විහාරයේ පැරණි බමුණුගෙය සංරක්ෂණය කිරීම ඇතුළු ව්‍යාපෘතිවල වැඩ අවසන් කර ඇත. තවද උඩුතිත්තිරිපිටිය ශ්‍රී අරියනන්දනාරාමයේ ආවාස ගෙය, ඇතගම සුමනාරාමයේ පැරණි ආවාස ගෙය හා බුලුගහගොඩ ජයසුමනාරාමයේ පිළිමගෙය, රත්මලාන පරමධම්ම චෛත්‍ය පිරිවෙණ සහ ඕලන්ද කෞතුකාගාරය යන ස්මාරකවල සංරක්ෂණය කිරීමේ කටයුතු ද 2016 දී ආරම්භ කර ඇත.

බස්නාහිර පළාතේ සියලුම රසායනික සංරක්ෂණ කටයුතු ප්‍රධාන කාර්යාලයේ රසායන අංශය මගින් සිදුකෙරෙනු ඇත. දැනට විශේෂ ව්‍යාපෘතියක් ලෙස කැලණිය රජමහා විහාරයේ බිතු සිතුවම් සංරක්ෂණය කරමින් පවතී.



දෙහිවල සුබෝධාරාමය සංරක්ෂණය අතරතුරදී




බලගල්ල සරස්වතී පිරිවෙණ විහාරයේ පැරණි ආවාසගෙය සංරක්ෂණයට පෙර හා පසු

බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි කලාප 06ට වෙන් කර ඇත. ප්‍රධාන කාර්යාලයේ නඩත්තු අංශය මගින් මෙහෙයවන මෙම කලාප සඳහා කලාප භාර නිලධාරීන් පත්කර සියලුම පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක වාර්ෂිකව නඩත්තු කරමින් පවත්වා ගෙන යනු ලබයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශාස්ත්‍රීය අංශය මගින් පළාත තුළ සිදුකරනු ලබන සියලුම ක්ෂේත්‍ර රාජකාරී සම්බන්ධීකරණ කටයුතු කිරීම හා අවශ්‍ය පහසුකම් සපයාදීමේ වගකීම ද මෙම කලාපය භාර නිලධාරීන් විසින් ඉටු කළ යුතුය. තවද කලාපයට අයත් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනෙකුත් රාජ්‍ය ආයතන, ස්වේච්ඡා සංවිධාන, ආගමික සිද්ධස්ථාන, දායක සභා වැනි ආයතන සමඟ සහයෝගයෙන් රාජකාරී කටයුතු කිරීමේ වගකීම ද මෙම නිලධාරීන්ගේ කාර්යභාරයේ කොටසකි.

මේ ආකාරයෙන් නිසි ලෙස වැඩ බිම් කළමනාකරණය කරමින් 2015 වර්ෂයේ ස්ථාන හා ස්මාරක 30කට ආසන්න ප්‍රමාණයක් ශුද්ධ පවිත්‍ර කරමින් නඩත්තු කටයුතු සිදුකර ඇත. මෙයට පිළිකුත්තුව, උඩුගම්පල, පතහ, කෝට්ටේ පැරණි නගරය, එම දිය අගල හා පතහවත්ත පැරණි ප්‍රාකාරය වැනි විශේෂ ස්ථාන ඇතුළත්ය.

2015 වර්ෂයේ ප්‍රවර්ධන අංශය මඟින් පුරාවිද්‍යා සතියට අදාළව වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කර ඇත. පුරාවස්තු විනාශය පිටු දකිමු යන තේමාව යටතේ පාසල් ළමුන් දැනුවත් කිරීමේ දේශන හා සම්මන්ත්‍රණ ගණනාවක් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කර ඇත.

කෞතුකාගාර අංශය යටතේ කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාරය නවීකරණය කරමින් කෝට්ටේ රාජධානියට අයත් කෞතුක භාණ්ඩ රාශියක් ප්‍රදර්ශනයට තබා ඇත. ප්‍රධාන කාර්යාලයේ මුදල් හා පාලන අංශ මෙන්ම පුරාවිද්‍යා පොලිස් ආරක්ෂණ ඒකකයේ ද සහයෝගය ඇතිව මේ ආකාරයෙන් ශාස්ත්‍රීය අංශවලට අදාළ ව්‍යාපෘති රාශියක් උරුමය රැකගැනීම උදෙසා සිදුකිරීමට වූයේ බස්නාහිර පළාතේ සියලුම නිලධාරීන් හා සේවක එකමුතුවෙනි.

උක්ත ව්‍යාපෘති සාර්ථක කරගැනීම සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ඍජු අධීක්ෂණය හා මඟපෙන්වීමත්, ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ ප්‍රධානීන්ගේ සහයෝගයත්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ඇතුළු පාලන අංශයේත්, ගණකාධිකාර ඇතුළු ගිණුම් අංශයේත්, පුරාවස්තු ආරක්ෂණ පොලිස් ඒකකයේ සහයෝගය ද, බස්නාහිර පළාත් කාර්යාලයේ සියළුම කාර්ය මණ්ඩලයේ සහයෝගය ද නොඅඩුව ලැබුණු බව මෙහිදී සඳහන් කළ යුතුය.

**මහින්ද කරුණාතිලක**
*සහකාර අධ්‍යක්ෂ,*
*බස්නාහිර පළාත*

# අම්පාර දිස්ත්‍රික්කය

අම්පාර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මඟින් අම්පාර දිස්ත්‍රික්කය තුළ ප්‍රධාන ව්‍යාපෘති හතරක් 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී. එනම්, තුනේ කණුව දාගැබ සංරක්ෂණය, නීලගිරි දාගැබ සංරක්ෂණය, දීඝවාපි කලාප කාර්යාලයේ නඩත්තු කටයුතු හා ප්‍රාදේශීය කාර්යාලයේ නඩත්තු කටයුතු ය. ඊට අමතර ව ගවේෂණ අංශය මඟින් පුරාවිද්‍යා ස්මාරක දත්ත වාර්තා කිරීම, ඛනිජ කැණීම්වලට අදාළ ව ස්ථාන පරීක්ෂා කිරීම හා නීති කටයුතු සිදු කිරීම මෙන් ම පුරාවස්තු විනාශයන් වාර්තා කිරීම ද සිදු කෙරිණි.

## 3 කණුව දාගැබ සංරක්ෂණය

පොතුවිල් - සියඹලාණ්ඩුව ප්‍රධාන මාර්ගයේ තුනේ කණුව සමීපයේ මේ ඉපැරණි දාගැබ පිහිටා තිබේ. කුඩා ප්‍රමාණයේ දාගැබක් වන මෙය ක්‍රි.ව. 4- 6 ශතවර්ෂවලට අයත් යැයි සිතිය හැකි ය. ශිලා ලේඛන කිසිවක් හමු වී නොමැති නිසා මෙහි ඉතිහාසය සැඟ ව පවතී. එහෙත් දාගැබ අවට විද්‍යමාන වන ශිලා ප්‍රාකාර, නටබුන් ආදියෙන් එකල විහාර සංකීර්ණයක් මෙහි තිබූ බව හෙළි වෙයි.

ගරාවැටී වල් බිහි වී පැවැති දාගැබ ඌව පළාත් පුරාවිද්‍යා කාර්යාලය මඟින් සංරක්ෂණය කරන ලදී. සංරක්ෂණය කොට ඇති දාගැබේ උස මී. 3. 1කි. මෙහි ප්‍රදක්ෂිණා පථය හා දාගැබ් මළුව සංරක්ෂණ කටයුතු 2015 දී අම්පාර පුරාවිද්‍යා කාර්යාලය මඟින් යළි ආරම්භ කෙරුණු අතර වැඩකටයුතු සම්පූර්ණයෙන් අවසන් වී ඇත. දාගැබේ සංරක්ෂණ කටයුතු සඳහා රු. 3,548,331. 50 ක් වැය වී ඇති අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපාදන ලබා දෙන ලදී.

## නීලගිරි දාගැබ සංරක්ෂණය

නැගෙනහිර පළාතේ සුවිශාලත්වයෙන් යුතු දෙවන දාගැබ නීලගිරි දාගැබ යි. ලාහුගල ප්‍රදේශයට අයත් නිලගිරි රක්ෂිතයේ මෙය පිහිටා තිබේ. දාගැබේ උස මී.22 වන අතර විෂ්කම්භය මී. 600 කි. සුරතිස්ස රජු විසින් කළ "මහානුග්ගල දාගැබ" මෙය යැයි හාන්දුරුපැල්පොළ පුඤ්ඤසාරතන හිමියෝ කියති. භාතිකතිස්ස රජුගේ කාලයේ දීත් පළමු වන ජෙට්ඨතිස්ස රජුගේ කාලයේ දීත් මේ විහාරය "උත්තර සීවලී පබ්බත විහාරය" නමින් හැඳින් වූ බව දාගැබ් මළුවේ තිබී හමු වූ ශිලා ලිපි දෙකකින් හෙළි විය.



නීලගිරි දාගැබේ සංරක්ෂණ කටයුතු 1979 දී ආරම්භ කෙරුණ ද එල්. ටී. ටී. ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් 1983 දී නතර කරන ලදී. නැවත එහි වැඩ කටයුතු ආරම්භ කෙරුණේ 2008 වර්ෂයේ දී ය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් එකල ගවේෂණ කටයුතු සිදු කරන ලදී. 2012 දී කැණීම් කටයුතු සිදු කළේ ය. 2014 දී දාගැබේ ජේසා වළලු පිළිසකර කිරීම ආරම්භ වූ අතර එහි වැඩ කටයුතු ක්‍රමානුකූල ව සිදු කෙරේ. 2015 වර්ෂය සඳහා රුපියල් 7,643,200 ක ප්‍රතිපාදන මේ සඳහා වෙන් කෙරිණි.

2015 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ නඩත්තු අංශය මඟින් දීඝවාපි කලාප කාර්යාලයේ නාන කාමරය හා වැසිකිළි පද්ධතිය ද ප්‍රාදේශීය කාර්යාලයේ ජලය ටැංකිය ද ඉදිකරනු ලැබී ය. ඒ සඳහා වැය කෙරුණු මුළු මුදල රු.187,084.05 කි.



මේ අනුව අම්පාර පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාලය අම්පාර දිස්ත්‍රික්කයේ පැරණි උරුමයන් හඳුනාගනිමින් හා රැකගනිමින් මතු පරපුරට දායාද කිරීමෙහි ලා සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කරමින් සිටී.

**ඩී. එම්. බී. ජේ. බී. දිසානායක**
*සහකාර අධ්‍යක්ෂ,*
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, අම්පාර.*

# දකුණු පළාත

ප්‍රධාන කාර්යාලයෙන් ලැබුණා වූ මඟ පෙන්වීම යටතේ ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුන කේන්ද්‍ර කර ගනිමින් ගවේෂණ, කැණීම්, වාස්තු විද්‍යා සංරක්ෂණ, රසායන සංරක්ෂණ, පොදු සේවා, නඩත්තු, කෞතුකාගාර, අභිලේඛණ හා නාණක විද්‍යා යන සෑම අංශයකින්ම නියෝජනය වන පරිදි ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවන ලදී.

ගවේෂණ අංශය මඟින් චංචල පුරාවස්තු ලේඛනගත කිරීම යටතේ මධ්‍යම සංස්කෘතික



**දික්වැල්ල ගල් කන්ද පුරාණ විහාර රසායන සංරක්ෂණය**

අරමුදල මඟින් පාලනය වන ගාල්ල කොටුව සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ සියළුම කෞතුක වස්තු ලේඛනගත කිරීම සිදු කරන ලදී. මුහුදු පුරාවිද්‍යා ක්ෂේත්‍රය මෙරට තුළ ප්‍රචලිත වීමෙන් අනතුරුව මෙරට ආරම්භ කරන ලද පළමු සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය මෙය වන අතර එය ගාල්ල කොටුවේ පැරණි බඩු ගබඩාවේ ස්ථාපිත කර ඇත. එසේම මෙම වර්ෂය පුරාම රටේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සඳහා අවැසි හානි ඇගයුම් හා ස්ථාන පරීක්ෂා කරමින් රටේ ඉදිරි ගමනට සහයෝගය ලබා දීම වැදගත් කාර්යයකි. ඒ අනුව ගල්, වැලි, පස් කැපීම සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී. එසේම පුරාවිද්‍යා ස්ථානයන්ට හා පුරාවස්තූන්ට හානි පැමිණවීම සම්බන්ධයෙන් සිදු කෙරුණු නීති කටයුතු සඳහා ගවේෂණ අංශය මඟින් නිරතුරුව මැදිහත් විය.

කාලයාගේ ඇවෑමෙන් මිහිදන්ව පැවති මෙරට ප්‍රෞඪ උරුමය සොයා ගනු වස් කැණීම් අංශය මඟින් මෙම වර්ෂය පුරා ව්‍යාපෘති කිහිපයක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ සිතුල්පව්ව මඟුල් මහා විහාරයේ ගොඩනැගිලි සංකීර්ණය කැණීම් කරන ලදී. මෙම කැණීම් මඟින් වට ප්‍රාකාරයකින් යුතු ඇතුළත ගොඩනැගිලි වලින් සමන්විත නටබුන් සමූහයක් හමු වී තිබේ. මෙම ගොඩනැගිලි සංකීර්ණය බෝධිඝරයක් බවට අනුමාන කරයි. එහි ප්‍රාකාරයේ දිග පළල පිළිවෙලින් මීටර් 23.5 ක් හා 17.30 ක් පමණ වේ. තවද මෙහිදී ක්‍රි.පූ. 1-2 සියවස්වලට ද අයත් අක්ෂර සහිත මැටි බඳුන් කැබැල්ලක් කාලරක්ත මැටි බඳුන් හා කාලවර්ණ මැටි බඳුන් ඇතුළු පුරාවස්තු රාශියක් හමු වී ඇත. කැණීම් අංශය මඟින් තිස්සමහාරාම විහාරයේ නව ධර්ම ශාලාව ඉදිකිරීම සඳහා හානි ඇගයීම් කැණීම් ව්‍යාපෘතියක් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අදියර දෙකක් යටතේ සිදු කරන ලද අතර මුල් අදියරේදී පරීක්ෂණ වලවල් 04 ක් ද කැණීම් කර ඇත. ප්‍රථම අදියරේදී පුරාවිද්‍යාත්මක සාධක හමු වූ හෙයින් ඊට උතුරින් ක්‍රියාත්මක කරන ලද දෙවන අදියරෙන් තෝරා ගත් භූමිය ධර්මශාලාව ඉදිකිරීමට සුදුසු බව හඳුනා ගන්නා ලදී. මෙම වසරේ කැණීම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද සුවිශේෂී කැණීම් ව්‍යාපෘතිය ලෙස පෙන්වා දිය හැක්කේ හම්බන්තොට සූරියවැව ප්‍රදේශයේ මහගල්වැව ඉස්මත්තේ සිදු කරන ලද මෙගලිතික සුසාන කැණීමයි.



කෞතුකාගාර අංශය මඟින් මෙම වර්ෂය පුරා දෙස් විදෙස් නරඹන්නන්ගේ ආකර්ශනය දිනා ගනිමින් යටාල හා මාතර තාරකා කොටුව පවත්වාගෙන යාම සිදු කරන ලදී. එසේම මාතර තාරකා කොටුව දිය අගල් පරිශ්‍රයේ රැඳී සිටි අඩි 07 ක් පමණ දිගැති කිඹුලා ආරක්ෂක හේතූන් මත ඉන් ඉවත් කිරීම සිදු කරන ලදී.

පොදු සේවා අංශය මඟින් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර එහිදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 125 සංවත්සරය සමරනු වස් දානමය පුණ්‍ය කර්මයක් හා ලේ දන්දීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී. එසේම සාහිත්‍ය මාසයේ දී කියවීමේ රුචිය වර්ධනය කරනු වස් මෙරට ඉතිහාසය හා පුරාවිද්‍යා පිළිබඳ ලියවුනු පොත් අලෙවි සැලක් පවත්වන ලදී. එයට පාසල් සිසුන්ගේ හා ඉතිහාසයට ලැදි ජනයාගෙන් ලැබුණේ සුභවාදී ආකල්පයකි. ගාල්ල කොටුව කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලද ගාලු සමය අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනයේ දී ප්‍රදර්ශන කුටියක් ක්‍රියාත්මක කරන ලද අතර එයට ද ඉතා යහපත් ප්‍රතිචාරයක් ලැබීම එවන් කාර්යයන් කිරීමට තවත් දිරිමත් කිරීමකි.



ගාල්ල කොටු බැම්ම ආසන්නයේ ඇති සේවක කාමරය සංරක්ෂණය

දකුණු පළාතේ වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය මඟින් මෙම වර්ෂය පුරා ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ගාල්ල කොටු බැම්ම ආසන්නයේ ඇති සේවක කාමරයේ වහල සංරක්ෂණය, වටගෙදර ටැම්පිට විහාරයේ ගෙබිම සංරක්ෂණය, බෙන්තර ගලපාත විහාරය, බෝපේ සතර දේවාලය, බූස්ස සුදර්ශනාරාමයේ ධර්ම ශාලාවේ සංරක්ෂණය අවසන් කිරීම, මාතර ඕලන්ද කොටුවේ පිහිටි ඔරලෝසු කණුවේ සංරක්ෂණය, මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ ගංගාරාම වාඩුවැලිවිටිය පිළිමගෙය සංරක්ෂණය හා කසාගල විහාරයේ ආවාස ගෙය සංරක්ෂණය කිරීම සිදු කරන ලදී.

නඩත්තු අංශය මඟින් දකුණු පළාතට අයත් කලාප පවත්වාගෙන යාම මූලික කර ගනිමින් කලාප අංක 01 ට අයත් ගනේගොඩ විහාරයේ ධර්මශාලාව වටා ගරාදි වැටක් සැකසීම, ගාලු කොටුවේ විශේෂ කලාපයේ සේවක මහතුන්ගේ කාමරය සංරක්ෂණය කිරීමෙන් අනතුරුව එහි ධර්ම දේශනයක් හා දානමය පුණ්‍ය කර්මයක් සිදු කර නැවත භාවිතයට ගැනීම සිදු කරන ලදී. එසේම කලාප අංක 04 යටතේ මාතර තාරකා කොටුවේ දැව පාලම සැකසීම, පල්ලාවෙල කීර්ති ශ්‍රී තේජෝවනාරාමයේ පොත් ගුල් වහලය ප්‍රතිසංස්කරණය කිරීම, නුපේ පැරණි වෙළඳ මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය, කලාප අංක 05 යටතේ නයිගල පුරාවිද්‍යා ස්ථානයේ සෙල්ලිපි සඳහා ආවරණ වැටවල් යෙදීම, කලාප අංක 06 මඟින් තෙළුල්ල ක්ෂේත්‍ර නිවාසයේ යටිතල පහසුකම් සංවර්ධනය, පුරාවිද්‍යා ස්ථාන සඳහා විස්තරාත්මක පුවරු යෙදීම (දිසාපති නිල නිවස, මාටෙලෝ කුළුණ, එල්ලුම් ගස, පැරණි කච්චේරිය, ස්මරණ පුවරුව, අශ්ව ගාල) මාටෙලෝ කුළුණ හා තෙළුල්ල පුරාවිද්‍යා ස්ථානයේ මාර්ගයන් සැකසීම අවසන් කර තිබේ. කලාප අංක 07 යටතේ සැදැහැවතුන්ගේ වන්දනාවට අවැසි යටාල ස්තූපයේ සුදු හුණු පිරියම් කරන ලදී.

රසායන සංරක්ෂණ අංශය මඟින් ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණය යටතේ ගාල්ල වැලිපිය ගංගාරාමය, බූස්ස පිටිවැල්ල ජයවර්ධනාරාමය, කඹුරුපිටිය ජයසිංහාරාමය, තෙලිජ්ජවිල



සමරවීර මුදලින්දාරාමය, රන්න කහඳාව විහාරය, රැකව ජයමහා විහාරය, කඹුරුගමුව නදී තීරාරාමය, මාතර කුරුඹුරේ විහාරය, දඹගහ නායක විහාරය, වැල්ලෝඩය ශ්‍රී උදේශිකාරාමය, කොග්ගල මුදලින්දාරාමය, දොඩන්දූව ශෛලබිම්බාරාමය, ගල්කන්ද පුරාණ විහාරය, කඹුරුපිටිය සබරලේ ශ්‍රී නිවාසාරාම විහාරය, අම්බලන්ගොඩ සුනන්දාරාමය හා තෙල්වත්ත පුරාණ විහාරයේ සිතුවම් හා ප්‍රතිමා සංරක්ෂණය කරන ලදී.

**ඒ. ඩී. එම්. ඩබ්. කේ. කේ. අලහකෝන්,**
*ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ (ගාල්ල, මාතර)*

# ඌව පළාත

අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඌව පළාත් පුරාවිද්‍යා කාර්යාලය මගින් 2015 වර්ෂය තුළදී පළාතේ ජාතික උරුමයන් ආරක්‍ෂා කර ගැනීමෙහිලා සුවිශේෂී වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදි. මෙකී වැඩසටහන් මාලාවේදී අතීත උරුමයන් හඳුනා ගැනීම, ලේඛනගත කිරීම හා විනාශවෙමින් පවතින පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනාගෙන ආරක්‍ෂාව සඳහා පිළියම් යෙදීම ඇතුළුව පළාතේ ජාතික උරුමයන් අනාගත පරපුර උදෙසා ආරක්‍ෂා කර ගැනිමට සමගාමීව මහජනතාව හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව ගවේෂණ අංශය මගින් ඌවේ අතීත උරුමයන් හඳුනා ගැනීම සහ ලේඛනගත කිරීමේ කාර්යයේදී චංචල පුරාවස්තු ලේඛනගත කිරීම, පුරාවිද්‍යා භූමි සහ පුරාවස්තු සොරකම් වාර්තා කිරීම හා පළාතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සමගාමීව සිදුකෙරෙන පුරාවිද්‍යා හානි ඇගයීම්, ගල් බිඳුම් හා ඛනිජ කැණීම් ස්ථාන පරීක්‍ෂා කර නිර්දේශ ලබාදීම ඇතුළුව කාර්යයන් රැසක් සිදුකරන ලදි.

කැණීම් අංශය මගින් මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මානාභරණ විහාරයේ බටහිර ප්‍රාකාර බැම්ම කැණීමේ දෙවන අදියර සිදුකරන ලදි.

වාස්තුවිද්‍යා සංරක්‍ෂණ අංශය මගින් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක දෙක ආශ්‍රිතව වූ යුධගනාව දාගැබ සංරක්‍ෂණය, දිඹුලාන වෙහෙරගොඩ විහාරයේ පිළිමගෙය සංරක්‍ෂණය



සහ කිරිඹරුව අම්බලම සංරක්‍ෂණ ව්‍යාපෘතිවලට අදාල සංරක්‍ෂණ කාර්යයන් සිදුකරනු ලැබුණි.

ඌව පළාතේ නඩත්තු අංශය මගින් බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකට අදාලව වු කලාප හතක් යටතේ ප්‍රධාන වැඩබිම් පවත්වාගෙන යාමට අමතරව කලාප මට්ටමින් පුරාවිද්‍යා ස්මාරක භූමිවල නඩත්තු කටයුතු ක්‍රියාත්මක කර එම ස්මාරකවල ආරක්‍ෂාව සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම සිදුකරන ලදි.

ඒ අතර බදුල්ල ළිඳමුල්ල පත්තිනි දේවාල සංකීර්ණයේ වහල නඩත්තුව, බෝගොඩ විහාරයේ පිළිමගෙයි සිතුවම් රහිත කොටසේ බිත්ති කපරාරුව, දෝව විහාරයේ පැරණි තොරණ නඩත්තුව අප විසින් ඉටුකළ සුවිශේෂී නඩත්තු කාර්යයක් ලෙස හැඳින්විය හැකිය.

තවද දියතලාව සංචාරක බංගලාව නඩත්තුව, කතරගම සංචාරක බංගලාව අලුත්වැඩියාව, කතරගම කිරිවෙහෙර ගරාවැටුණු ප්‍රාකාර බැම් කොටස් යථාවත් කිරීම, බුදුරුවාගල ක්ෂේත්‍ර නිවාසය අලුත්වැඩියාව, කෞඩාව විහාරයේ ධර්මශාලාවේ වහල නඩත්තුව, තිඹිරිය පුරාවිද්‍යා ස්ථානයේ පැරණි ධර්මශාලාවේ වහල නඩත්තුව සිදුකර පළාතේ පුරාවිද්‍යා ස්මාරකවල නඩත්තු කාර්යයන්වලට අදාළ කාර්යයන් සිදුකරනු ලැබීය.

බාහිර ආයතන හා පොදු තැන්පත් ආධාර යටතේ පළාතේ බදුල්ල දිස්ත්‍රික් පරිපාලන කෞතුකාගාරය ප්‍රදර්ශන මට්ටමට පත්කිරීමේ කටයුතුවලින් 80% පමණ සිදුකිරීමට හැකිවිය.



**විශේෂ ව්‍යාපෘතියක් වු යුධගනාව උඩදාගැබ සංරක්‍ෂණය**

මෙයට අමතරව "දැයෙහි උරුමය මතුපරපුර උදෙසා" වූ අරමුණින් යුතුව මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ විශේෂ දේශන මාලාවක් පළාතේ තෝරාගත් පාසල් ආශ්‍රිතව සිදුකරනු ලැබුණි. තවද පුරාවිද්‍යා සතිවැඩසටහනට සමගාමීව පළාතේ තෝරාගත් පුරාවිද්‍යා ස්ථාන කිහිපයක් ආශ්‍රිතව රුක්රෝපණ වැඩසටහනක්ද දියත් කරන ලදි.

මේ අනුව ගෙවීගිය 2015 වර්ෂය තුළ ඌවේ ජාතික උරුමයන් ආරක්ෂිතව හා සුරක්ෂිතව පවත්වාගෙන යාම මූලික කර ගනිමින් පොදු මහජනතාව වෙත බද්ධ කිරීමෙහිලා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ලද්දේ පළාතේ නිලධාරි හා සේවක එකමුතුව තුළිණි.





**ඉනෝකා බාලසූරිය**
ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ (ඌව)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
බදුල්ල.





**කොටසර රජමහා විහාරයේ ලේඛනගත කළ කරඬුවක් සහ ආභරණ බහාළු බඳුනක්**

# ප්‍රාග් බෞද්ධ යුගයේ ශ්‍රී ලාංකීය පුරා විද

ශ්‍රී ලාංකීය වෛද්‍ය විද්‍යාව සඳහා දීර්ඝ ඉතිහාසයක් පවතියි. මහා වංශය සදහන් කරනුයේ ලාංකීය සමාජය විජයාවතරණයෙන් පසුව හැදී වැඩී වර්ධනය වු බවයි. මෙම තර්කය ඉන්දියානු ගති ස්වභාවයකැයි බොහෝ විචාරකයෝ පවසති. එය එසේ නම් බුදුරදුන් මෙහි පැමිණ ධර්මය දේශනා කළේ ගස් ගල් වලටද යන පැනය පැන නගී. මෙම කරුණු විමර්ශනය සදහා පහත පරිදි කරුණු දැක්විය හැක.

**ජනශ්‍රැතිය, සංස්කෘතිකාංග, ඇදහිලි සහ විශ්වාස, පුරාවිද්‍යා සාධක, වෙනත් සන්නිවේදන**

මේ අනුව ශිෂ්ටාචාරය යනු රටක මිනිසුන් තම අහස පොළොව සහ සම්බන්ධ වී අවශ්‍යතාවයන් නිපදවා ගන්නා ආකාරයයි. සංස්කෘතිය යනු එක් මිනිසෙක් අනික් මිනිස් සමුහයා සමඟ සම්බන්ධතා ඇතිකරගත් ආකාරයයි. ආර්ථිකය යනු මිනිසුන් තම පරිසරය තුළින් අවශ්‍යතා නිපදවා ගැනීමයි. සමාන පරිසරයක් තුළ සමාන නිෂ්පාදන ක්‍රම ඇතිවීම දක්වා ආර්ථිකය පැතිරී යා හැක. මෙම සමාන නිෂ්පාදන සීමාවෙන් බන්ධනය වන සමුහය ජාතිය වෙයි. මේ අනුව මෙම දේශයේ මානව සමාජයක් පැවතී ඇත. නමුදු එදෙස වෙනත් දේශයක ලක්ෂණයන් සමග ගැලපීමේදී නොදියුණු යැයි සිතිය හැක.

දේශීය වෛද්‍ය ක්‍රමය යනු ලාංකීය වෛද්‍ය කර්මයයි. මෙම වෛද්‍ය සම්ප්‍රදායේ ආරම්භය, ස්වරූපය හා විකාශනය පිළිබඳ මත රාශියකි.

- ශ්‍රී ලාංකික වෛද්‍ය සම්ප්‍රදාය මහින්දාගමනයටත් පෙර සිටම රාවණා රාජ්‍ය කාලයේ සිට පැවත එන්නකි.
- ශ්‍රී ලාංකික දේශීය වෛද්‍ය සම්ප්‍රදාය යනු භාරත දේශයෙන් ලක්දිවට දායාද වී මෙහි පැවති වෛද්‍ය ක්‍රම හා සම්මිශ්‍රණය වුවකි.
- ශ්‍රී ලාංකික වෛද්‍ය සම්ප්‍රදාය යනු ශ්‍රී ලංකාවටම ආවේණික එක් එක් පරම්පරා සතුව පවතින විවිධ වෛද්‍ය ක්‍රම රාශියකි.
- ශ්‍රී ලාංකික දේශීය වෛද්‍ය සම්ප්‍රදාය යනු වට්ටෝරු ක්‍රමයක් මිස ඊටම ආවේණික දර්ශනයක් සහිත වූවක් නොවේ.

ලාංකීය වාරි කර්මාන්තය හා බැඳි ශිෂ්ටාචාරයක් ලොව මෙතෙක් සාර්ථකව හමු වී නැත. ලාංකීය වාරි කර්මාන්තය හා බද්ධව පවතින ස්වස්ථතා සංකල්පයේ අති විශිෂ්ටත්වය මැනවින් පෙනෙනුයේ එකී අංගයන්හි පවතින ස්වස්ථතාවය හා බද්ධව පවතින නිරෝගීබාවයයි. වෑ කණ්ඩිය, බිසෝ කොටුව, හොරොව්ව, යන වචනයන් හා බැදී පවතින උපදේශනයේ ස්වභාවය මැනවින් පැහැදිලි වේ. ලාංකීය ජන සමාජයේ බද්ධව පවතින වැවයි දාගැබයි - ගමයි පන්සලයි පෝෂණය වීම සිදු වන්නේ බුදු දහමින් උපුටා ගන්නා ලද ලෞකිකත්වය හා ලෝකෝත්තර සුවය හා බද්ධව පවතින හර පද්ධතියක් වුවද මෙම ලාංකීය පුරාණ ජන සමාජයේ පැවති අනන්‍යතාවය බුදු දහමින් වඩා අර්ථවත් වීමයි.


මිහින්තලේ ඉපැරණි රෝහල් සංකීර්ණය

කෙසේ නමුදු විජයාවතරණයට පෙර වෛද්‍ය කර්මය පැවති බවට සාක්ෂි බොහෝ ඇත. විජයගේ ලංකාගමනයට පෙර විවිධ ප්‍රදේශවල ජනතාව ජීවත් වූ බව ඉතිහාසඥයින් සහ පුරා විද්‍යාඥයින් සොයා ගෙන ඇත. පාහියන්ගල වැනි ස්ථානවල කරන ලද කැණීම් වලදී සොයාගත් ඇටකටු සහ වෙනත් දෑ තත් යුගයේ භාවිත උපකරණද හමු වී ඇත.



මෙම සමහරක් උපකරණ ඉතා සියුම් ස්වභාවයක් දරණ බවද සදහන් කර ඇත. මෙම උපකරණ රඳවා ගැනීම පිණිස ආධාරකද තිබී ඇති බව පැහැදිලිව පෙනී යයි. මෙම උපකරණ දෙස පිරික්සීමේ දී පෙනී යනුයේ එම යුගයේ විසු වෛද්‍යවරුන් තම වෛද්‍ය කාර්යයන් සඳහා භාවිත උපකරණ බවයි. එසේනම් මෙකී ජනයාට සිරුර පිළිබඳ මනා අවබෝධයක් තිබෙන්නට ඇත. ඒ අනුව පෙනී යනුයේ ආදී දේශීය ජනතාව තුළ වෛද්‍යමය ඥානය අඩුවක් නොවී පැවතී බවයි.

ඉබ්බන්කටුව වැනි පුරාණ සුසාන භූමි ඉතා වැදගත් සාක්ෂියක් වනුයේ,



මෙරට ආදී ජනයා කිසියම් දියුණු තාක්ෂණයක් සහිත ඥාන සම්භාරයකින් යුත් ජන කොටසක් බව ඒත්තු ගැන්විය හැකි බැවිණි. මෙහි තිබී ඇති ආභරණ දියුණු කර්මාන්තයක ලක්ෂණ පැහැදිලි වේ. මෙය දියුණු සංස්කෘතියක ලක්ෂණයකි.5 එනිසා මෙම දේශයේ දියුණු වෛද්‍ය ක්‍රමයක් අනිවාර්යයෙන්ම තිබෙන්නට ඇත.

බුද්ධ කාලයට පළමුව අවුරුදු දෙදහසකට පූර්ව කාලයේදී ප්‍රසිද්ධ රාවණා රජු මෙරට රජකම් කර ඇත. දියුණු රාජ්‍ය පාලනයක් පැවතියේ නම් ජන ජීවිතය නගා සිටුවීමට අවශ්‍ය වෛද්‍ය ක්‍රමයක් තිබුණේයැයි යන මතය කෙසේ නම් ප්‍රතික්ෂේප කළ හැකිද? මේ නිසා මෙකල දියුණු සංස්කෘතියක් තිබුනායැයි යන්න විශ්වාස කළ හැක. ආයුර්වේදයේ මූලික අවදියේද ලාංකීය වෛද්‍ය කර්මයක් තිබී ඇති බවට කදිම නිදසුනක් ලෙස පුලස්ථි ඍෂී පිළිබඳ ජන ප්‍රවාදය මතුකර දැක්විය හැකිය. මෙම ඍෂි පුලස්ථි භාරතීය ඍෂි සම්මේලනයටද සහභාගි වූ බව ආයුර්වේදාවතරණයේදීද සඳහන් කරයි. මෙහි රාවණා රජු පුලස්ථි ඍෂිගේ මුණුබුරෙකි. රාවණා යනු විශ්‍රවස් ජනපතියාගේ පුත්‍රයෙකි. ඔහු මහා ඍෂි පුලස්ථිගේ පුත්‍රයෙකි. රාවණා රජු පුලස්ථි පරපුරේ වෛද්‍ය කර්මය හදාරා ඇත. පියාගේ ඇවෑමෙන් රාක්ෂ සහ යක්ෂ සමාජ පාලනය කරමින් මහා බල පරාක්‍රමයෙන් ලොව බලය පතුරුවා ඇත. මෙම රාවණා රජු දක්ෂ වෛද්‍යවරයකුද වේ. එනම් රාවණා රජු විසින් රචිත ග්‍රන්ථ විමසුමේදී මේ බව පැහැදිලි වේ. රාවණා රජු කුමාර තන්ත්‍රය, අර්ක ප්‍රකාශය, ඔඩ්ඩීස තන්ත්‍රය, ආදිය වෙයි. රාවණා හත්ත නම් වීණාවද මහා බලපරාක්‍රමයක් ලොවට විසුරුවා හළ රාවණා රජුගේ නිපැයුමකි. එය දැනට උතුරු සහ දකුණු ඉන්දියානු සංගීතඥයින් අතර සම්භාවිතය. ඔසු නිපදවීමේ සහ සහ ග්‍රන්ථ සංස්කරණයේ විශේෂ හැකියාවක් තිබු බව කුමාරදාස මහා කවියා ජානකීහරනයෙන් ඉදිරිපත් කොට ඇත. වෛද්‍ය පරම්පරා ජාලයක් පැවති බව කියොඹඩ්ඩිස ලියු රාවණා රජුගේ පුත්‍ර ඉන්ද්‍රජිත්ද ග්‍රන්ථකරණයේ යෙදී සිටියේය. යන උපකල්පනයෙන් තහවුරු වෙයි. දඬුමොනරය ද

# ාත්මක සාධක හා දේශීය වෛද්‍ය කර්මය



මැදිරිගිරිය



රිටිගල



පොළොන්නරුව

රාවණා රජුගේ නිර්මාණයකි. මෙම සංකල්පය ඉවත දැමිය නොහැක්කේ වේද යුගයේදී පවා පරමාණු පිළිබඳ යම් දැනුමක් කාලීන උගතුන් තුළ තිබුණායැයි අද්‍යතන යුගයේ විචාරකයන් අදහස් දක්වන බැවිනි. දැනුදු ශ්‍රී ලංකාවේ බොහෝ නාම දෙස විමසුමේදී මේ බැව් පැහැදිලි වේ.

කුඩා රාවණා කෝට්ටේ, මහා රාවණා කෝට්ටේ, රාවණාගොඩ, සීතාවක, සීතා එළිය, රාවණා ඇල්ල, රාස්සගල, රාස්සපාන වැනි ප්‍රදේශ නාමයන් මෙයට උදාහරණ කීපයක් ලෙස ගත හැකි වේ.

එකල මෙම දිවයින නාග සහ යක්ෂ යන ගෝත්‍රිකයින් ජීවත් වූ බව සදහන් වේ. යක්ෂ ගෝත්‍රික ජනයා වයඹ දිග ආශ්‍රිතව ජීවත් වී ඇත. නාග ගෝත්‍රික ජනයා සෙසු පෙදෙස්වල ජීවත් වී සිටි බව සදහන් වේ. විශේෂයෙන් කැලණිය ප්‍රදේශය නාග දිවයිනක් ලෙස පැවතී ඇත.නාග ගෝත්‍රිකයින්ට වඩා යක්ෂ ගෝත්‍රිකයින් ප්‍රබලව සිට ඇත. එනම් එම සමාජය භාවිතා කරන ලදැයි හැඟෙන කුරුටු පූජාදිය, දුම්මල, පන්දම්, ගිනි කබල, කහදිය යන ඒවායින් සනාථ වේ. අප භාවිතා කරනු ලබනු යම් යම් ඔසු නාම දෙස විමසුමේදී මේ බැව් පැහැදිළි වේ. යක්ෂ විරේකය, යක්ෂ කායම, යක්ෂ භූත තෛලය, යක්ෂ රජ වටිය යන ආදිය එයින් සමහරකි. පාරම්පරිකව පැවත එන ඔසු නාමයන්ද එලෙසින්ම දැකිය හැක. යක් නාරං, යක්වනස්ස, යක්බේරිය, යක් කපු එයට උදාහරණයන් ලෙස ගත හැක.

බුදුන් පහස තෙවරක් මෙම පුණ්‍ය භූමියට ලැබිණි. එසේනම් විජයාවතරණයට පෙර ජීවත් වු බවට අභේදනීය වු නිදසුනකි . ජනතාව විශ්වයේ පහළ වීමට පෙර ඔසු පහළ වුවා ය. බුදුන් මෙරට වැඩියේ ජනයාගේ ගැටලුවක් සමථය කිරීම සදහාය. මෙම ජනයා සමගි කර වීම බුදුන්ගේ ඒකායන පරමාර්ථයයි. බුදුරදුන් දෙවන වර සහ තෙවන වර වැඩම කිරීමෙන් මේ බව තව දුරටත් තහවුරුවේ.

**විජය රජු මෙබිමට පය තබන මොහොතේ පටන් තිබු ලක්ෂණයන්ගෙන් මේ බව මැනවින් පැහැදිලි වේ.**

1. විජය කුමරු ඇතුළු පිරිසට උපුල්වන් දෙවිදු පිරිත් නූල් බැදීම.
   (මෙම කරුණද තත්කාලීන සමාජයේ මෙබිම නිර් ඔසු ප්‍රතිකාරය පැවති බවට සාධකයකි.)
2. විජය ඇතුළු පිරිස සිර ගත කිරීම.
   (මෙහිදී ස්වදේශීය ජනයා තුළ අධිකරණමය ක්‍රියාමාර්ග තිබුණු බවට සාධකයකි. නායකයකුගේ දියණියක් වු කුවේණිය භූත විද්‍යා දැනුමෙන් සන්නද්ධව සිට ඇත.)
3. ආගන්තුක සත්කාරවල උසස් බව.
   (එනම් සිරගත කල විජය ඇතුළු පිරිස පිළිබදව අනුකම්පා සහගත ලෙස ක්‍රියා කිරීම
   (''නා නා විධ වු, බොහෝ වු සහල් ආදිය දැක්විය. ඒ මිනිස්සු බත් හා සූපයන් හුයා රජ කුමරු හු බත් කවා සියල්ලෝද කෑවෝ ය'')17 මෙය එකල විසු ජනයාගේ උසස් මානුෂීය ලක්ෂණයකි.

   දිවයිනෙහි පැවති දැඩි නීතී රීති විදේශවල පවා කිසියම් ප්‍රමාණයකට ප්‍රචාරය වන්නට ඇත. එබැවින් රටට බාහිරින් අනවශ්‍ය දෑ ඇතුළු නොවීමට පාලකයෝ ක්‍රියා මාර්ග ගන්නට ඇත.

   විජය රජු පැමිණි කාලයේදී පහත ලක්ෂණ ශ්‍රී ලංකාවේ තිබුණි.



1. පාලනයේ දී ස්ත්‍රීන්ටද කිසියම් වගකීමක් පැවරී තිබුණි.
2. ප්‍රාදේශීය පාලන ක්‍රම වේදයක් ක්‍රියාත්මක වීම
3. අන්තර්ජාතික දියුණු වරාය පද්ධතියක් තිබීම
4. ආගමන විගමන නීතී ක්‍රියාත්මක වීම
5. සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක වීම (අවසර නැතිව නෑම, තහනම් පොකුණක් තිබීම)
6. හාල්,හකුරු,මී පැණි ආදි ද්‍රව්‍ය අපනයනය කිරීම සහ කපු වෙළඳාම පැවතීම
7. මැද පෙරදිග සමඟ සම්බන්ධතා පැවැත්වීම (යුධ පුහුණු අශ්වයින් සිටීම)
8. විවිධත්ව සමාජයක් පැවතීම (යක්ෂ, නාග, දේව, පුංලන්ද, ව්‍යාඛ ආදී ගෝත්‍රයන්ට රජුන් සිටීම)
9. ස්වෛරීත්වයෙන් පිරිපුන් රාජ්‍යත්වය
10. ප්‍රාථමික බහු දේව වාදයෙන් මිදීමට උත්සහ ගැනීම (බෞද්ධ නැඹුරුවට යොමු වීම)
11. විධිමත් ශිෂ්ට සම්පන්න ගිවිසුම් කඩ නොකරන ජාතියක් සිටීම (කුවේණි පලි ගැසීම)
12. සිවිල් නීතී සංකල්ප ක්‍රියාත්මක වීම
13. ජාත්‍යාලය ඇති වූවන් වීම (කුවේණිව මරා දැමීම) නීතීය සැමට පොදු බව
14. වරද කළ අයට පමණක් දඬුවම් ලබා දීම (කුවේණියගේ දරු දෙදෙනා නොමැරීම)

මෙම සරල විග්‍රහය අනුව පෙනී යන කරුණක් වනුයේ විජයාවතරණයට පෙර දියුණු ශ්‍රී ලාංකීය ජනතාවක් සිටි බව සහ ඔවුන් වඩාත් සෞඛ්‍ය සම්පන්නව ද දිවි ගෙවූ බවයි.

**වෛද්‍ය ජානක කරුණාරත්න**
*ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (රිදීගම)*
*ආයුර්වේද රෝහල*
*දොඩන්ගස්ලන්ද.*

*ඡායාරූප: අර්ජුන සමරවීර*

# යාපනය දිස්ත්‍රික්කය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ යාපනය පුරාවිද්‍යා කාර්යාලය කේන්ද්‍රකර ගනිමින් 2015 වර්ෂයේ සංරක්ෂණ, කෞතුකාගාර පවත්වාගෙන යාම හා පුරාවිද්‍යා ස්ථාන නඩත්තු කොට පවත්වාගෙන යාම යන අංශ යටතේ කාර්යයන් සිදු කෙරුණි. ඊට අමතරව මුලතිව්, වව්නියා, කිලිනොච්චි සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වල සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වූ ඛණිජ නිස්සාරණය සඳහා අවශ්‍ය බලපත්‍ර ලබාදීම මෙම වසරේ ද සිදු කෙරුණි.

මෙම කාර්යයන් අතර වාස්තු විද්‍යා සංරක්ෂණ කාර්යයන් වලදී යාපනය දිස්ත්‍රික්කයේ විශාලතම පුරාවිද්‍යා ස්මාරකය වන යාපනය ඕලන්ද කොටුව සංරක්ෂණ ව්‍යාපෘතිය ප්‍රමුඛ ලෙස සැලකිය හැක. මෙම ව්‍යාපෘතිය නෙදර්ලන්ත රජයේ, ශ්‍රී ලංකා රජයේ හා රාජ්‍ය ආයතනවල මූල්‍යාධාර වශයෙන් රු. 123,827,700.00 ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ වසර ගණනාවක යුධමය වාතාවරණය තුළ මහජනතාවගේ ප්‍රදර්ශනයට හසු නොවුණු වැදගත් ස්මාරකයක් වන මෙය නිසි ලෙස සංරක්ෂණය කර මහජනතාවගේ අවශ්‍යතාවයන් සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දීමයි.

මෙම සංරක්ෂණ ක්‍රියාවලියේදී මේ වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වාස්තු විද්‍යා සංරක්ෂණ අවස්ථාවල දී අනුගමනය කරනු ලබන ජාත්‍යන්තර නිර්ණායකයන් අනුගමනය කරමින් සංරක්ෂණ ක්‍රියාවලිය සිදු කළ අතර ඒ සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහ පුරාවිද්‍යා උපදේශක සභාවේ පිළිගත් වාස්තු විද්‍යා සංරක්ෂණ ප්‍රවීණයින්ගේ උපදෙස් ද ලබා ගන්නා ලදී.

එමෙන්ම සක්කෝට්ටෙයි ඕලන්ද පල්ලිය, යාපනය කොටුව, අච්චුවේලි ඕලන්ද පල්ලිය යන ස්මාරක වල තිබූ හානිදායක ශාක හා පැළෑටි රසායන ද්‍රව්‍ය භාවිතා කර ඉවත්කිරීම මෙම වසරේ සිදුකළ තවත් රසායන සංරක්ෂණ ක්‍රියාවලියකි. එම කාර්යයන් ප්‍රධාන කාර්යාලයේ මැදිහත්වීමෙන් හා යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ මැදිහත්වීමෙන් සිදු කරන ලදී. එමෙන්ම විශේෂ කාර්යයක් ලෙස යාපනය පුරාවිද්‍යා කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර තිබූ වික්ටෝරියා රැජිණගේ වර්ණාලේපිත උස අඩි 09 පළල අඩි 06 ප්‍රමාණයේ සිතුවම යාවත්කාලීන කර රසායන සංරක්ෂණය මගින් තහවුරු කිරීම සිදු කරන ලදී.

උතුරු පළාතට අදාළ කෞතුකාගාර වන යාපනය සහ වව්නියාව කෞතුකාගාර ද්විත්වය මහජනතාවගේ ප්‍රදර්ශනය සඳහා සාමාන්‍ය පරිදි නඩත්තු කොට පවත්වාගෙන යාම මෙම වසරේ ද සිදු කරන ලදී. යාපනය කෞතුකාගාරය ප්‍රධාන කෞතුකාගාරයක් වන බැවින් මෙහි විවිධ විෂය ක්ෂේත්‍රවලට අදාළ පුරාවස්තු ප්‍රදර්ශනය වේ. එමෙන්ම මෙම කෞතුකාගාරයේ ප්‍රදර්ශන ක්‍රමවේදයන් මේ වන විට යාවත්කාලීන කිරීමත් කෞතුකාගාර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමත් කළ යුතුව පවතින බැවින් මෙහි පුරාවස්තු ප්‍රදර්ශනය නවීන ප්‍රදර්ශන ක්‍රමවේද භාවිතා කොට සිදු කිරීම අපහසු වී ඇත. මෙම කෞතුකාගාර ගොඩනැගිල්ල හා පුරාවස්තු ප්‍රදර්ශන ක්‍රමවේදයන් සම්පූර්ණයෙන්ම වර්තමානයට ගැළපෙන ලෙස සකස් කිරීම කාලෝචිත වුවත් එම කාර්යය විශාල කාලයක් හා ධනයක් වැය කොට සිදු කල යුතු කාර්යයක් වන බැවින් මෙලෙස පවතින තත්ත්ව යටතේ පවත්වාගෙන යාමට සිදුව ඇත. එසේම වව්නියාව කෞතුකාගාරයේ දෛනික ප්‍රදර්ශන කටයුතු ද සාමාන්‍ය මට්ටමෙන් පවත්වාගෙන යනු ලැබීය.

එමෙන්ම යාපනය ප්‍රාදේශීය කාර්යාලය මගින් පැරණි කච්චේරි ගොඩනැගිල්ල, කන්දරෝඩය පුරාවිද්‍යා ස්ථානය, මන්ත්‍රී මාළිගය, යමුනාරි පොකුණ, සංකිලියන් තොරණ, නිලාවරේ ළිඳ, සිරප්පර මඩම, තෙරුමුඩි අම්බලම වැනි පුරාවිද්‍යා ස්ථාන අවට පිරිසිදු කොට නඩත්තු කර පවත්වාගෙන යාම හා සාමාන්‍ය පරිදි ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සිදු කරන ලදී. එමෙන්ම වව්නියාව දිස්ත්‍රික්කයේ තෝනිගල ප්‍රදේශයේ පිහිටි සෙල්ලිපිය සඳහා වන ප්‍රවේශ මාර්ගය පිළිසකර කර වැලි අතුරා නඩත්තු කාර්යයන් සිදු කරන ලදී.

මේ අනුව යාපනය ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මූලික කොටගෙන ලැබී තිබුණු මූල්‍ය ප්‍රතිපාදන හා මේ වසරේ අනුමත ඇස්තමේන්තු අනුව පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ රැකගත යුතු හා ආරක්ෂා කළ යුතු ස්ථාන වල පැවැත්ම සඳහා සංරක්ෂණ, නඩත්තු හා පාලන කටයුතු නිසි පරිදි සිදු කරන ලදී.



















**පාලිත වීරසිංහ**
*සහකාර අධ්‍යක්ෂ*
*යාපනය, කිලිනොච්චි දිස්ත්‍රික්ක*


# වයඹ පළාත

ජාතික උරුමයන් සුරැකීමේ මහඟු කාර්යයට උරදෙමින් 2015 වසරේ දී ද වයඹ පළාත් පුරාවිද්‍යා කාර්යාලය මඟින් කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක දෙක කේන්ද්‍ර කර ගනිමින් ගවේෂණ, කැණීම්, කෞතුකාගාර, වාස්තුවිද්‍යා සංරක්ෂණ, රසායන සංරක්ෂණ, නඩත්තු සහ ප්‍රවර්ධන යන සෑම අංශයක්ම නියෝජනය වන පරිදි ව්‍යාපෘතීන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

2015 වසර සඳහා ප්‍රධාන කාර්යාලය මඟින් වෙන්කර දෙනු ලැබූ මිලියන 06 කට ආසන්න ප්‍රමාණයක මූල්‍ය ප්‍රතිපාදන යටතේ සෑම අංශයකම ව්‍යාපෘතින් ක්‍රියාත්මක විය.

ගවේෂණ අංශය යටතේ පසුගිය වර්ෂයේ දී විශේෂිත ව්‍යාපෘතින් නොමැති වුවත් වාර්ෂිකව සිදුකරනු ලබන ස්ථාන පරීක්ෂා කිරීම් හා චංචල පුරාවස්තු ලේඛනගත කිරීම කරන ලදී. මෙහිදී ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු යටතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික් දෙක ආවරණය වන පරිදි අනවසර කැණීම් ස්ථාන 23 ක්, පුරාවිද්‍යා වටිනාකම් පරීක්ෂා කිරීම් 03 ක්, කළුගල් නිස්සාරණ ව්‍යාපෘති 360 ක්, බොරළු ව්‍යාපෘති 113 ක්, පස් කැණීම් ව්‍යාපෘති 03 හා මැණික් කැණීම් ස්ථාන 01 වශයෙන් පරීක්ෂා කර වාර්තා ලබාදීම සිදුකර ඇත. චංචල පුරාවස්තු ලේඛණගත කිරීමේ ව්‍යාපෘතිය 2015.04.28 දින සිට 2015.12.29 වෙනි දින දක්වා කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 න් දහයක ලේඛනගත කිරීමේ කාර්යය සිදුකර ඇත. පුත්තලම, කල්පිටිය, වනාතවිල්ලුව, ආණමඩුව, මහකුඹුක්කඩවල, නවගත්තේගම, කරුවලගස්වැව, හලාවත, මාදම්පේ, පල්ලම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ඒ අතර වේ. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රජමහා විහාර, පෞද්ගලික ස්ථාන, දේවාල, කෝවිල් ආදී ස්ථානවල චංචල පුරාවස්තු ලේඛනගත කිරීම් කරනු ලැබීය. දුර්ලභ ගණයේ පුරාවස්තු ඒ අතර විය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 අතුරින් කුරුණෑගල, මහව, නාරම්මල, ගනේවත්ත සහ පොල්පිතිගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ලේඛනගත කිරීම් කාර්යය ක්‍රියාත්මක කර ඇත. යාපහුව, දඹදෙණිය යන සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘති භාරයේ තිබූ චංචල පුරාවස්තු ලේඛනගත කිරීම අවසන් කරන ලදී.



වාස්තුවිද්‍යා සංරක්ෂණ අංශය යටතේ ව්‍යාපෘති 06 ක සංරක්ෂණ කටයුතු සාර්ථකව නිම කරන ලදී. එහිදී දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 02 ක් හා මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 04 ක් ද වශයෙනි. කුරුණෑගල - පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩහපොල රතනපාලාරාම විහාරයේ ටැම්පිට විහාරය සංරක්ෂණය හා රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩකැන්දවල පුරාණ විහාරයේ පිළිමගෙය සංරක්ෂණය දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක විය. රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජංකුරේ ශ්‍රී විෂ්ණු දේවාලය, පොල්පිතිගම මාළිගාතැන්න පධානඝරයේ පියගැටපෙළ සංරක්ෂණය, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුපිටිය නාගරුක්ඛාරාම පුරාණ විහාරයේ ටැම්පිට විහාරයේ ප්‍රදක්ෂිණාපථය වටා වැටක් යෙදීම හා කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දීකිරිකෑව ටැම්පිට විහාරය සංරක්ෂණය මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘති සඳහා අවශ්‍ය සියළුම දැව විහාරස්ථාන හා දේවාල මඟින් සපයාදීම විශේෂිත කරුණකි.



කෞතුකාගාර අංශය යටතේ පඬුවස්නුවර, යාපහුව හා පුත්තලම කෞතුකාගාරවල දෛනික පවත්වාගෙන යාමේ කටයුතු සිදුවිය.

නඩත්තු අංශය මඟින් කලාප අංක 01 සිට 09 දක්වා පවත්වාගෙන යාම සිදුකරන ලදී. මේ යටතේ වාර්ෂික පවත්වාගෙන යාමේ කාර්යයට අමතරව බැමි තහවුරු කිරීම්, යටිකැලය කැපීම, පෙත් මං සැකසීම, මායිම් යෙදීම, වැටවල් සැකසීම, පුවරු යෙදිම වැනි කාර්යයන්ද කරන ලදී. ඊට අමතරව විශේෂිත නඩත්තු කාර්යයන් ලෙස විළඳගොඩ සංරක්ෂිත ලෙන් විහාරය අවට භූදර්ශනය සැකසීම හා කුරුණෑගල ඇත්කඳ ලෙන් විහාරයේ වහළයේ නඩත්තු කටයුතු දැක්විය හැක. මෙහිදී පුත්තලම කරුවලගස්වැව, විළඳගොඩ පුරාවිද්‍යා ස්ථානයේ 2013, 2014 වර්ෂවලදී සංරක්ෂණයට භාජනය කෙරුණු ප්‍රතිමා ගෘහය අසල ජලය බැසයාමට සුදුසු පරිදි භූදර්ශනය සැකසීම හා මෙම ස්ථානය ආසන්නයේ තිබූ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම ද සිදුකරන ලදී.

ඊට අමතරව කුරුණෑගල ඇත්කඳ විහාරයේ ලෙන් විහාරයේ වහල නඩත්තු කිරීම සිදුකරන ලදී. පසුගිය වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද මුළු නඩත්තු ව්‍යාපෘති ප්‍රමාණය 28 කි. ඒ අතරින් පඬුවස්නුවර පුරාවිද්‍යා ස්ථානයේ මාර්ග සඳහා බොරළු ඇතිරීම ව්‍යාපෘතිය මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක විය.

ප්‍රවර්ධන අංශය යටතේ 2015 ජාතික පුරාවිද්‍යා සතිය නිමිත්තෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් සංවිධානය කෙරිණි. ඒ අනුව යාපහුව මහා විද්‍යාලයේ සිසු දරුදැරියන්ගේ සහභාගීත්වයෙන් යාපහුව පුරාවිද්‍යා ස්ථානයේ දී දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක විය. එමෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත වෑකඩ මහා විද්‍යාලය හා හලාවත කිරිමැටියාව බෞද්ධ බාලිකා විද්‍යාලය යන ස්ථානවල ද එබඳු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන්වලට සමගාමීව අත්පත්‍රිකා බෙදාදීමද සිදුවිය. ඊට අමතරව වාර්ෂිකව පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන්ද වර්ෂය පුරාම පවත්වන ලදී. ඒ අනුව කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක දෙක ආවරණය වන පරිදි වැඩසටහන් 36 ක් පමණ පවත්වන ලදී.

රසායන සංරක්ෂණ අංශය මගින් පළාත තුළ විසිරී ඇති පෞරාණික විහාරස්ථානවල රසායන සංරක්ෂණ කටයුතු කිරීම සිදුවිය. ඒ අනුව වේ නාශක යෙදීමත් චිත්‍ර හා මූර්ති සංරක්ෂණය කිරීමත් සිදුකරන ලදී. ඒ අනුව කුරුණෑගල



විල්බාව පුරාණ විහාරය, ගනේවත්ත හුණුපොල විහාරය, බඩගමුව ශ්‍රී සුදර්ශනාරාම විහාරයේ ටැම්පිට විහාරය, පොල්පිතිගම කබැල්ලෑලෙන විහාරය, වාරියපොල රඹුකන විහාරය, බමුණාකොටුව මොණරාගල විහාරය, තැඹිලිපොල විහාරය හා රස්නායකපුර තඹරගිරි විහාරය ආදී ස්ථානවල චිත්‍ර මූර්ති සංරක්ෂණය සඳහා මැදිහත්වන ලදී. ඊට අමතරව බිංගිරිය දේවගිරි විහාරයේ ටැම්පිට විහාරය, ඉඳුල්ගොඩකන්ද විහාරය, යන ස්ථානවල වේ නාශක යෙදීමත් කල්පිටිය ඕලන්ද බලකොටුවේ කොටු පවුරේ වැවී ඇති ශාක මර්ධනය සඳහා කටයුතු කිරීමත් සිදුකරනු ලැබිය.

අනෙකුත් වර්ෂවල මෙන්ම 2015 වර්ෂයේදී ද වෙන්වූ ප්‍රතිපාදන සීමාව තුළ පළාත තුළ විසිරී ඇති පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක රැකගැනීමේ කාර්යය සඳහා දායක වීමට වයඹ පළාත් ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට හැකියාව ලැබිණ.

**සමින්ද පෝරඹගේ**
*සහකාර අධ්‍යක්ෂ*
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය*
*පඬුවස්නුවර*

# රත්නපුර දිස්ත්‍රික්කය

රත්නපුර හා කෑගල්ල යන පරිපාලන දිස්ත්‍රික්ක දෙක ම නියෝජනය කරමින් සබරගමු පළාත් පුරාවිද්‍යා කාර්යාලය මගින් 2015 වසරේ දී ව්‍යාපෘති ගණනාවක් ම සාර්ථක ව නිම කළේය. 2016 වසරේ මැයි මස සිට රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයක් ස්ථාපිත කිරීම ප්‍රදේශයේ පුරා ස්මාරක හා පුරාවස්තු කෙරේ වඩාත් සම්පතාවයක් ගොඩනගා ගැනීමට උදාවූ මහඟු අවස්ථාවකි.




රසායන සංරක්ෂණ කටයුතු සිදු කරන ලද ගොඩකවෙල බලවින්න ගංගාරාම විහාරය

රත්නපුර දිස්ත්‍රික්කය පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වශයෙන් වැදගත් සාක්ෂි බොහොමයක් දායාද කළ ප්‍රදේශයකි. පී.ඊ.පී. දැරණියගල හා ශිරාන් දැරණියගලයන්ගේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා පර්යේෂණ ලොවට ගෙන යාමට හැකිවූ කුරුවිට බටදොඹලෙන, බලංගොඩ උඩුපියං ගල්ගෙය ආදීවූ බලංගොඩ මානවයාගේ සංස්කෘතික ශේෂයන්ද, රත්නපුර මැණික් පතල් ආශ්‍රිතව හමුවූ දත්තයන් ඇසුරින් නම් ලද රත්නපුර සංස්කෘතිය ද ප්‍රාථමික යකඩ යුගයේ සාධක සපයන සමනල වැව ද ප්‍රදේශය සතු අනගි දායාදයන් ය.




මීට අමතර ව ඓතිහාසික යුගයේ සාධක සපයන සෙල්ලිපි, බුදුගල වැනි පදානඝර සංකීර්ණයන් ද, යටත්විජිත යුගයේ පුරාස්මාරකයන්ගෙන් ද රත්නපුර පොහොසත් ය. මෙම ස්මාරකයන් සංරක්ෂණය හා නඩත්තුව කෙරේ නිරන්තරයෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වේ. 2016 වසරේදී බොල්තුඹේ සමන් දේවාලය, වලල්ලාගොඩ ටැම්පිට විහාරය, බුදුගල පදානඝර, සංබපාල විහාර හා මඩුවන්වෙල වලව්වේ වාස්තු විද්‍යා සංරක්ෂණයන් සිදුකිරීමට බලාපොරොත්තු වේ. බලවින්න පුරාණ ගංගාරාම විහාරය හා තිරිවාන කැටිය රන්කොත් විහාරය රසායන සංරක්ෂණයන් සිදුකිරීමට මේවන විට ආරම්භ කර ඇත. මීට අමතරව නඩත්තු කලාප තුනක් යටතේ දිස්ත්‍රික්කය පුරා විසිරී ඇති පුරාවිද්‍යා ස්මාරක නඩත්තු කරනු ලැබේ. රත්නපුර අන්තඃපුර මාළිගා ගොඩනැගිල්ල රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය බවට පරිවර්තනය වන අතර එහි සංරක්ෂණ කටයුතු සිදු කෙරේ.

**පී. බී. ඒ. සේනාරත්න,**
*සහකාර අධ්‍යක්ෂ (රත්නපුර),*
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,*
*රත්නපුර.*

# සබරගමු පළාත

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය සමස්ථ ශ්‍රී ලාංකීය ජනතාවගේම අයිතියකි. එබැවින් ඒවා ආරක්ෂා කිරීම සහ කළමණාකරණය කිරීම යනු රටේ මානව සංවර්ධනයේ ප්‍රධානතම අංගයක් ලෙස සැලකිය යුතු අතර, ඒවාට කිසියම් හානියක් සිදුවුවහොත් එය ප්‍රතිලෝමනය හා ප්‍රතිස්ථාපනය නොකල හැකි සම්පතක්ය යන පදනම සැලකිල්ලට ගෙන ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තියකට අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිය කාර්යභාරය ඉටු කරනු ලබයි.

මේ අනුව ජාතික උරුමයන් ආරක්ෂා කිරීම, සුරක්ෂිත කිරීම හා එමගින් අනාගත පරපුරට දායාද කරදීම උදෙසා හදුනාගත් අරමුණු ඔස්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ. වාර්ෂිකව ඉටුකරනු ලබන්නාවූ මෙම ව්‍යාපෘති මෙහෙයවීම දීපව්‍යාප්තව විමධ්‍යගතව ඇති ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාල හරහා සිදුකරනු ලැබේ. මෙසේ




කුරුගල කැණීමේ දත්ත විශ්ලේෂණ කටයුතු සිදුකරන අයුරු සීතාවක දත්ත විශ්ලේෂණය අංශයේ දී

සබරගමුව පලාත තුළ රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක දෙක සඳහා 2015 වර්ෂයේදී ද වෙනත් වර්ෂවලදී මෙන්ම ව්‍යාපෘති රාශියක්ම එක් එක් අංශවලට අදාලව ඉටු කරන ලදී. මේ සඳහා භාණ්ඩාගාරයෙන් ලැබෙන වාර්ෂික ප්‍රතිපාදන, විශේෂ ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන, මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලැබෙන ප්‍රතිපාදන සහ වෙනත් ආයතන මගින් ලැබෙන ප්‍රතිපාදන යොදවන ලදී.

ගවේෂණ හා ලේඛණගත කිරීම් අංශයේ 2015 වසරේදී ප්‍රධාන ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක වූ අතර, එයින් කුරගල පුරාවිද්‍යා ගවේෂණය වැදගත් වේ. මෙහිදී පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්මාරක රැසක් ඡායාරූප, GPS කණ්ඩාංක සහ සැලසුම් සහිතව වාර්ථාගත කිරීමට හැකිවිය. මීට අමතරව චංචල පුරාවස්තු ලේඛනගත කිරීම, ගල්තලා පරීක්ෂා කිරීම සහ කෑගල්ල, රත්නපුර දිස්ත්‍රික්කයන් හි ක්ෂේත්‍ර පරීක්ෂණ හා පසුවිපරම් කටයුතු, අනවසර කැණීම් පරීක්ෂා කිරීම, ඛණිජ නිස්සාරණය සඳහා නිර්දේශ සැපයීම ආදී විවිධ රාජ්‍ය ආයතනයන්ගෙන් සිදු කරන ලද ඉල්ලීම් සඳහා අවශ්‍යය රාජකාර්මය වගකීම් ඉටු කරන ලදී.

මෙම අංශය යටතේ සීතාවක මාළිගා භූමිය කැණීම් වාර්තාව සකස් කිරීම, කුරගල කැණීම් පරිශ්‍රයෙන් හමුවූ පුරාවස්තු විශ්ලේෂණය කිරීම සිදුවිය. මානව ඇටසැකිල්ලක්, මානව අස්ථි අවශේෂ, සත්ව අස්ථි සහ විවිධ ප්‍රමාණයේ ගල් ආයුධ, ආභරණ ආදී ප්‍රාග් මානවයා භාවිතා කළ අවශේෂ මෙම විශ්ලේෂණ කටයුතු වලදී අධ්‍යයනයට භාජනය විය. එම කාර්යයන්ට අමතරව සීතාවක මාලිගා භූමිය නැරඹීම සඳහා පැමිණි දෙස් විදෙස් සංචාරකයින්ට, පාසල් ශිෂ්‍යයින්ට කැණීම් දත්ත විශ්ලේෂණය සිදු කෙරෙන අයුරු සජීවී නැරඹීමට අවස්ථාව සැලසීම ඔවුන්ගේ නොමඳ ඇගයීමට ලක්විය. එහිදී එම සංචාරකයින්ට ප්‍රාග් මානවයින්ගේ ගල් ආයුධ පළමු වතාවට නැරඹීමට අවස්ථාව මෙම විශ්ලේෂණ කාර්යේදී සිදුවිය.

2015 වසර සඳහා කෞතුකාගාර අංශයේ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක වූ අතර, මෙයින් 03 ක් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන හිමිවිය. එයින් දැදිගම හා රත්නපුර සමන් දේවාල කෞතුකාගාර පවත්වාගෙන යාම සිදුවිය.

විශේෂ ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ මඩුවන්වෙල කෞතුකාගාරය හා තොරතුරු මධ්‍යස්ථානය සැලසුම් කිරීම දෙවන අදියර ක්‍රියාත්මක විය. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ උපදෙස් පරිදි අදියර කිහිපයක් යටතේ ශ්‍රී ලංකාවේ එකම හා පරිපූර්ණ වලව් කෞතුකාගාරය බවට මඩුවන්වෙල වලව්ව පරිවර්ථනය කිරීම සඳහා මෙයින් ක්‍රියාකාරකම් කිහිපයක් සිදුවිය. වලව් සංස්කෘතියට අයත් සිතුවම් නිර්මාණය, පැරණි දිසා කොඩි සිතුවම් කිරීම, පැරණි දෝලාව දැව සංරක්ෂණය කිරීම, පුරාවස්තු ආධාරක (පාදස්ථල) දැවයෙන් සැකසීම, භාෂාත්‍රයෙන් වලව් සංස්කෘතියට අයත් තොරතුරු පුවරු සැකසීම, අධිකරණ ශාලාවේ දැව වැට සැකසීම සිදුවිය.

කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික් 02 සඳහා වාස්තුවිද්‍යා සංරක්ෂණ ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කරන ලදී. දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ව්‍යාපෘති 04 ක් ද, මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන මත ව්‍යාපෘති 05 ක් හා කෑගල්ල නගර සභාවේ ප්‍රතිපාදන මත කෑගල්ල ජුබිලි අම්බලම සංරක්ෂණ කටයුතු ද සිදු කරන ලදී. මෙයින් කෑගල්ල ශාන්ත ජෝන් බැප්ටිස්ට් පල්ලිය සංරක්ෂණය හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බෞද්ධ විහාරාරාම පමණක් නොව පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත සියළු ස්මාරක සංරක්ෂණය සඳහා කැපවී ඇති බව මොනවට පැහැදිලි විය. එමෙන්ම කන්දෙගෙදර ටැම්පිට විහාරය සංරක්ෂණය ඉතා අභියෝගාත්මක එකක් වූ වා පමණක් නොව නවක වාස්තුවිද්‍යා සංරක්ෂකයින්ට බොහෝ අත්දැකීම් ඉතිරි කරන ලද සංරක්ෂණයක් ද විය.





මඩුවන්වෙල කෞතුකාගාර ප්‍රදර්ශනයේ ඇති දිසා කොඩි සිතුවම්





**මඩුවන්වෙල කෞතුකාගාර ප්‍රදර්ශනයේ ඇති පැරණි වලව් සංස්කෘතිය විදහා දැක්වෙන සිතුවම්**

රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති බලවින්න පුරාණ විහාරයේ පිළිමගෙය ඉතා අබලන්ව පැවති අතර ගරු විහාරාධිපති හිමියන්ගේ ඉල්ලීම අනුව කඩිනමින් ඉටුකළ යුතු කාර්යයක් සේ සලකා මෙම පිළිමයෙහි සංරක්ෂණ කටයුතු සිදුවිය. වහලය, බිත්ති සහ දොර ජනෙල් යෙදීම සංරක්ෂණයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස ඉටු කරන ලදී. මේ වන විට 100% වැඩ අවසන් කර ඇත.

මෙම ටැම්පිට විහාරයේ වහලය, බිත්ති සහ ඇතුලත ප්‍රතිමා ශීඝ්‍ර ලෙස විනාශ වෙමින් පැවති අතර කඩිනම් වාස්තු විද්‍යා සංරක්ෂණ කාර්යයක් සේ සලකා මෙම විහාරය සංරක්ෂණය කරන ලදී. එහිදී එහි ඇතුලත පිහිටි දැඩිලෙස දිරාපත්ව පැවති බුද්ධ ප්‍රතිමාව ආරක්ෂා කර ගනිමින් සංරක්ෂණය සිදු කිරීම අභියෝගයක්ව පැවතුණි. නමුත් නිලධාරීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කැපවීම මත එම අභියෝගය ජය ගනිමින් සංරක්ෂණ කාර්යයේ 90% ක පමණ ප්‍රමාණයක් මේ වන විට අවසන්ව ඇත. වටකණු යෙදීම, බීරලු රාමු යෙදීම, උලු සෙවිලි කිරීම, ජේකඩ යෙදීම, වරිච්චි යෙදීම, සිවිලිම, ගේට්ටුව, ප්‍රධාන දොර යෙදීම ආදිය සිදුවිය.

වාර්ෂිකව පෙරහැර මංගල්‍ය පවත්වනු ලබන ප්‍රදේශයේ ප්‍රධාන කතරගම දේවාලයක් වන මෙම අම්මඩුව දේවාලය සංරක්ෂණය කරදෙන මෙන් එහි බස්නායක නිලමේවරයා විසින් සිදු කරන ලද ඉල්ලීමට අවධානය යොමු කර මෙහි සංරක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. වහලයේ සංරක්ෂණ කටයුතු ප්‍රධාන කාර්යයක්ව පැවති අතර, විදුලි පද්ධතිය අලුත්වැඩියාව, බීරලු වැට සැකසීම, දොරවල් යෙදීම ආදී කාර්යයන්ද සිදුවිය.

මෙම විහාරයේ ධර්මශාලාව සංරක්ෂණයේදී වහලය සැකසීම, බිත්ති කපරාරු කිරීම, ගෙබිම සැකසීම, දොරවල් සවිකිරීම, සිවිලිම් චිත්‍ර සංරක්ෂණය, විදුලි පද්ධතිය අලුතින් සැකසීම, හුණු ආලේප කිරීම ආදී කාර්යයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කර සංරක්ෂණය සිදු කරන ලදී.

2015 වසර තුළ සබරගමුව පළාතේ රසායන සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති 10 ක් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වූ අතර, හදිසි රසායන සංරක්ෂණ කටයුතු ද සිදුවිය.

සබරගමුව පළාත් පුරාවිද්‍යා නඩත්තු කටයුතු වෙනුවෙන් රු. 2,176,722.00 ප්‍රතිපාදන වෙන්ව තිබූ අතර, ඒ යටතේ පළාතේ සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පුරාවිද්‍යා කටයුතු සඳහා යොදවන ලදී. ප්‍රධාන පුරාවිද්‍යා කලාප 06 ක් යටතේ මෙම කටයුතු සම්බන්ධීකරණය වූ අතර, මෙම ව්‍යාපෘති බොහොමයක් වර්ෂය පුරා පුරාවිද්‍යා ස්මාරක හා ගොඩනැගිලි පවත්වාගෙන යාම සිදුවිය.

නඩත්තු අංශය යටතේ සබරගමුව පළාත් පුරාවිද්‍යා කාර්යාලය අලුත්වැඩියා කිරීමේ කාර්යය ද සිදු කරන ලද අතර, ඉදිකර වසර 11 ක් වන මෙම ගොඩනැගිල්ලෙහි වහලය අලුත්වැඩියාව, තීන්ත ආලේප කිරීම, ඉහළ මාලයේ ආරක්ෂිත ආවරණ සැකසීම, වැසිකිලි අලුත්වැඩියාව ආදී අත්‍යවශ්‍ය කාර්යයන් ඉටුකරන ලදී.

මෙම අංශය යටතේ 2015 වසරේදී පාසල් පුරාවිද්‍යා සංගම් පිහිටුවීම මෙන්ම ජාතික උරුමය, පුරාවිද්‍යාව හා ප්‍රාග් ඉතිහාසය සම්බන්ධයෙන් දේශන පැවැත්වීම ප්‍රධාන කාර්යයක් සේ සලකා කටයුතු කර ඇත. ප්‍රධාන පාසල් 04 ක් ඇතුලු පාසැල් 09 ක හා එක් දහම් පාසලක පුරාවිද්‍යා සංගම් පිහිටුවා දේශන පවත්වා ඇත. ඉතිහාසය නව විෂය නිර්දේශය අනුව ඇතුලත් වන පුරාවිද්‍යාත්මක කරුණු පිළිබඳ පාසල් ගුරුවරුන් මෙන්ම ශිෂ්‍යයින් ද මනා දැනුමක් මෙම දේශන තුළින් ලබා ගන්නා ලදී. මෙම පාසල් පුරාවිද්‍යා සංගම් පිහිටුවන ලද පාසල් පුස්තකාල සඳහා පුරාවිද්‍යා ප්‍රකාශන කට්ටලය බැගින් පරිත්‍යාග කරන ලදී.

**එම්. ඒ. එස්. ටී. කේ. මධුරප්පෙරුම**
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,*
*අවිස්සාවේල්ල*

## මධ්‍යම පළාත

මධ්‍යම පළාත් ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මගින් මහනුවර, මාතලේ, නුවරඑළිය දිස්ත්‍රික්ක ත්‍රිත්වය ආවරණය වන පරිදි ගවේෂණ, වාස්තු විද්‍යා සංරක්ෂණ, කැණීම්, කෞතුකාගාර, නඩත්තු, රසායන සංරක්ෂණ, පොදු සේවා යන අංශයන් කේන්ද්‍රකර ගනිමින් ව්‍යාපෘති රාශියක් 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.

ගවේෂණ අංශය මගින් මැද මහනුවර රජමහ විහාරය ආශ්‍රිතව චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ විහාරස්ථානය ආශ්‍රිතව ස්ථාපිතව පැවති මහනුවර යුගයට අයත් රජමාළිගාවේ සහ රජගල ආරක්ෂිත බලකොටුව ආශ්‍රිත චංචල පුරාවස්තු පරිමාණුකූල සැලසුම්, ඡායාරූපගතකරණය හා පුරාවස්තු පිළිබඳව සියලුම විස්තර ඇතුළත් වන පරිදි වාර්තාගතකරණය සිදුකරන ලදී. එසේම හඟුරන්කෙත යාර 400 ගවේෂණය තුළින් යාර 400 ඇතුළත ඉදිකිරීම් ඒවායේ උපයෝගීතාවය අනුව හඳුනා ගැනීම, පවතින වාස්තවික තත්ත්වයන් වාර්තාගතකරණය හා අනාගත සංවර්ධන කාර්යයන්හිදී විධිමත් සැලැස්මකට අනුව සිදුකිරීම සඳහා යෝජනාවලියක් ඉදිරිපත් කිරීමත් සිදුකරන ලදී. ස්ථාන පරීක්ෂාව හා ගල් බිඳුම් පරීක්ෂාව ව්‍යාපෘතිය තුළින් නීතිකටයුතු හා පුරාවිද්‍යා හානි ඇගයුම්, ගල් බිඳුම් ස්ථාන පරීක්ෂාව සිදුකරන ලදී.

වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය යටතේ ව්‍යාපෘති 14ක් ක්‍රියාත්මක විය. ඒ අතර උකුවෙල වීරපුරන්අප්පු ස්මාරකයට ආරක්ෂිත වැට ඉදිකිරීම, නා උල අම්බලම සංරක්ෂණය, දිවිල්ල අම්බලම සංරක්ෂණය, පුටුහපුව අම්බලමේ වහල සංරක්ෂණය, හන්තාන විහාරයේ ආවාස ගෙය සංරක්ෂණය යන ව්‍යාපෘතීන් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සාර්ථකව නිමාවට පත්කරන ලදි. මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රතිපාදන යටතේ දෙහිදෙණිය බෝධිරුක්ඛාරාම විහාරයේ ධර්මශාලාව සංරක්ෂණය, කඩදොර ආවාස ගෙය සංරක්ෂණය ව්‍යාපෘතීන්ද සාර්ථකව නිමාවට පත්කරන ලද අතර, එම ප්‍රතිපාදන යටතේ මහනුවර උල්පැන්ගේ සංරක්ෂණය, පරණගම වලව්ව සංරක්ෂණය යන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වෙමින් පවතී. එසේම ශ්‍රී දළදා මාළිගාවේ ප්‍රතිපාදන යටතේ මහනුවර මගුල් මඩුව සංරක්ෂණය, විහාරාධිපති හිමිගේ අනුග්‍රහය යටතේ සිරිමල්වත්ත රජමහ විහාරයේ ප්‍රතිමා ගෘහය සංරක්ෂණය යන ව්‍යාපෘතීන්ද සාර්ථකව නිමකරන ලදි.

කැණීම් අංශය යටතේ ව්‍යාපෘති ද්වයක් සාර්ථකව නිමකරන ලද අතර ඒ අනුව ස්තූපය පාදාගෙන තහවුරු කිරීමේ අරමුණින් කාර්තු ක්‍රමය යටත් මීවලපතහ දාගැබ කැණීම සහ රජමාළිගා ගොඩැල්ලේ අවශේෂ මතු කර ගැනීමේ අරමුණින් මැදමහනුවර සෙනරත් රජමාළිගාව කැණීමත් සිදුකරන ලදි.

කෞතුකාගාර අංශය යටතේ මහනුවර රජවාසල කෞතුකාගාරය ආශ්‍රිතව පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය තුළින් මැටි පුරාවස්තු සහ ශෛලමය පුරාවස්තු පර්යේෂකයන්ගේ උපයෝගිතාවය උදෙසා විධිමත් ශාස්ත්‍රීය වාර්තාවක් ලෙස සකස් කිරීම සිදුකරන ලදි. එසේම කෞතුකාගාරය පවත්වාගෙන යාමේ ව්‍යාපෘතිය යටතේ දෛනිකව නඩත්තු කටයුතු සිදුකරමින් ප්‍රදර්ශන මට්ටමින් පවත්වාගෙනයාම සිදුකරන ලදි.

රසායන සංරක්ෂණ අංශය යටතේ කුඹල්ඔළුව ටැම්පිට විහාරය, දුම්කුඹුර විහාරය ආශ්‍රිතව සිතුවම් හා මූර්ති සංරක්ෂණ ව්‍යාපෘතීන් සාර්ථකව නිම කරන ලදි.

මධ්‍යම පළාත් නඩත්තු කලාප 11 ආවරණය වන පරිදි කලාප පවත්වාගෙන යාමේ ව්‍යාපෘතීන් තුළින් දෛනික ශුද්ධ පවිත්‍ර කිරීම්, සුළු නඩත්තු කටයුතු සහ පුරාවිද්‍යාස්ථාන ප්‍රදර්ශන මට්ටමින් පවත්වා ගෙන යාම වසර පුරාම සිදුකරන ලදි. ඊට අමතරව මැණික්දෙන පුරා විද්‍යාස්ථානයට ජල සැපයුම ලබා ගැනීම, අම්බොක්ක අම්බලමේ වහල අලුත්වැඩියාව, උඩුපිහිල්ල බෝධිමළු විහාරයේ පැරණි ප්‍රතිමා ගෘහයේ වහල නඩත්තුව, තලවින්න තලගුණ විහාරයේ දාගැබ නඩත්තුව, කසාවත්ත සෙල් ලිපිය සඳහා ආවරණ වහලක් සැකසීම, ඇතුළුව තවත් ව්‍යාපෘතීන් 7ක්

ක්‍රියාත්මක කරන ලදී. එසේම මධ්‍යම පළාත් වෙළඳ වාණිජ සංචාරක දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන සහ දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ අඹගමුව සෙල් ලිපිය සඳහා ආරක්ෂිත දැල ඉදිකිරීම ව්‍යාපෘතිය සහ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ දෙහදුකඩුල්ල පුරාවිද්‍යා ස්ථානයේ පඩිපෙළ ඉදිකිරීම සහ භූමි අලංකරණය කිරීම ව්‍යාපෘතියද සාර්ථකව නිමකරන ලදී. එසේම කරල්ලියද්ද අම්බලම වහල නඩත්තු කිරීම, ලංකාතිලක විහාරයේ සිංහාසන මන්දිර ගොඩනැගිල්ල නඩත්තු කිරීම ව්‍යාපෘතීන්ද බාහිර ආයතන ආධාර යටතේ සාර්ථකව නිමකරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රතිපාදන යටතේ පුසුල්පිටිට විහාරයේ වහල නඩත්තු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී.

මධ්‍යම පළාත් පුරාවිද්‍යා කාර්යාලයේ ප්‍රවර්ධන අංශය මගින් පහත සඳහන් කාර්යයන් සහ සේවාවන් 2015 වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලදී.

මධ්‍යම පළාතේ රාජ්‍ය නොවන ආයතනයන් හි පිරිස හා පුරාවිද්‍යාත්මක උරුමය අණ පනතක් නීතිරීති ආදී අංශයන් නියෝජනය කරමින් දේශන පැවැත්වීම හා පළාතේ පාසල් සිසු දරු දැරියන් ගුරුවරුන් උදෙසා පාසල් විෂය නිර්දේශයන්ට අනුකූලව දේශන පැවැත්වීම සිදුකරන ලදී.

පුරා විද්‍යාත්මක උරුමය ප්‍රකාශ වන අයුරින් සකස් කරන ලද ප්‍රදර්ශන පුවරු ඇතුළත් පුරා විද්‍යා ජංගම ප්‍රදර්ශන පැවැත්වීම සිදුකරන ලදී. මෙහිදී පාසල්, සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ ප්‍රදර්ශන පවත්වන ලදී.

2015 පුරාවිද්‍යා සති වැඩසටහන වෙනුවෙන් මාතලේ සංස්කෘතික මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ස්ථානයන්හි දී මහජනතාව විශ්වවිද්‍යාලය සිසුන් ආචාර්ය මණ්ඩලය උදෙසා පුරා විද්‍යා ජංගම ප්‍රකාශන අලෙවිසැළ පැවැත්වීම සිදුකරන ලදී.

කිරිවවුල මහා විද්‍යාලය, ගාල්ල සසෙක්ස් විදුහල කෑගල්ල ස්වර්ණ ජයන්ති විදුහල ආදී විද්‍යාලයන්හි සිසුසිසුවියන් උදෙසා පුරාවිද්‍යාත්මක ස්ථාන ස්මාරක පුරාවස්තු පිළිබඳ අවබෝධයක් ලබාදෙමින් මාර්ගෝපදේශන පැවැත්වීම සිදුකරන ලදී.

මීට අමතරව සාමාන්‍ය ජනතාව, පාසල් සිසුන්, විශ්ව විද්‍යාලයන්හි විද්‍යාර්ථයින් උදෙසා පුස්තකාල සේවා හා ශාස්ත්‍රීය තොරතුරු ලබාදීමේ සේවාවන් සැපයීම කාර්යාලයීය ආගමික හා සමාජයීය පොදු සේවා කටයුතු ඉටුකිරීම ආදී කාර්යයන් හා සේවාවන් රැසක් 2015 වර්ෂය පුරා ප්‍රවර්ධන අංශය මගින් ඉටුකරන ලදී.

**එල්. එම්. ගුණතිලක බණ්ඩා**
*සහකාර අධ්‍යක්ෂ*
*පුරාවිද්‍යා පළාත් කාර්යාලය*
*මහනුවර*

# ශ්‍රී ලංකාවේ ලෙන් විහාර සම්ප්‍රදාය

වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් වන ලෙන් විහාර ඒවා පිහිටා ඇති ඕනෑම ප්‍රදේශයක ආර්ථික, සමාජීය හා තාක්ෂණික දියුණුව මැනවින් පිළිබිඹු කරන පුරාණතම නිදර්ශනයකි. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම දඩයමින් හා පලවැල නෙලා ගනිමින් ජීවත්වූ මානවයන් ලැගුම් ස්ථාන වශයෙන් මූලිකවම ස්වභාවික ගල්ලෙන් භාවිතා කරන ලද බවට සාධක හමුවේ. ගුහාවක් හෝ ලෙනක් සංඝයාට ආවාසයක් විය හැකිවූ අතර ම ආවාස නම් වූ තාවකාලික නිවහනක් භාවිතා කිරීම සඳහා බුදුරදුන් විසින් විනය නීති පනවා තිබිණි. දෙවනපෑතිස් රජු විසින් මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ සංඝයාට වස් විසීම උදෙසා ලෙන් සැට අටක් පූජා කිරීමෙන් ලක්දිව දසත විසිරී සිටි භික්ෂු සංඝයා වහන්සේට එබඳු ලෙන් පූජාකිරීමට මහජනයා උත්සුක වූ ආකාරය වංශකථාවල සඳහන් වේ. විහාර සෑදීම සඳහා ලෙන් තෝරා ගෙන ඇත්තේ සුන්දරත්වයේ භාවමය ප්‍රකාශනය චිත්ත දමනයට ඉවහල්වන නිසා ඇති වූ ශාන්ත භාවය, විවේකය, නිරාමිස දිවියක් පතන භික්ෂූන් ගේ වාසස්ථානයක් සඳහා ඉතාමත් සුදුසුවූ හෙයිනි. එසේම සොබාදහමේ නිසල පරිසරය බවුන් වඩන ශ්‍රාවකයන්හට අගනා සේනාසනයක් වන්නට ඇත. ඒ අනුව කඳු මුදුන්වල පිහිටි ගල්තලාසිය සංඝාරාම නිර්මාණය කිරීම සඳහා බැතිමතුන් පොලඹවා ගැනීමට මේ භික්ෂූහු සමත් වූහ. මිහින්තලේ, වෙස්සගිරිය, සිතුල්පව්ව, රිටිගල හා මඩකලපුව දිස්ත්‍රික්කයේ රාජගල හෙවත් රාස්සගල යනාදී ස්ථානවල පිහිටි ලෙන් ආදිම යුගයේ බෞද්ධ භික්ෂූන්ට ආවාස වූ බව පෙනේ.

මෙම ලෙන් පූජා කිරීම සඳහා බුදුදහම වැළඳගත් සමාජයේ නොයෙක් තරාතිරම්වලට අයත් පුද්ගලයෝ ඉදිරිපත් වූහ. එබදු ලෙන්වල කටාරම් කොටා ප්‍රදානය කළ අය පිළිබඳ අභිලේඛන වෙයි. ඒවායේ භාවිතා කොට ඇති අක්ෂර පූර්ව බ්‍රාහ්මී අක්ෂර ලෙස හඳුන්වනු ලැබේ. ක්‍රිස්තු පූර්ව තුන්වන ශත වර්ෂයේ සිට ක්‍රිස්තු වර්ෂ පළමු වන ශත වර්ෂය දක්වා ලෙන් ලිපිවල මේ ආකාරයෙන් සිවුදිගින් පැමිණි, නොපැමිණි සංඝයා වහන්සේලාට ලෙන් පූජා කළ බව දැක්වෙන පාඨයන් දක්නට ලැබේ.

බෞද්ධ භික්ෂූන් විසින් ද ලෙන් ආවාස තැනූ අය විසින් ද මේ සඳහා යොදා ගත් තාක්ෂණය සරලය. පළමුවෙන් ගල්ලෙන තුළ දර ගොඩගසා ගිනි තබා බුරුලට තිබූ ගල් පතුරු කඩා වැටීමට සැලැස්වීය. දුර්ගන්ධය නැතිවූ පසු ලෙන පිරිසිදුකර ආවරණ රහිත පැතිවල ගඩොල් බිත්ති බැඳ ජනෙල් දොරවල් සවිකරන ලදී. බිත්තිවල හුණු මිශ්‍ර වැලි බදාම කපරාරු කොට සුදුහුණු ගාන ලද්දේය.



ලෙන් ආරාම ගොඩනැගීම පිළිබඳව සැලකීමේදී ස්වභාවිකව පිහිටි විශාල ගලක් හෝ පිටතට නෙරා ඇති ගල් තලයක් යට ගුහාවක් නැතහොත් බෑවුමක් සැදෙන සේ අව්වැසි, සුළි සුළං වලට ගොදුරුවූ පෘෂ්ඨය හා වළ ගොඩැලි සහිත ගල් තට්ටු ගලවා දමනු ලැබේ. මෙසේ සෑදුණු ගුහාව තවත් ආරක්ෂා වන සේ, ඉහළ පතුරු ගැලවූ සීමාවේ කෙළවරෙහි ගැඹුරට කටාරමක් කපන ලදී. ලෙන තුලට වැසි වතුර ගලා ඒම මේ කටාරම මගින් සාර්ථක ලෙස වළකනු ලැබේ. ලෙන ඉදිරිපසින් අතිරේක බිත්ති බැඳීම මගින් ලෙන විශාල කර ගැනේ.

මෙම බිත්ති වරිච්චි, ගල්, පිළිස්සු ගඩොල්, කබොක් යනාදියෙන් බැඳ කපරාරු කොට ඔප දමා ඇත. මෙලෙස ලෙන් ආවාසයක් හෝ පසුකලෙක ලෙන් විහාරයක් හෝ සෑදීනි. අවසානයේ දී බිත්ති ඇතුල් පැති ද කපරාරු කර එම පෘෂ්ඨය මත සිතුවම් අඳින ලදී. ලෙන් විහාර තුල සෙසු විහාරවල මෙන් බුද්ධ ශ්‍රාවක හා දේව ප්‍රතිමා ඉදිකර ඇත. ඇතැම් ලෙන්වල පැරණි සිතුවම්වල නෂ්ටාවශේෂයන් අද ද අපට දක්නට ලැබේ. දකුණු පළාතෙහි කරඹගල හා සීගිරියෙහි ලෙන් මෙහි ලා නිදසුන් ලෙස ගත හැකිය.

මේ විහාරවල සිතුවම් අද දක්වාම දුර්වර්ණ නොවන වර්ණයන්ගෙන් විචිත්‍රවත් කොට පවත්වා ගැනීම සඳහා එකල ශිල්පීන් අදට වඩා දියුණු තාක්ෂණයක් භාවිතා කරන්නට ඇතැයි සිතිය හැකිය.

වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් වන ලෙන් විහාර සංරක්ෂණය කර මතු පරපුර සඳහා පවත්වාගෙන යාමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මහත් කැපවීමකින් යුක්තව කටයුතු කරයි.

**සුභාෂිණී චන්ද්‍රසෝම**
*කාර්මික නිලධාරිනී*
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය*
*බස්නාහිර.*

# පුරා භූ දර්ශණය කළමණාකරණය කිරීම

## ලාංකීය හා ඉන්දියානු සංකල්පීය භාවිතය

ලාංකීය ඉතිහාසයේ දැනට ඉතිරිව ඇති පුරාවිද්‍යාත්මක නටබුන් පරිශ්‍රයන් විමසුමට ලක් කරන විට එම පරිශ්‍රයන් අතීතයේ සිටම මනා භූ දර්ශණ කළමනාකරණයකින් හෙබි බව ප්‍රත්‍යක්ෂ වන කරුණකි. පොළොන්නරුව රාජධානියේ එකල පැවති භූ දර්ශණය පිළිබඳව විමසුමට ලක් කරන සෙනරත් පරණවිතාරණ ශූරින් මෙසේ පවසයි.

**"පරාක්‍රමබාහු මහීපාලනයන් විසින් නියුක්ත කරවන ලද ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් භූමිභාග සැලසුම් කිරීමෙහිලා දක්වන ලද කෘතහස්තභාවය ආලාහන පිරිවෙන නමින් හැඳින්වෙන විස්කෘත වූ ද සංකීර්ණ වූ ද ආශ්‍රම පද්ධතියෙන් පැහැදිලි වේ.**

එදා එහි පොකුණු හා ජල තටාක වල දියෙහි පිළිබිඹු වූ ප්‍රධාන ගොඩනැගිලි වල ඡායාවන් නිසා ජනිත වූ නිශ්චල උපශාන්තභාවය, කඩින්කඩ සිටුවන ලද මල්තුරු නිසා දියුණු තියුණු වන්නට ඇත. එහිම ස්වභාවිකව පිහිටි ගල් කුළු ගොඩනැගිලි පෙළ සැසදි පෑසි සිටින සේ සකස් වූයෙන් , එහි වූ නන් වැදෑරුම් ගොඩනැගිලි ඒවා පිහිටි භූමි භාගයේ පරිසරය නොවෙන් ද, ඊට ගැලපීම සෑදී ගත් බවට නිසැකය...

මෙවැනි නටබුන් පරිශ්‍රයන් තුළින් පවා එලෙස අතීත භූ දර්ශණය සැලසුම් කිරීම පිළිබඳව අද වන තුරුම සාධක ඉතිරිව පවතී නම් එදා එම පරිශ්‍රයන් කෙතරම් අලංකෘතව පැවතී ඇති ද යන්න මනසින් විග්‍රහ කළ හැකි වන්නේය. ලාංකීය පුරාවිද්‍යාත්මක නටඹුන් සහිත පරිශ්‍රයන්හි භූ දර්ශණය කළමණාකරණය කිරීමේදී යොදා ගනු ලබන වර්තමාන සංකල්පය වනුයේ

"නටඹුන් සහිත ප්‍රදේශය සඳහා අවම මැදිහත් වීමකින් යුක්තව පවතින භූ දර්ශණය කළමනාකරණය කිරීමයි "

එහිදී බොහෝ විට පවතින භූ දර්ශණයට ගැළපෙන සේ ප්‍රදේශයට ආවේණික ශාක වර්ගයන් සිටුවනු ලබනු අතර විශාල ගස් අතර තණකොල වවා ඒවා නියමිත පරිදි කපා නඩත්තු කරනු ලැබේ. පෙත් මං හා ප්‍රවේශ මාර්ග ස්වාභාවිකත්වයට හා පරිසරයට ගැලපෙන අයුරින් ගල් , වැලි හෝ බොරළු යොදා ගනිමින් සකසනු ලබයි. මෙහිදී ප්‍රවිශ්ට මාර්ග දෙපස මල් වැටි දැමීමක් හෝ එම පරිශ්‍ර තුල මල් වැවීමක් සිදුකරනු නොලැබේ. මෙම අවම මැදිහත්වීම නිසා එම පරිශ්‍ර පරිසරයේම කොටසක් බවට පත්කරනු ලබයි.

නමුත් ඉන්දියානු භූ දර්ශණය කළමනාකරණය පිළිබඳ සලකා බැලීමේදී ඔවුන් අනුගමනය කරනු ලබන සංකල්පය වෙනස් බව පෙනේ. නටබුන් සහිත පරිශ්‍රයන්හි ස්වාභාවික භූ දර්ශණයට මැදිහත් වීම තුළින් නවතාවයක් ඇති කිරීමට උත්සහ කරනු ලබන බව පෙනේ. ස්මාරක සහිත පරිශ්‍රයන් හි ප්‍රවේශ මංපෙත් වල හා එයට අදාල භූමිය සඳහා උද්‍යාන අලංකරණය "LAND SCAPING" කිරීමට උත්සුක වී ඇති බව පෙනේ. එමගින් ලාංකීය අවම මැදිහත් වීම යන සංකල්පය තුළින් මිදී මැදිහත් වීම තුලින් භූ දර්ශණයට නවතාවයක් ඇතිකිරීම යන සංකල්පය මත පිහිටා ඇති බව පෙනේ.

බොහෝවිට ලාංකීය පුරාවිද්‍යා භූමි පරිශ්‍රයන් උදා : රිටිගල, රජගල, අරන්කැලේ, භාවනානු ශ්‍රමණයන් සඳහා නිර්මාණය කරන ලද පරිශ්‍රයන් තුලින් - නිවන සාක්ෂාත් කර ගැනීම සඳහා පරිසරය සකස් කිරීම යන සංකල්පය තුල ගොඩ නැගී ඇත. එවැනි පරිශ්‍රයන් සඳහා අවම මැදිහත් වීම යන සංකල්පය ඉතා හොඳින් ගැළපෙන අතර එමගින් එම නටබුන් ප්‍රදේශය එම පරිසරයේම කොටසක් වී ඇති බව පෙනේ.

නමුත් රජමාලිගා සහ උද්‍යාන නටබුන් සහිත ප්‍රදේශය සඳහා ඉන්දියානු සංකල්පය යොදා ගත හැකි බව ද පෙනේ. උදා- ඇතුල්නුවර විජයබා



රිටිගල ප්‍රවේශ මාර්ගය පරිසරයේ ම කොටසක් වී ඇති අයුරු

මාලිගා පරිශ්‍රය මෙහි බැම් මත ගවයින් හා මිනිසුන් ඇවිදීම නිසා විනාශ වීමට ඇති ප්‍රවණතාවය ඉන්දියානු ක්‍රමවේදය භාවිතා කලේ නම් -"මල්වැටි යෙදීම , උද්‍යාන අලංකරණය කිරීම" වඩාත් යෝග්‍ය වනු ඇත.

"පුරාවිද්‍යාඥයා සාමාන්‍යයෙන් භූ දර්ශණය පිළිබඳ සංකල්පයකින් පාරිසරික නියතිවාදි කෝණයකින් පහල වේ.) එහෙත් ඔහු සංස්කෘතික භූ දර්ශණය පිළිබඳ සංකල්පය තුළින් සියලු දෙනාම වර්තමාන භූ දර්ශණය සිතීම පිළිබඳ පොළඹවයි. ......." (අභයවර්ධන 2007)




විජයබා මාලිගා පරිශ්‍රය (මෙය ඉන්දියානු සංකල්පය යොදාගත හැකි පරිශ්‍රයකි)

ඒ අනුව මෙම සංකල්පයන් ලාංකීය පුරා භූ දර්ශණ කළමනාකරණයට යොදා ගැනීම පිළිබඳව තවදුරටත් ලාංකීය පුරාවිද්‍යාඥයන් උරුම කළමනාකරුවන් හා වාස්තු විද්‍යාඥයන් අතර කතිකාවට බඳුන් කළ යුතු සංකල්පයක් බව පෙනේ.



ඉන්දියානු භූ දර්ශණය කළමනාකරණය කරන ආකාරය

**වරුණි ජයතිලක**
අධ්‍යක්ෂ (නඩත්තු)
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

# කොළඹ නුවර මාර්ගය යා කළ පේරාදෙණියේ දැව ආරුක්කු පාලම

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ ඇති වූ මහා මාර්ග සංවර්ධනය සහ ව්‍යාප්තිය දිවයිනේ සමාජ, ආර්ථික, දේශපාලනික සංස්ථාවන් කෙරේ කැපී පෙනෙන බලපෑමක් ඇතිකරලීමට හේතු වූ සාධකයක් විය. ක්‍රි. ව. 1815 ඉංග්‍රීසීන් කොළඹ නුවර මාර්ගය යා කළ පේරාදෙණියේ දැව ආරුක්කු පාලම කන්ද උඩරට යටත්කර ගැනීමත් සමඟ, එතෙක් අති දුෂ්කරතා මධ්‍යයේ පවත්වාගෙන ආ වෙළඳ කටයුතු, පාලන අධිකාරිත්වයේ බලය තහවුරු කරගැනීමේ අභිප්‍රායන් මෙන්ම බ්‍රිතාන්‍යවාදී ආකල්ප සහ සමාජයීය සංස්කෘතික සන්ධර්භය දේශීයකරණය කරලීමේ ප්‍රයත්නයන් වඩා පහසුවෙන් ඉදිරියට ක්‍රියාත්මක කරලීමෙහිලා මාර්ග පද්ධතිය සංවර්ධනය කෙරේ ඔවුන්ගේ අවධානය යොමුකර වූ කාරණාවන් වූ බව පැහැදිලිව ම හඳුනාගත හැකි ය.

දීප ව්‍යාප්ත මට්ටමින් දිවයිනේ ක්ෂේත්‍ර ගණනාවක් ඉලක්කකර ගනිමින් මෙකී අතිශය පුළුල්, සංකීර්ණ සහ දුෂ්කර වූ මාර්ග සංවර්ධන ක්‍රියාදාමයේ නියමුවානන් ලෙස ශ්‍රීමත් එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා කටයුතු කර ඇති අතර ඒ සඳහා ජෝන් ෆ්‍රෙසර්, තෝමස් ස්කිනර් සහ කැප්ටන්ඩෝසන් යන අයගේ සහය ඔහු වෙත ලැබී ඇත.

සිය පාලනය සඳහා අලුතින් ආඳාගනු ලැබූ කන්ද උඩරට රාජධානිය ඔවුන්ගේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වූ කොළඹ හා පහසුවෙන් සම්බන්ධ කළ හැකිවන පරිදි, කඳුකර ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කෙරේ ප්‍රමුඛ අවධානය යොමුකර ඇත. මෙහිදී ක්‍රි.ව. දහසය වන සියවසයේ සිට කන්දේ නුවර හෙවත් ශ්‍රේෂ්ඨ මහනුවර මාවත (The Great Kandy Road) නමින් හඳුන්වන්ට යෙදුණු කොළඹ - නුවර මාර්ගය සංවර්ධනය, කඩිනම් කිරීම කෙරෙහි අවධානය යොමුකර ඇත. කොළඹ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයෙන් ආරම්භ ව අඹතලේ, කඩුවෙල, නවගමුව, හංවැල්ල, කොස්ගම, පුවක්පිටිය, අවිස්සාවේල්ල, සීතාවක, තල්දූව, ඉපල්පිටිය, නිකවලමුල්ල, රුවන්වැල්ල, අඟුරුවැල්ල, කන්නන්තොට, කොටියාකුඹුර, කුරුනෑගොඩ, පින්දෙණිය, ඉද්දමල්පාන, ඇතුගල, තලවේල, දිවල, පතනගහ, අට්ටාපිටිය, බලන දුර්ගය, අමුණුපුර, දොඩන්වල, ගන්නෝරුව හරහා මහනුවර තෙක් සැතපුම් 85ක් දුර එකී පැරණි මාර්ගය එඩ්වඩ් බ්‍රවුන් විසින් (1824-1831) කැලණිය, මහර, කඩවත, පස්යාල, වරකාපොළ, අඹේපුස්ස, තෝලන්ගමුව, කෑගල්ල, මාවනැල්ල, කඩුගන්නාව, බලන, ගන්නෝරුව ඔස්සේ මහනුවර දක්වා සැතපුම් 72ක් දුර (72 සැතපුම් කණුව මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ මහමළුවට ඇතුල් වන වාහල්කඩට දකුණු පසින් වැව් ඉවුරට සමීපව ඉදිකර ඇත) අලුත් මාර්ගය ඉදිකරන ලදී. එම මාර්ගය දියුණු ශිල්පක්‍රම උපයෝගීකර ගනිමින් බර කරත්ත ගමනාගමනයට සුදුසු ලෙස ශක්තිමත් පාලම් 6ක් ද සහිත ව ඉදිකර ඇත. ඒ අතරින් ග්‍රෑන්ඩ්පාස් අසළ කැලණි ගඟ හරහා අඩි 800ක් දිග පාලම්පාරුව, මාවනැල්ල පාලම සහ පේරාදෙණිය පාලම සුවිශේෂී වේ.

ප්‍රස්තුත අධ්‍යයනය සඳහා අවධානය යොමු කරනු ලබන පේරාදෙණිය පාලම බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යා තාක්ෂණයේ නිපුණතාවය විද්‍යමාන කෙරෙන නිදර්ශකයක් වශයෙන් හඳුනාගත හැකි ය. මෙහි නෂ්ටාවශේෂ අද දක්නට නොමැති වුව ද ඒ පිළිබඳ ලබිත සාධක ඉදිකිරීම් ආරම්භයේ සිට අවසානය දක්වා සහ වත්මන් පාලම ඉදිකිරීම් අවස්ථාව දක්වා Public Work Department(PWD) වාර්තාවල සඳහන්වේ. ශ්‍රීමත් එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයාගේ සැලැස්මට අනුව මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු, එවකට රජයේ ඉංජිනේරුවරයෙකු ව සිටි 37වන රෙජිමේන්තුවේ ලුතිනන් ජනරාල් ජෝන් ෆ්‍රෙසර් විසින් ඉටුකර ඇත. මාර්ග ඉදිකිරීම් සහ සිතියම් ඇඳීමේ ක්ෂේත්‍රයන්හි නිපුණතාවයකින් හෙබි මොහු විසින් මෙම පාලමේ සැලැස්ම නිර්මාණය කර ඇත. ඒ අනුව 1826 දෙසැම්බර් මාසයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 1933 ඔක්තෝබර් මාසයේ ගමනාගමන කටයුතු සඳහා විවෘත කර ඇත. ඒ සඳහා කම්කරුවන් 1200ක ගේ ශ්‍රමය භාවිත කර ඇත. බ්‍රවුන්ගේ මාර්ග සංවර්ධන ක්‍රියාදාමයේදී උඩරට ආරක්ෂාව වෙනුවෙන් බලකොටු ඉදිකිරීම සඳහා යොදවා සිටි කම්කරුවන්ගේ ශ්‍රමය ලබාගත් බවට ලිඛිත සාධක පවතී. පාලමේ සමස්ත ඉදිකිරීම් සඳහා කහ පැහැති බුරුත දැව උපයෝගි කරගෙන ඇත. සමකාලීන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බහුල වශයෙන් යොදාගෙන ඇති මෙම දැවවල විශේෂත්වය වන්නේ දැඩිබව, කල්පවත්නාබව, දීප්තිමත්බව, තෙතමනයට මෙන්ම වියළි උෂ්ණත්වයට වඩා හොඳින් ඔරොත්තුදීමේ හැකියාව පැවතීම ය. මෙ නිසා වෙන් ම මෙම පාලම 'බුරුත පාලම' , 'දැව ආරුක්කු පාලම' යන නමින් ව්‍යවහාරයට පත් ව ඇත. ඇතැම් වාර්තාවල බුරුත, මිල්ල දැව දෙක ම භාවිත කළ





බව සඳහන් වේ. කෙසේ වෙතත් ඉදිකිරීම් සඳහා උපයෝගිකර ගත් දැව සියල්ල කොළඹ දී අවශ්‍ය ප්‍රමාණයට කපා යතු ගා ප්‍රවාහනය කර ඇත.

බ්‍රවුන්ගේ උපදෙස් පරිදි ගලින් නිමවන ලද දෙපස යා බැම් ආධාරක වශයෙන් උපයෝගිකර ගනිමින් තනි ආරුක්කුවක් සහිත ව නිමවන ලද මෙම පාලමේ දිග අඩි 205ක් හා පළල අඩි 22ක් වේ. ආරුක්කුව සඳහා වක්‍රාකාර ත්‍රිත්ව දැව බාල්ක 4ක් (Trible ribs) හරස් අතට (පාලමේ පළලට) ඒවා මැදින් මැද අඩි 5ක දුරස්තර බාවයකින් යුක්තව පිහිටන පරිදි යා බැම් හා සම්බන්ධ කර ඇත. දැව බාල්ක ත්‍රිත්වය එක්ව ගත් කල උස අඩි 4ක් වන අතර ආරුක්කුව නිර්මාණයේ දී එකිනෙක අතර අඩි 2ක පරතරයක් තබා නිමවීමේදී ත්‍රිත්ව බාල්කයක සමස්ත උස අඩි 8ක් වේ. දැව මුවා මාර්ග පථය සමබරව පිහිටන පරිදි, මෙම ත්‍රිත්ව දැව බාල්ක හතර, තිරස්ව සහ සිරස්ව (ගරාදි වැටක් මෙන්) දැව රීප්ප වලින් සම්බන්ධ කර ඇත. සමස්ත පාලම ඉදිකිරීම්වල දී එකදු යකඩ ඇණයක් හෝ කූඤ්ඤයක් භාවිත නොකර දැව කූඤ්ඤ පමණක් භාවිත කිරීම මෙහි ඇති විශේෂත්වයයි. මේ නිසා පාලම අළුත්වැඩියා කිරීමේදී ගමනාගමනයට බාධාවක් නොවන පරිදි සහ ආරුක්කුවට හානි නොවන පරිදි කොටස් ගලවා ඉවත් කිරීමට සහ වෙනත් කොටස් පිරිද්දීමේ හැකියාව පැවතිණ.

ගඟේ පහළ ජල මට්ටමේ සිට රථ මාර්ගයේ මතුපිට (Road way) දක්වා පාලමේ උස අඩි 67ක් වන අතර ආරුක්කුව යටි පැත්තේ මතුපිට දක්වා උස අඩි 57 1/2ක් වේ. මේ නිසා අධික වර්ෂා කාලවල දී ගඟේ ජල මට්ටමට වඩා හොඳින් ඔරොත්තු දී ඇත. 1834 දී ගඟේ ජල මට්ටම අඩි 60 දක්වා ඉහළ ගිය ද පාලමට කිසිදු හානියක් සිදු වී නොමැත. මාර්ග පථය දෙපස දැව මුවා අත්වැටක් නිමවා ඇත. වත්මන මෙම පාලමේ දෘශ්‍යමාන සාධක කිසිවක් දක්නට නොමැති වුවද එහි ආකෘතියක් ලන්ඩනයේ දකුණු කිංස්ටන් කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. පාලම ඉදිකිරීම් කටයුතු අවසානයෙන් පසු කොළඹ සිට මහනුවර දක්වා මෙම පාලම මතින් ගමන් කළ ප්‍රථම වාහනය වූයේ තැපැල් අශ්ව කෝච්චියයි. මෙම කෝච්චි සේවය දකුණු ආසියාවේ ප්‍රථම තැපැල් අශ්ව කෝච්චිය වීම ද මෙහි ලා සුවිශේෂී වේ.

**නිලන්ති එදිරිසිංහ**
*පුරාවිද්‍යා පර්යේෂණ සහකාර*
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය*
*මහනුවර.*

# දරුවන් වෙනුවෙන් පුරාවිද්‍යාව




ලාංකීය සමාජය එහි ඉතිහාසය හා පුරාවිද්‍යාව සම්බන්ධයෙන් ඉතා සුවිශේෂී විශ්වසනීය, විද්‍යාත්මක දත්ත පද්ධතියක හිමිකරුවෝය. එම වටිනා දත්ත පිළිබඳ අවබෝධය සමාජය වෙත ප්‍රේෂණය වීම ඉතා අල්ප වශයෙන් සිදු වී ඇති බව සමාජ නිරීක්ෂණයේදී පැහැදිලි වේ. මෙයට හේතු කවරේද?

ඕනෑම සමාජයක ඉතිහාසය හා ඓතිහාසික උරුමය සම්බන්ධයෙන් දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම ආරම්භ කළ යුතු වන්නේ සමාජයක අනාගතය ලෙස පිළිගන්නා ළමා සමාජය හෙවත් දරුවන්ගෙනි. ලාංකීය සමාජයේ මෙම තත්ත්වය ඉතා කණගාටුදායක තත්ත්වයක පවතින අතර, මෙහි වගකීම පුරවැසියන් වශයෙන් අපි සැවොම බෙදා ගත යුතුව ඇත. එහෙත් අඳුරට ශාපකිරීමෙන් ආලෝකය උදා නොවන හෙයින් ප්‍රොමිතියස් මෙන් ඉතා දුෂ්කර වෑයමකින් ආලෝකය උදාකර ගත යුතු බැව් පැහැදිලිය.

ලෝක මට්ටමෙන් සැලකීමේදී දරුවන් වෙනුවෙන් පුරාවිද්‍යා දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය පිණිස ගෙන ඇති ක්‍රියාමාර්ග සංක්ෂිප්ත කර බැලීමේදී පහත සඳහන් ක්‍රියාකාරීත්වයන් හඳුනා ගත හැකිය.

1. පුරාවිද්‍යා ක්‍රියාකාරකම් (Archaeology Activities)
2. පුරාවිද්‍යා ළමා සමාජ (Archaeology Clubs)
3. පුරාවිද්‍යා ක්‍රීඩා (Archaeology Games)
4. පුරාවිද්‍යා කාටූන් (Archaeology Cartoons)
5. පුරාවිද්‍යා ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩසටහන් (Archaeology Audio Visual Programs)
6. පුරාවිද්‍යා ඉදිරිපත් කිරීම් (Archaeology Presentations)
7. පුරාවිද්‍යා ළමා පොත් (Archaeology Books)
8. පුරාවිද්‍යා උපකරණ (Archaeology Tools)

මේ අතුරින් ලංකාවේ දරුවන් තුළ පුරා විද්‍යාත්මක දැනුම වර්ධනය පිණිස සැකසුණු වැඩසටහන් ඉතාමත් අල්ප වන අතර, ඒ අතුරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය, පුරාවිද්‍යා කලාප මට්ටමින් සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ගෙයින් ගෙටගොස් පුරවැසියන් දැනුවත් කිරීමත් සිදු කෙරේ. පසුගිය දශකය තුළ ලංකාව පුරා පාසල් පුරාවිද්‍යා සංගම් 1200කට ආසන්න ප්‍රමාණයක් පිහිටුවමින් දරුවන් වෙත ජාතියේ ප්‍රෞඪ උරුමය දෙස පුරාවිද්‍යාත්මක ඇසින් දකින්නට පුහුණු කරන ලදී.



පුරාවිද්‍යා කැණීම් පරිශ්‍රයක පුහුණුව ලබන කුඩාදරුවන්

පසුගිය දශකය තුළ දරුවන් වෙනුවෙන් සකස් වූ වැඩසටහන් පහත ආකාරයට වර්ගීකරණය කළ හැකිය.


1. පාසල් පුරාවිද්‍යා සංගම් පිහිටුවීම.
2. පුරාවිද්‍යා ප්‍රදර්ශන පැවැත්වීම.
3. රූපවාහිනී ගුවන්විදුලි වැඩසටහන්
4. පාසල් ඉතිහාසය විෂය මාලාවේ පුරාවිද්‍යාව සම්බන්ධ තොරතුරු ඇතුලත් කිරීම.

"දැයේ උරුමය දරුවන්ටයි" යන තේමාව යටතේ පුරාවිද්‍යාව සම්බන්ධයෙන් ලංකාව තුළ ප්‍රධාන වගකීම දරණ ආයතනය වශයෙන් පසුගිය දශකය තුළ අවම සම්පත් ප්‍රයෝජනයට ගෙන සිදුකරන ලද සමාජ මෙහෙවර, පුරාවිද්‍යාත්මක දැනුම සමාජගත කරලීමට මනා අඩිතාලමක් සපයා ඇත. නමුත් මෙම ක්‍රියාකාරීත්වයන් මගින් පරිපූර්ණ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනයක් සිදුවීමට ප්‍රමාණවත් නොවේ. මේ සඳහා පුරවැසියන් වශයෙන් සියළු සමාජ කණ්ඩායම් වල වගකීම හා යුතුකම් ඉටුකිරීමට කාලය පැමිණ ඇත.

2016 වසරේදීත් ජුලි 07 වෙනිදාට යෙදෙන ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දිනය නිමිති කර ගනිමින් වැඩසටහන් කිහිපයක් සංවිධානය කර ඇත. ඒ අනුව ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම පාසල් 20 බැගින් තෝරා පුරාවිද්‍යාව, මිථ්‍යාව හා දුර්මත යන මැයෙන් මාතෘකා 15 ක් යටතේ දේශන පැවැත්වීමත්, දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමත් සිදු කෙරේ.

ලංකාවේ දරුවන් වෙනුවෙන් සකස් කෙරෙන වීඩියෝ ක්‍රීඩා, ඉදිරිපත් කිරීම්, කාටූන් ආදී කිසිදු තොරතුරු තාක්ෂණික වැඩසටහන් වර්ගයක දී පුරා විද්‍යාත්මක පදනමක් යොදාගත් අවස්ථාවක් හමු නොවේ. මෙතරම් දියුණු තොරතුරු තාක්ෂණය භාවිත කෙරෙන යුගයක, දරුවන් වෙනුවෙන් විවිධ ආකර්ෂණීය වැඩසටහන් නිර්මාණය වන යුගයක එම වැඩසටහන් හි සංස්කෘතික සම්පත් පිළිබඳ ආකර්ෂණය සඳහා පදනමක් නොතිබීම, ප්‍රෞඪ උරුමයක විශ්වසනීය දත්ත හිමි රටක පුරවැසියන් වශයෙන් අප සියදහස් වර සිතා බැලිය යුතු කරුණකි.

**එල්. එස්. ඒ. ඉන්ද්‍රජිත් පෙරේරා**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර (ප්‍රවර්ධන),
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
අවිස්සාවේල්ල.















**ශ්‍රී ලාංකීය පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ගමන් මග පිරික්සීමේ දී එහි උන්නතිය වෙනුවෙන් සිය කාලය, ශ්‍රමය, ධනය කැප කළ බොහෝ දෙනෙක් සිටිති. මේ වනවිට ඔවුන් අතරින් ඇතැමෙක් මෙලොව හැර ගොසිනි. අපගේ මෙම ව්‍යායාමය නම් පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ අමිල සේවාවක් ඉටුකළ දැනට ජීවතුන් අතර සිටින මිනිසුන් සොයා ගොස් ඔවුන්ගේ තොරතුරු සහ අත්දැකීම් ඔබ සමඟ බෙදා හදා ගැනීමයි.**



**පී. බී. ගජනායක මහතා**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වසර 30කට අධික කාලයක් සේවය කොට මීට වසර ගණනකට පෙරාතුව විශ්‍රාම ගොස් දැනුදු දාගැබ්, බුදුපිළිම, සඳකඩපහන් වැනි නිර්මාණ සම්පාදනය වෙනුවෙන් සිය දායකත්වය සපයන කාර්යශූර නිලධාරියෙකු වූ ගජනායක මහතා හමුවීමට පසුගිය දා ඔහු දැනට ජීවත් වන අනුරාධපුර, 2 වන පියවරේ අංක 623/22 නිවස වෙත ගියෙමු.

**පුරාවිද්‍යා කටයුතුවලට සම්බන්ධ වූයේ කොහොමද?**

1969 වසරේ මම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළා. ඊට පෙර මම රාජකාරී කරමින් සිටියේ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ. එම ආයතනය 69 වසරේ විසුරුවා හැරියා. ආයතනයේ සේවකයින් විවිධ රාජ්‍ය ආයතන වෙත අනුයුක්ත කරනු ලැබුවා. ඒ අනුව මම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පැමිණි අතර මුලින්ම මිහින්තලේ වැඩබිම වෙත යවනු ලැබුවා. එවකට පුරාවිද්‍යා කොමසාරිස් ලෙස කටයුතු කළේ ආචාර්ය රාජා ද සිල්වා මහතා. පුරාවිද්‍යා සේවයට නවකයින් ලෙස බැඳුණු අපිට එතුමන්ගේ උපදෙස් පරිදි සැලසුම් ඇඳීම, ඡායාරූපකරණය, සංරක්ෂණ විධික්‍රම පිළිබඳ වසරක පුහුණුවක් ලබා දුන්නා. එම පුහුණුවෙන් අනතුරුව යළි මිහින්තලේ රාජකාරී කටයුතු සඳහා පැමිණියා. එතැන් සිට වසර 30කට වැඩි කාලයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විවිධ ස්ථානයන්හි සේවය කළා.

**ඔබගේ සේවා කාලය තුළ විශේෂ වශයෙන් කටයුතු කිරීමට ලැබුණු සේවා ස්ථාන මොනවාද?**


පුරාවිද්‍යා පරිපාලක හැටියට ඇරඹුණු මාගේ වෘත්තීය ජීවිතය වැඩිම කාලයක් ගත කළේ උතුරු මැද පළාතේ අනුරාධපුර, මිහින්තලේ කේන්ද්‍ර කර ගනිමින්. එයින් විශේෂයෙන්ම මිහින්තලේ කළුදිය පොකුණ, නාග පොකුණ ආදිය සංරක්ෂණය කිරීමට ලැබීම විශේෂයි. පසුකලෙක සංස්කෘතික ඇමතිවරයා වූ හුරුල්ලේ මැතිතුමා විසින් පුරාවිද්‍යා කටයුතු පහසු කිරීම සඳහා උතුරු මැද පළාත දිස්ත්‍රික්කවලට කැඩුවා. ත්‍රිකුණාමලය, මඩකලපුව, පොළොන්නරුව ආදි දිස්ත්‍රික්ක උතුරු මැදට අයිතිව තිබුණා. සීගිරියත්, යාපනයත් එම පළාතටම අයත්ව තිබුණා. මේ බෙදිල්ලෙන් පසුව මට කවය භාර නිලධාරී යන තනතුර ලැබුණා. ඒ අනුව මට බොහෝ කාලයක් ත්‍රිකුණාමල කවය භාරවත්, පොළොන්නරුව, සීගිරිය, අනුරාධපුර කවය භාර නිලධාරී හැටියටත් කටයුතු කිරීමට ලැබුණා. ඒ අතුරින් මට බොහෝ කාලයක් විල්ගම් වෙහෙර, තිරියාය වැනි ස්ථානවල කටයුතු කිරීමට ලැබුණා. එම ස්ථානයන්හි ගවේෂණ, සංරක්ෂණ කටයුතුවලට සම්බන්ධ වුණා. යාපනයේ ගවේෂණ කටයුතුවලටත් සම්බන්ධ වුණා. ආචාර්ය රෝලන්ඩ් සිල්වා කොමසාරිස්ව සිටි කාලයේ මගේ රාජකාරී කටයුතු සිදුකෙරුණේ අවුකන බුදුපිළිම පරිශ්‍රයේ. ඓතිහාසික අවුකන බුදුපිළිමයට ආවරණයක් සකස් කිරීමේ කටයුතු මම ඇතුළු කාර්ය මණ්ඩලයට පැවරී තිබුණා. තනිකර ගඩොලින් සකස් කෙරුණු එම ආවරණය පසුකලෙක කඩා ඉවත් කෙරුණා. කොළඹ පැවති පුරාවිද්‍යාඥයින්ගෙන් සැදුම්ලත් විද්වත් කමිටුවක් මගින් ගත් තීරණයක් අනුව එසේ කැඩීමට තීරණය වූ බවයි කියැවුණේ.

සංස්කෘතික ත්‍රිකෝණය ආරම්භ වීමත් සමග අභයගිරිය හා ජේතවන ව්‍යාපාර සඳහා මාවත් අනුයුක්ත කළා. පසුකලෙක එම ව්‍යාපෘතීන්හි කළමනාකරු බවට ද පත්වුණා. මම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගියේ වැඩ අධිකාරී ලෙසයි.

**ඔබ ලංකාවේ බොහෝ පුරාවිද්‍යා කොමසාරිස්වරු පිරිසක් යටතේ සේවය කළ කෙනෙක්.**

ආචාර්ය රාජා ද සිල්වා, ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න, එච්. එම්. සිරිසෝම, ආචාර්ය රෝලන්ඩ් සිල්වා, ආචාර්ය සිරාන් දැරණියගල, ආචාර්ය ඩබ්. එච්. විජේපාල වැනි පුරාවිද්‍යා කොමසාරිස්වරු යටතේ මට කටයුතු කිරීමට ලැබුණා. වර්තමාන පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහතා මම විශ්‍රාම ගිහිල්ලා සිටින අවස්ථාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයට යොදවා ගත්තා. ඒ අනුව වසර දෙකකට වැඩි කාලයක් මිහින්තලේ ඉදිකටුසෑය, මිහින්තලේ පොකුණු තහවුරු කිරීමේ කටයුතුවල නියැලුණා.

31 පිටුවට.....



**ඔබගේ රාජකාරි ජීවිතයේ දී අමතක නොවන සිද්ධි මොනවා හරි තිබෙනවාද?**

ලංකාවේ ත්‍රස්තවාදී උවදුර ඉතාම දරුණු තත්ත්වයකට පත්වෙලා තිබුණු අවධියේ අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ත්‍රස්තවාදීන් දරුණු වෙඩි ප්‍රහාරයක් එල්ල කළා. ඒ දවස්වල මම අභයගිරියේ රාජකාරි කරමින් සිටියේ. අභයගිරියේ රාජකාරි කටයුතු කළාට නිතරම ශ්‍රී මහා බෝධිය අසළ පිහිටි පුරාවිද්‍යා සංචාරක බංගලාවට එනවා යනවා. ත්‍රස්තවාදී ප්‍රහාරය එල්ල වූ දිනයේත් මම පුරාවිද්‍යා සංචාරක බංගලාවට එමින් සිටියේ. මම ඒ අසළට එනවිට මිනිස්සු කෑ කෝ ගසමින් සී සීකඩ දුවමින් සිටියා. මම ඉක්මණින් සංචාරක බංගලාවට දිව ගියා. ඒ යනවිට සංචාරක බංගලාවේ දොරටුව අසළ දෙදෙනෙකු වෙඩි වැදී ලේ පෙරමින් බිම වැටී සිටියා.

ඔවුන් දෙදෙනා අපේ දෙපාර්තමේන්තුවේ සේවය කළ බාස් කෙනෙක් සහ කම්කරුවෙක්. මම ඉතා ඉක්මණින් වාහනයක් ගෙන්වා ගෙන ඔවුන් රෝහලට රැගෙන ගියා. ඔවුන් එහිදී මිය ගියා. මේක මගේ රාජකාරි ජීවිතයේ කවදාවත් අමතක නොවන සිද්ධියක්. එමෙන්ම තව සිද්ධියක් තියෙනවා. මම බාස්උන්නැහේලා, කම්කරුවන් යොදවා ගෙන ඇත්වෙහෙර කඳුපාමුල බුදුගේ තහවුරු කිරීමක් කරමින් සිටියා. දිනක් පරණවිතාන මහතා එම ස්ථානයට පැමිණියා. අපි අඩි 32ක් පමණ කැණීම් කරන ගමන් තහවුරු කිරීමකුත් කරමින් සිටියේ. එතුමා කිව්වා අපි කරන වැඩේ වැරදියි. පිකැස් එකක් අතට ගත් පරණවිතාන මහතා කිසියම් තැනක් පෙන්වා කැණීම් කරන ලෙස උපදෙස් දුන්නා. ඒ අනුව ටික වේලාවකින් තහවුරු කිරීමට සුදුසු නිවැරදිම දත්ත ලැබුණා. පරණවිතාන මහතා අපි විසින් තහවුරු කළ අඩි 32කම කඩා ඉවත් කර නිවැරදිව තහවුරු කිරීමකට යන ලෙස කිවුවා. එවිට මම ඔහුගෙන් ඇසුවා “සර් අපිට නැවත තහවුරු කිරීමකට යන්න ඇස්තමේන්තුවල අවුලක් ඇති වෙනවා....” නේද කියලා. එවිට පරණවිතාන මහතාගේ පිළිතුර වුණේ, “පුරාවිද්‍යාවට ඇස්තමේන්තුවලින් ඇති වැඩක් නැහැ ......” යන්නයි.

**ඔබගේ සේවා කාලය තුළ කිසියම් ඇගයීමක්, සම්මානයක් ලැබී තිබෙනවාද?**

සිය ජීවිත කාලය තුළ පුරාවිද්‍යාවට කළ කැපකිරීම වෙනුවෙන් පිදෙන උපහාරය වූ පුරාවිද්‍යාසූරි සම්මානය ලැබී තිබෙනවා. ඒ 1999 වසරේ. එවකට ජනාධිපතිනිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය අතින්.

**ඔබගේ පවුලේ විස්තර කොහොමද?**

බිරිඳ, දරුවෝ හතර දෙනයි. ලොකු පුතා යුධ හමුදාවේ, දෙවැනි පුතා වෛද්‍යවරයෙක්, තුන්වැනි පුතා මෘදුකාංග ආයතනයක කළමනාකරුවෙක්, බාලම දුව මේ දිනවල ඇමරිකාවේ.

**රැකියාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව මොකද කරන්නේ?**

ලංකාවේ විවිධ පළාත්වල විහාරස්ථානවල අලුතින් දාගැබ්, සඳකඩ පහන්, මූර්ති නිර්මාණයට ආරාධනා ලැබුණා. මේ වනවිට එවැනි විශාල, මධ්‍යම ප්‍රමාණයේ, කුඩා දාගැබ් 16ක් පමණ අවසන් කර තිබෙනවා. පළමු දාගැබ ඉදිකළේ යාපනයේ පලාලි යුධ හමුදා කඳවුරේ.

**අවසන් වශයෙන් යමක් සඳහන් කළොත්**

රාජකාරිය හරියටම කරන ගමන් විනෝදයෙන් ජීවත්වුණා. කෑවා බීවා. දැන් ටිකක් අසනීපයෙන් සිටින්නේ. ජීවිතය සැහැල්ලුවෙන් ගෙවනවා.

**සටහන**
**සුනිල් බණ්ඩාර කෝරළගේ**

# පරිත්‍යාගශීලීන් පිරිසකගේ මූලිකත්වයෙන් ඓතිහාසික පුළුකුණාව සංරක්ෂණයට අඩිතාලම දැමේ.......

2014 “දායාද” පුරා විද්‍යා පුවත් අටුවාවේ “හඳුන්වාදෙන උරුමය” තීරුවෙන් සාකච්ඡා කෙරුණේ අම්පාර දිස්ත්‍රික්කයේ පුළුකුණාව පුරාවිද්‍යා භූමිය පිළිබඳවය. පිටපත් දසදහසක් මුද්‍රණය කෙරෙන මෙම සඟරාව ලංකාව පුරා බෙදා හැරේ. ඒ අනුව මාර්ග නිර්මාණ හා සංවර්ධන (පුද්) සමාගමේ හිටපු සේවක මහත්ම මහත්මීන්ගේ සංවර්ධන සංගමය මධ්‍යම කලාපය වෙත මෙම සඟරාවේ පිටපතක් ලැබෙන්නේ අහම්බෙනි. මනරම් පරිසරයක පිහිටි ඓතිහාසික පුළුකුණාව පිළිබඳ ලේඛනය ඔවුනගේ සිත් ඇද බැඳ තබා ගනී. ඒ අනුව එම සංවිධානයේ අශෝක ජයවර්ධන මහතා ප්‍රමුඛ පිරිසක් මෙම ඓතිහාසික පුළුකුණාව පුරා විද්‍යා බිම්කඩ, ස්වේච්ඡාවෙන් සංරක්ෂණය කිරීමට ඉදිරිපත් විය. ඒ අනුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ණ අනුමැතිය ලබාගෙන මූලික නිරීක්ෂණ කටයුතු අවසන් කොට මූලිකවම යටිතල පහසුකම් සලසා ගැනීමේ කටයුතු අරඹා තිබේ.

ඒ අනුව 2015 වසරේ අග භාගයේ දී එම ස්ථානයේ රැඳී සිටින ගරු භික්ෂූන් වහන්සේලාගේ සහ සිවිල් ආරක්ෂක සහ පොලිස් ආරක්ෂක නිලධාරීන්ගේ ද විශේෂයෙන් වන්දනාවේ පැමිණෙන බැතිමතුන්ගේ ද ප්‍රයෝජනය සඳහා නළ ළිං මගින් අවශ්‍ය ජලය සපයා ගැණුනි. මීට අමතරව මෙම ස්ථානය නැරඹීමට පැමිණෙන බැතිමතුන්ට වැඳ පුදා ගැනීමට ශ්‍රී මහා බෝධි අංකුරක් පසුගියදා රෝපණය කෙරුණි. එම සංවිධානයේ සෘජු මැදිහත්වීමෙන් එම ස්ථානයට අත්‍යාවශ්‍යව තිබූ ජලය, විදුලිය ලබාගත් අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු ලද විගස පුළුකුණාව ආසනඝරය සංරක්ෂණයට සූදානමින් සිටී.





# සේරුනුවර දෙහිවත්ත පැරණි ස්තූපයේ කැණීම්

මහවැලි ගංගා නිම්නයේ ඉදිකර තිබූ මෙම ස්තූපය ඝන කැලෑවෙන් සහ තෘණ ශාකවලින් වැසී තිබූ අතර නිරන්තරයෙන් නිදන් හොරුන්ගේ ග්‍රහනයට නතුවී තිබීම ස්තූප මධ්‍යයේ හා ඊසාන දිගින් ගැඹුරට හාරා ඇති වළවල් දෙකින් ප්‍රදර්ශනය කරයි. පටු අරමුණු හා ධන ලෝභිත්වය වෙනුවෙන් අපේ උරුමය විනාශ කළ මොවුන් උරුමය ආරක්ෂා කිරීමට කැපවී සිටින අපට ඉතිරි කර ඇත්තේ ගඩොල් සහ ශෛලමය අවශේෂයන් පමණි. එසේ වුවත් අප නිලධාරීන්ගේ අගනා කැපවීම මත ඉතා වැදගත් ඓතිහාසික තොරතුරු රාශියක් අනාවරණය කර ගැනීමට හැකිවීම අප ලද භාග්‍යක් කොට සලකමු.

දෙහිවත්ත සිරිවඩ්ඪන රජමහා විහාරයේ ස්තූප ගොඩැල්ල කැණීම් කිරීමෙන් පසු දත්ත විශාල ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට හැකිවිය. එහි ප්‍රධාන අංග දෙක වශයෙන් පැහැදිළි කිරීමට හැකි වන්නේ ස්තූපය සහ ඒ වටා නිර්මාණය කළ ප්‍රාකාර බැම්මයි.

ස්තූපය හරහා සීමිත පර්යේෂණ කැණීම් අගලක් දියත් කිරීමෙන් පසු අනාවරණය වූයේ මෙම ස්තූපය අවධි තුනක දී නිර්මාණය කර ඇති බවකි. එනම් මුල් ස්තූපය ඉදිකිරීමෙන් අනතුරුව පසු කාලීන අවධි දෙකක දී ප්‍රතිසංස්කරණය කර ඇත. අතීත රජවරුන් ස්තූප ප්‍රතිසංස්කරණයේ දී 'කඤ්චුක' ඉදිකිරීම නම් ක්‍රමවේදයක් භාවිතා කළ බව වංශකතාවල සඳහන් වෙයි. එම සඳහන අනුව 'කඤ්චුක' ඉදිකිරීමේ දී ශිලා (ශෛලමය), ඉට්ඨක (ගඩොල්), හේම (රන්) යන මාධ්‍ය තුනක් භාවිතා කර ඇත. මෙයින් අදහස් කරන්නේ ගරාවැටුණු ස්තූපය වටා ඉහත සඳහන් මාධ්‍යයක් භාවිතා කර නැවත ස්තූපය විශාල කර ගොඩනැගීමයි. එහි දී සමකාලීන වාස්තු විද්‍යාත්මක අංග හා ආකෘතීන් යෙදීම සිදුවී ඇත. එමෙන්ම භාවිතා කරනු ලබන ගඩොල්වල ප්‍රමාණයන්, බදාම වල සංයුතීන් ද වෙනස් වී ඇත. මේ තත්වයන් අනුව මෙම ස්තූපයේ මුල් ස්තූපයට පිටතින් ගඩොල් කඤ්චුක දෙකක් නිර්මාණය කර ඇත. මෙවැනි කඤ්චුක කිහිපයක් යොදන ලද ස්තූප විශාල ප්‍රමාණයක් මේ වන විට කැණීම් කර අනාවරණය කර තිබේ. කෙසේ වෙතත් මෙම ස්තූපය ඉදිකිරීම සඳහාම වෙන්වූ විශේෂිත පරිමාණයෙන් යුත් ගඩොල් නිෂ්පාදනය කරගෙන ඇති බව පැහැදිළි අනාවරණයකි. එනම් පේසා වළලුවල, ගර්භයේ, සතරැස් කොටුවේ සහ කොත් කැරැල්ලේ ප්‍රමාණයන් අනුව ගඩොල් වෙනස් වන අතර ඒවා සුළු වශයෙන් කවාකාර ස්වරූපයක් ගනී.

කැණීම් අතරතුර ස්තූපයේ ගරා වැටුණු ගඩොල් ඉවත් කිරීමේ දී අක්ෂර හා සංකේත කොටන ලද ගඩොල් විශාල ප්‍රමාණයක් වාර්තා කර ගැනීමට හැකි විය. එම අක්ෂර සහ සංකේතවල පරිණාමීය ගතිලක්ෂණ විශ්ලේෂණය කිරීමෙන් මෙම ස්තූපය ඉදිකළ මුල් අවධිය සහ ප්‍රතිසංස්කරණ අවධි පිළිබඳව සාපේක්ෂ දින නිර්ණ උපකල්පනය කිරීමට හැකියාව ලැබී තිබේ.

මුලින්ම ඉදිකළ ස්තූපයට අයත් ගඩොල්වල කොටා ඇති අක්ෂර සහ සංකේත ගැලපීමේ දී ඒවා මුල් බ්‍රාහ්මී අක්ෂරවලට සමාන වන නිසා අඩුම තරමින් ක්‍රිස්තු පූර්ව 2 වන සියවස දී පමණ පළමු ස්තූපය ඉදිකරන්නට ඇති බව විස්වාස කළ හැකිය. ඒ අනුව ධාතු වංශයේ එන ගෝඨාභය රජතුමා පිළිබඳ විස්තර ඇතුළත් යුගයට සමකාලීන වෙයි. අෂ්ඨාකාර වේදිකාවක් මත ඉදිකර ඇති මෙම ස්තූපයේ විෂ්කම්භය මීටර 10 ක් පමණ වෙයි. පේසාවළලු දෙකකට මැදිව බොරදම් කිහිපයක් පිහිටන සේ නිර්මාණය කර ඇති මෙම ස්තූපයේ ගඩොල් අතර කුස්තූරය මිලිමීටර 1 ක් පමණ වන හෙයින් ගඩොල් බැඳීම සඳහා සියුම් බදාම සාන්ද්‍රණයක් භාවිතා කර ඇත.

ඊට පිටතින් විශාල කර ගොඩනගා ඇති දෙවන ස්තූපය ඉතා ගැඹුරක සිට ඉදිකරන ලද රවුම් පාදමක් මත ගොඩනගා ඇත. අක්ෂර පරිණාමීය ලක්ෂණ අනුව මෙම ඉදිකිරීම ක්‍රිස්තු වර්ෂ 6, 7, 8 සියවස් වලට අයත් බව දැනට අනුමාන කළ හැකිය. එහි විෂ්කම්භය මීටර 13 ක් පමණ වෙයි. පේසාවළලු පැහැදිළිව හඳුනා ගැනීම නොහැකි නමුත් අඟලක පමණ ඝනකමකින් යුත් හුණු මිශ්‍රිත බදාමයකින් මෙම ස්තූපය කපරාරු කර ඇති බව පැහැදිළිය.

ඊටත් පිටතින් ඉදිකර ඇති තෙවන ස්තූපය අක්ෂර පරිණාමය අනුව ක්‍රිස්තු වර්ෂ 10, 11, 12 සියවස් වලට අයත් බව අනුමාන කළ හැකිය. එහි ශක්තිමත් පාදමක් ඉදිකර නොමැති හෙයින් තරමක් ගිලා බැස ඇත. නමුත් ඉතා අලංකාර බොරදම් සහිත පේසාවළලු දෙකකින් සමන්විතය. මෙම ස්තූපයේ විෂ්කමභය මීටර 16 ක් පමණ විශාලය. කෙසේ වෙතත් උපරිභාගය ගරාවැටී ඇත. මෙහි ගර්භයේ මධ්‍යය මුල් ස්තූප දෙක ගරාවැටීමෙන් කැඩුණු කෑලි ගඩොල් ඇතිරීමෙන් ගොඩනගා ඇත. ධාතු ගර්භය සතරැස් ස්වරූපයක් ගන්නා බව නිධන් හොරුන් විසින් හාරා විනාශ කරන ලද වළෙහි පස් ඉවත් කිරීමෙන් අනාවරණය විය.

කැණීම් අතරතුර දී සැලකිය යුතු පුරාවස්තු ප්‍රමාණයක් අනාවරණය කරගැනීමට හැකිවිය. ඒ අතර මැටි බඳුන් කැබලි රාශියක් වෙයි. එනම් රතු මැටි බඳුන් හා රතු දුඹුරු මැටි බඳුන් වෙයි. ඒවා පාත්‍රා, තැටි, මුට්ටි හා පියන් ආදී වශයෙන් විවිධ ප්‍රමාණයෙන් යුක්ත වෙයි. එමෙන්ම මැටි වලින් නිර්මාන්විත විවිධ කැටයම් ඵලක ද අර්ධ උන්නත මූර්ති කිහිපයක් ද අනාවරණය වී ඇත. ඒ අතර දෙපස බලා සිටින මොල්ලිය සහිත ගවයන් දෙදෙනකු දැක්වෙන අර්ධ උන්නත කැටයම් ඵලකය විශේෂ තැනක් ගනියි. මේවා බොහොමයක් ස්තූපයේ අලංකාරත්වය සඳහා යොදාගෙන තිබෙන්නට ඇත. එමෙන්ම ලෝහ ඇන සහ භාජනයක කැබලි කිහිපයක් ද සක්ක ලෙස භාවිතා කළ උළු කැබලි විශාල ප්‍රමාණයක් හමුවී ඇත.

නැගෙනහිර පළාතට අයත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සේරුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 217, දෙහිවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙහිවත්ත සිරිවඩ්ඪන රජමහා විහාරයේ නටබුන් වී ගිය පුරාණ ස්තූප ගොඩැල්ල කැණීම් කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2016.01.18 දින සිට 2016.03.31 අතර කාලය තුළ ක්‍රියාවට නංවන ලදී. ඒ සඳහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහතාගේ උපදේශකත්වය ද විහාරාධිපති කලවානේ කෝසලතිස්ස හිමියන්ගේ මැදිහත්වීම ද ව්‍යාපාරික උෂාන් අබේවික්‍රම මහතාගේ ධන පරිත්‍යාගය ද නොමඳව ලැබුණි. සහකාර අධ්‍යක්ෂ (කැණීම්) එස්.ඒ.ටී.පී. ප්‍රියන්ත මහතාගේ සහ සහකාර අධ්‍යක්ෂ (ත්‍රිකුණාමලය) ඩබ්.එච්.ඒ සුමනදාස මහතාගේ අධීක්ෂණය, යූ.ඩබ්. කරුණාසේන මහතාගේ සම්බන්ධීකරණය හා ඩබ්. වීරරත්න මහතාගේ ව්‍යාපෘති භාරකාරත්වය මත මෙම කැණීම් කටයුතු ක්‍රියාවට නැංවුනි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ, ශ්‍රී ලංකා යුධහමුදා නිලධාරීන්ගේ, සිවිල් ආරක්ෂක නිලධාරීන්ගේ, සේරුනුවර පොලිස් නිලධාරීන්ගේ සහ දෙහිවත්ත, නීලපොල ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමදායකත්වය මත අනාවරණය කරගත් මෙම ස්තූපය ශ්‍රී ලාංකික ප්‍රෞඪ ඉතිහාසයට එකතු කළ විශිෂ්ට නිර්මාණ0 අතුරින් එකක් බව මනාවට පැහැදිළි කරයි.



කැණීමට පෙර ස්තූප ගොඩැල්ල



කැණීමට පසු ස්තූපය

**සේනක චන්ද්‍ර කුමාර**
*සංවර්ධන නිලධාරී*
*කැණීම් අංශය*
*පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව*

# පුරාවිද්‍යා ස්මාරක ප්‍රකාශයට පත්කෙරේ

ලොව සැම රටකම දිනෙන් දින සිදුවන සමාජ සංකීර්ණතා හමුවේ නිරායාසයෙන් ගොඩනැගෙන බහුවිධ අවශ්‍යතා සුවපහසු ලෙස සපුරා ගැනීමට බොහෝ අය පෙළඹෙති. එම අභිමථාර්ථ හමුවේ තම දේශසීමා භූමි මත ගොඩනැගෙන විවිධ සංවර්ධන කටයුතු, නීති විරෝධී මිනිස් ක්‍රියාකාරකම් මෙන්ම ස්වාභාවික ව්‍යවසන මගින් ද මිහිතලය මත ඉදි වූ බොහෝ දෑ ක්‍රමයෙන් විනාශයට පත්වෙමින් පවතී. සැම රටක්ම තම අනන්‍යතාවය ගොඩනගා ගත් සංස්කෘතික සාධක ද එසේ විනාශයට පත්වෙමින් පවතී. එහිදී ශ්‍රී ලාංකික අභිමානය ගොඩනැගුණු වසර සියදහස් ගණනක් හුදකලා ලෙස පැවත ආ බොහෝ පුරාවිද්‍ය ස්ථාන ද මේ වනවිට අකාරුණික මිනිස් ක්‍රියා පිළිවෙත් මත විනාශ වී ගොසිනි.

මෙම තත්වයන් යම් තරමකින් හෝ පාලනය කර ගැනීම සඳහා ආයතනික මට්ටමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන පුරාවිද්‍යා ස්ථාන රජයේ ගැසට් පත් මගින් ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කිරීම මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට මේ වනතෙක්ම අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.



මේ වනවිට එසේ ප්‍රකාශයට පත්කර නීතිගත කරන ලද ස්මාරක සංඛ්‍යාව දෙදහස ඉක්මවා ඇත. පසු ගිය වසරේ ජූලි මස සිට මේ වනවිට ස්මාරක 194 ක් ප්‍රකාශයට පත්කර ඇත. ඉන් ස්මාරක 67 ක් පැරණි ස්මාරක ලෙසත් ස්මාරක 127 ක් ආරක්ෂිත ස්මාරක ලෙසත් නීතිගතව ඇත. නැගෙනහිර පළතේ අම්පාර දිස්ත්‍රික්කයේ ස්මාරක 71 ක් ද උතුරු පළාතේ ස්මාරක 44 ක් ද මෙයට ඇතුළත් වේ.

මෙම ස්මාරක නීතිගත කිරීමේ ක්‍රමවේදය තුළින් පුරාවස්තුවල ආරක්ෂාව උදෙසා නෛතික ආවරණ සැලසෙන අතර යම් විනාශ කිරීමකදී අධිකරණය මගින් නිශ්චිත දඩුවම් නියම කිරීම ද පහසු කෙරේ. පෞද්ගලික සන්තක භූමි තුළ පවතින පුරාවස්තුවල ආරක්ෂාව උදෙසා ඕනෑම අවස්ථාවක මැදිහත්වීමේ පූර්ණ අයිතිය මෙමගින් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත.

පුරාවිද්‍යා ස්ථාන ප්‍රකාශයට පත්කිරීමේ අරමුණෙන් 2013 වර්ෂයේ දී අම්පාර දිස්ත්‍රික්කයේ ස්ථාන වාර්තාගත කළ අතර මේ වනවිට අප විසින් එම කාර්යය ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව ත්‍රිකුණාමල දිස්ත්‍රික් කාර්යාලය මගින් ලබාගත් ප්‍රතිපාදන මත එම කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය එක්ව තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථාන වාර්තාගත කිරීම් අවසන් කර ඇත. සේරුනුවර ප්‍රාදේශීය ලෙක්ම් කොට්ඨාසයේ ගවේෂණ කටයුතු මේ දිනවලදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**මුතු තෙන්නකෝන්**
ගවේෂණ නිලධාරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

# කැලණි විහාරයේ බිතු සිතුවම් සංරක්ෂණය

කැළණි විහාර ගෙයි සිතුවම් සම්ප්‍රදායන් දෙකකට අයත්ය. එනම් 19 වන සියවසේ සිත්තර සම්ප්‍රදායේ පහත රට ශෛලියට අයත් සිතුවම් සහ අළුත් විහාරයේ හා විහාරයේ අළුත් කොටසේ තිබෙන විසිවන සියවසේ සිතුවම් (සොලියස් මෙන්ඩිස් සිත්තරාගේ සිතුවම්) යනුවෙනි.

පැරණි විහාර ගෙය දිගටි ගර්භ දෙකකින් යුක්ත වන අතර "ඔත් පිළිමගේ" සැතපෙන පිළිම වහන්සේද, වම්පස කුඩා බිත්තියෙහි සැතපෙන පිළිම වහන්සේ අසලින් පිළිම වහන්සේ දෙනමක් ද පිහිටා ඇති අතර දකුණු පස බිත්තියෙහි දේව පිළිම තුනකින් සමන්විතය. (විෂ්ණු, කතරගම, විභීෂණ දේව පිළිම)

මීට වසර කිහිපයකට පෙර මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් මෙම විහාර ගෙය සංරක්ෂණය කර තිබුණද මෙම විහාර ගෙයි වහලය අබලන්ව තිබූ හෙයින් පවතින වර්ෂා ජලය සිතුවම් මත ගලා යෑම සහ සිතුවම් බිත්ති තෙත් වීම නිසා සිතුවම් ස්තර ගැලවී යාම, සිතුවම් ස්තර මත ලවණ තැන්පත් වීම සහ මීට ඉහත දී පහන් හා හඳුන් කූරු දැල්වීම හේතුවෙන් සිතුවම් අධික ලෙස දුර්වර්ණ වී තිබේ.

එසේ හෙයින් 2015 වර්ෂයේ දී ගරු අගමැතිතුමාගේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයේ අනුග්‍රාහකත්වයෙන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ සහකාර අධ්‍යක්ෂ (රසායන)ගේ අධීක්ෂණය යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රසායන සංරක්ෂණ අංශය විසින් මෙහි සිතුවම් සංරක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

සිතුවම් ස්තර ගැලවී විනාශ වී ගිය ස්ථානයන් සංරක්ෂණයේදී, පළමුව ශේෂ වූ ස්තරයන් හි දුර්වල වූ අන්තර් අංශු අතර (Lack of cohension) බන්ධන ශක්තිමත් කිරීමට Japanese Tissues paraloid B 72 2% - 5% යොදා ගන්නා ලදි. දුර්වල වූ අන්තර් ස්තර අතර (Lack of Adhesion) බන්දන ශක්තිමත් කිරිම (Grouting) සිදු කරන ලදි. ශේෂව තිබූ සිතුවම් සංරක්ෂණයෙන් පසු Zho යොදා සකසා ගත් බදාමයෙන් වර්ණ දරණ ස්තරයක් සකසා සිතුවම් ප්‍රතිජ්කීය කරණය සිදු කරන ලදී. ලෝකයේ දැනට භාවිතා කරන ප්‍රමුඛ පෙළ දිය සායම් වර්ගයක් වන Winsor & Newston යොදා ගෙන සිතුවම් ප්‍රතිජ්කීයකරණය සිදු කෙරේ.

**සැකසුම - ආර්. ඒ. ආරියවංශ**
සංරක්ෂණ සහකාර
**සහාය**
**පී. එල්. බී. එරමුදුගොල්ල**
රසායන සංරක්ෂණ අංශය



සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

# පුරාවස්තු ආඥා පනත යටතේ කරනු ලබන වැරදි

අප සමාජය තුළ සිදුවන අපරාධ වැරදි අතුරින් පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කරමින් සිදුකරනු ලබන වැරදි දරුණු ගණයේ අපරාධ වේ. පුරාවස්තු ආඥා පනතේ සෑම වරදක්ම ඇප දෙනු නොලබන වැරදි බව පනතේ 15 (ඇ) වගන්තියේ සඳහන් වේ. මිනී මැරීමක් දරුණු ගණයේ අපරාධයක් වුවත් මහාධිකරණයේ ඇප ලබා ගත හැක. නමුත් පුරාවස්තු ආඥා පනතේ 15 (ඇ) වගන්තිය ප්‍රකාරව පනත උල්ලංඝනය කරන්නන්ට ශ්‍රී ලංකාවේ කිසිම අධිකරණයකින් ඇප ලබා ගත නොහැකි බවට නීතිය දැඩි කර ඇත. පරම්පරාවෙන් පැවතගෙන එන පුරාවස්තුවක් ළඟ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම සහ විකිණීම පුරාවස්තු ආඥා පනත යටතේ වරදක් නොවේ. පුරාවස්තු ආඥා පනත අනුව ශ්‍රී ලංකාවේ තිබෙන චංචල හා නිශ්චල පුරාවස්තු සංරක්ෂණය කොට පවත්වාගෙන යාමේ මූලික වගකීම පැවරී ඇත්තේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවටයි. එමඟින් අපේක්ෂා කරන්නේ එකී පුරාවස්තු තව දුරටත් මතු පරපුරට දැක ගැනීමට අවස්ථාව සැලසීමයි.

පුරාවස්තු ආඥා පනත 1940 වර්ෂයේ දී පනවන ලද විශේෂ පනතකි. ආඥා පනත වගන්ති 49 කින් සමන්විත වන අතර අවස්ථා දෙකක දී සංශෝධනයට ලක් වී ඇත. එකී සංශෝධන 1955 අංක 02 සහ 1998 අංක 24 ලෙසින් හඳුන්වනු ලබති. අවසන් වරට සංශෝධනය වූ 1998 අංක 24 පනත මඟින් පනත උල්ලංඝනය කරන්නන්ට ඇප ලබා දිය නොහැකි බව සඳහන් කර ඇත. තව ද පනතේ 15 (ඇ) වගන්තියට අනුව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකය වැඩිදුර සාධක නොමැතිව බැලූ බැල්මට පෙනෙන සාක්ෂීන් ලෙසට ආවේශ කරගත හැකිය. පනත අනුව බලතල ක්‍රියාත්මක කරන ව්‍යවස්ථාපිත බලධාරියා වන්නේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ය.

ආඥා පනත වගන්ති 49 කින් සමන්විත වන අතර ඉතා සීමිත අවස්ථාවලදී පමණක් සංශෝධනයට ලක් වී ඇත. 2005 අංක 12 දරණ පොදු පනතට පුරාවස්තු ආඥා පනතේ දඩ පිළිබඳ සංශෝදනය ඇතුළත් කර ඇති අතර එකී පනත යටතේ පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කිරීමක දී පැනවිය හැකි උපරිම දඩය රු. 250,000/- කි.

පුරාවස්තු ආඥා පනත යටතේ සිදු කරනු ලබන වැරදි අතුරින් අනවසර කැණීම් කිරීම යන වරද එනම්, සාමාන්‍ය ව්‍යවහාරයේ හඳුන්වනු ලබන "නිදන් හෑරීම" බහුලව දැකිය හැකිය. එවැනි වැරදි සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඔවුන්ට එරෙහිව පුරාවස්තු ආඥා පනතේ 6 වන වගන්තිය උල්ලංඝනය කිරීම හේතු කොට ගෙන 15 (1)යටතේ චෝදනා ගොනු කළ හැකි වන අතර ඒ සඳහා අවම රු. 50,000/- නොඅඩු සහ උපරිමය රු. 250,000/- ක දඩයකට හෝ වසර 02 කට නොඅඩු සහ වසර 05 කට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමක් හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකම පැනවිය හැකිය.

පනතේ 06 වන වගන්තිය මඟින් අවසර ලබා ගෙන පුරාවස්තු සොයා ගැනීම උදෙසා කැණීම් සිදුකළ හැකිවන අතර සොයා ගනු ලබන පුරාවස්තු, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට භාර දීම සිදුකළ යුතුය. එසේ නොකිරීම පනතේ 15 (අ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වන අතර අවම රු. 50,000/- නොඅඩු සහ උපරිමය රු. 250,000/- ක දඩයකට හෝ වසර 02 කට නොඅඩු සහ වසර 05 කට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමක් හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකම පැනවිය හැකිය.

කැණීම සඳහා බලපත්‍රයක් යටතේ නොව අන් ලෙසකින් හමුවන පුරාවස්තු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට භාර දිය යුතු බව පනතේ 14 වන වගන්තියෙහි සඳහන් කර ඇත. ඒ අනුව පුරාවස්තු සොයා ගැනීමේ චේතනාවක් නොවන කැණීම් මේ යටතට අයත් වේ. ගොඩබිම් තුළ සිදු කරන වැසිකිලි වලවල්, ළිං, නිවාස ඉදිකිරීම් සඳහා අත්තිවාරම් කැණීම් ආදියේ දී යම් පුරාවස්තුවක් හමුවුව හොත් ඒවා අහම්බෙන් සොයා ගන්නා ලද පුරාවස්තු බවට පනතේ 14 වන වගන්තිය මඟින් අර්ථ නිරූපණය කරමි. එසේ හමුවන පුරාවස්තු සොයාගත් තැනැත්තා විසින් සාධාරණ කාලයක් තුළ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට භාර දීමට සැලැස්විය යුතුය. එසේ නොකිරීමෙන් පනතේ 15 (ඇ) වගන්තිය අනුව අවම රු. 50,000/- නොඅඩු සහ උපරිමය රු. 250,000/- ක දඩයකට හෝ වසර 02 කට නොඅඩු සහ වසර 05 කට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමක් හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකම පැනවිය හැකිය.

පුරාවස්තු ආඥා පනතේ 47 වන වගන්තිය මඟින් විෂය භාර අමාත්‍ය වරයාට කළින් කළ රෙගුලාසි පැනවීම් බලය ලබා දී ඇත. පනතේ 16 වගන්තිය අනුව යම් ස්මාරකයක්. පැරණි ස්මාරකයක් ලෙසටත්, 18 වගන්තිය අනුව යම් ස්මාරකයක් ආරක්ෂිත ස්මාරකයක් ලෙසටත් ගැසට් මඟින් ප්‍රකාශයට පත්කළ හැක. එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ස්මාරකයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුමැතිය ලබා නොගෙන ප්‍රතිසංස්කරණය කිරීම, අලුත්වැඩියා කිරීම හා අලුතින් කොටසක් එකතු කිරීම ආදිය වරදක් වන අතර පනතේ 32 (අ) වගන්තිය යටතේ අවම රු. 50,000/- නොඅඩු සහ උපරිමය රු. 250,000/- ක දඩයකට හෝ වසර 02 කට නොඅඩු සහ වසර 05 කට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමක් හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකම පැනවිය හැකිය.

විෂය භාර අමාත්‍යවරයා විසින් යම් ස්මාරකයක් සඳහා යාර 400 නීතිය ප්‍රකාශයට පත් කළ පසු ස්මාරකයේ නිශ්චිත දුර ප්‍රමාණයක් ඇතුළත ගොඩනැගිලි ඉදිකිරීම්, පතල් කැණීම්, ගල්කැඩීම හෝ පිපිරවීම් සිදු කිරීමට පෙර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බවට පනතේ 24 වන වගන්තිය හා 1940.12.23 දිනැති අංක 8698 දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති 29 හා 30 රෙගුලාසිවල සඳහන් වේ. එසේ නොකිරීම පනතේ 32 (ආ) වගන්තිය යටතේ අවම රු. 50,000/- නොඅඩු සහ උපරිමය රු. 250,000/- ක දඩයකට හෝ වසර 02 කට නොඅඩු සහ වසර 05 කට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමක් හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකම පැනවිය හැකිය.


පැරණි ස්මාරකයකට හෝ ආරක්ෂිත ස්මාරකයක් හිතාමතාම විකෘති කරන, විරූපී කරන හෝ අයුතු ලෙස වෙනස් කරන හෝ පූජනීය ලෙස හෝ ගෞරවාදරයෙන් සලකනු ලබන යම් තැනැත්තන් පන්තියකගේ ආගමික හැඟීම් රිද්දවන හෝ ප්‍රකෝප කරන සුළු සිදුවීමකට ඉඩ ඇති මේ ක්‍රියාවන් කරන තැනැත්තෙකු පනතේ 31 වගන්තිය යටතේ අවම රු. 50,000/- නොඅඩු සහ උපරිමය රු. 250,000/- ක දඩයකට හෝ වසර 02 කට නොඅඩු සහ වසර 05 කට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමක් හෝ එම දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකම පැනවිය හැකිය.

**නීතිඥ රංජිත් ගමගේ**
සහකාර නීති නිලධාරි,
නීති අංශය,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

# කෝට්ටේ නරපතියන්ගේ ගබඩා ගමේ ඉදිවූ විහාරය

## ලෙවන්ගම ටැම්පිට විහාරය





වරකාපොළ අඟුරුවැල්ල ප්‍රධාන මාර්ගයේ අඟුරුවැල්ලේ සිට කිලෝ මීටර් 5.8 ගියවිට හමුවන තලවත්ත හන්දියෙන් මීටර් 100 ක් පමණ පැමිණි පසු හමුවන කුඹුරුයාය අසල, " ලෙවන්ගම ගම් පියස කෝට්ටේ නරපතියන් යටතේ පාලනය වූ ගබඩා ගමකි. එහි සේවා කටයුතු හා අයබදු ගෙවීම් නිසි පරිදි සිදු කෙරිණ. ඇහැළියගොඩ කුටුම්භයට අයත් වූ වලව්ව අසළ දැනට වලව්වේ පදිංචි තැනැත්තාගේ මුත්තණුවන් වූ වැඩිමහලු දිසාව විසින් ගොඩ නැංවූ විහාරයකි." ඉහත ඡේදය උපුටාගන්නා ලද්දේ එච්. සී. පී. බෙල් මහතාගේ කෑගලු වාර්තාව නම් ග්‍රන්ථයෙන් වන අතර ඔහු 1880 දශකයේ දී පමණමෙම ගම් පියස ද ගවේෂණයට ලක්කල බවක් ඉන් පැහැදිළි ය.

මධ්‍ය කාලීන නුවර යුගය වන විට ශිලා භාවිතයෙන් කරන ලද ඉදිකිරීම් කෙරේ. දක්වන උනන්දුව අඩුවී දැව හා මැටි භාවිතයට හුරුව තිබූ බවට අතීතය සාක්ෂ්‍ය දරයි. ඒ අනුව ගල් තලා මත හෝ ගල් කුළුණු මත විහාරාරාම ඉදිකරන්නට ඔවුන් පෙළඹුන බව නුවර යුගයේ හා ඉන් පසුව බිහිවූ ඓතිහාසික යුගයන්ගේ ඉදිකිරීම් දෙස විමර්ශණාත්මක අවධානයක් යොමු කිරීමෙන් පැහැදිළිය. ඒ අනුව වැඩි වශයෙන්ම මතුපිට පෘෂ්ඨයන් මත චිත්‍ර ඇඳීමේ වැඩි නැඹුරුවක් මෙම කාලයේ දී දක්වා ඇති අතර ඒ සඳහා සුමුදු ලෙසින් සකසන ලද මැටි පෘෂ්ඨයන් භාවිතයට ගෙන ඇත. කෙසේ වෙතත් මැටි භාවිතයේ කල්පැවැත්මට ස්වභාවික උවදුරු කෘමීන්ගේ හානිය, හා ජලයේ බලපෑම් වලින් ආරක්ෂා වීමට ඔවුන්ට විකල්පයන් සොයන්නට සිදුවූහ. ඒ සඳහා ඔවුන්ගේ හොඳම හා එකම විකල්පය ලෙසින් යොදා ගත්තේ ගල් කණු මත ඉදිකරන ලද ගෘහයන් ය. ඒ අනුව මෙලෙස ටැම් මත ඉදිකරන ලද ගෘහයන් ආශ්‍රිත විහාරයන් ටැම්පිටවිහාර ලෙසින් හැඳින්වූහ.

ලෙවන්ගම ටැම්පිට විහාරය ද ගල් ටැම් මත ඉදිකරන ලද විහාරස්ථානයක් වන අතර වර්තමානයේදී ද බෞද්ධ බැතිමතුන්ගේ වන්දනාමානයට පත්වූ ප්‍රසිද්ධ විහාරස්ථානයකි. වර්තමානයේ දී ශ්‍රී සදානන්දාරාම පිරිවෙණ ලෙසින් ප්‍රසිද්ධියට පත් ලෙවන්ගම ටැම්පිට විහාරය ගිහි පැවිදි බොහෝ දෙනෙකුට සිප්සතර කියාදෙන මහගු තෝතැන්නකි. මෙම විහාරස්ථානය එම පරිසරයට ගෙන එන්නේ චමත්කාරජනක දසුනකි.

තරමක් විශාල ගල් කුට්ටි මත දැව කඳන් යොදා, ඒ මතු යලි ලෑලි අසුරා, ඉන් පසුව කණු හිඳුවා, ආලින්දයක් වටා ගමන් කිරීමට හැකිවන සේ, සිංහල උළු සෙවිලි කරන ලද වහලයකින් සමන්විත, වරිච්චි බිත්ති යොදා වැලි මැටි කපරාදු කර, සුදුහුණු පිරියමේ වර්ණ සහිත සිතුවම් ඇඳි වසර 300 කට ආසන්න මෙමෙ ටැම්පිට විහාරය තවමත් නිරුපද්‍රිතව ඇත්තේ අතීත ඉදිකිරීම් තාක්ෂණයේ ඉහළ ප්‍රායෝගික ප්‍රාගුණ්‍ය නිසාවෙනි.

මෙම විහාරය ඉදිකරන්නට යොදාගෙන ඇති දැව කණු හා දැව කඳන් සරල ලෙසින් හතරැස් ආකාරයට කැටයම් රහිතව සකසා යොදා ඇත. වහලයේ පරාල කෙලවර ගොනැස් කපා නොමැත. ලෙවන්ගම ටැම්පිට විහාරයේ විශාලත්වය ගත්කල දිගින් මීටර් 42.672 ක් ද, පළලින් මීටර් 25.908 ක් ද වන අතර, එහි හිඳුවා ඇති ප්‍රථිමාව හිඳි පිළිමයකි. කහ පැහැයෙන් යුතු චීවරයක් සහිතය. එම පිලිමයේ විශාලත්වය පිළිවෙලින් මීටර් 12.192 උස හා මීටර් 10.3632 ක පළලින් යුතුය. සිරස්පතට ඉහලින් මෑතකාලීන පුරාවිද්‍යා සංරක්ෂණයන් සිදුව ඇත. මෙම පිළිම වහන්සේට අමතරව දෙපසින් කහ වර්ණයෙන් වර්ණ ගැන්වූ පිළිම වහන්සේලා තැම්පත් කර තිබේ.

මීට අමතරව තවත් බිත්තියකට ආසන්නයෙන් විශ්ණු දෙවියන්ගේ රුවක් හා ගිහි පුද්ගලයෙකුගේ රුවක් නෙලා ඇත. එම රුව බොහෝ දෙනාගේ මතය වන්නේ ඇහැළියගොඩ නිලමේගේ බවය. එය ජීවමාන ප්‍රමාණයෙන්ම නෙලා තිබීම විශේෂත්වයකි. එම මූර්තීන්ට විරුද්ධ දිසාවෙන් සමන් දෙවියන්ගේ රුව දැකගත හැකිය. වහලය සෑම විටම නෙලුම් මල් මෝස්තරයෙන් සැරසිලි කර තිබේ. මීට අමතරව බිත්ති මත විවිධ ප්‍රමාණ බුදු රූ හා හිමිවරුන්ගේ රුවින් සරසා ඇත. සිතුවම් හා චිත්‍ර සඳහා විවිධ වර්ණයන් භාවිතයට ගෙන ඇත. ඒ අතරින් රතු, නිල්, කළු, හා සුදු ප්‍රධාන වේ. නෙළුම් මල්, පලාපෙති, ලියවැල් වැනි පැරණි සිංහල කලා අංගයන් සෑම විටම එක්කර තිබේ.

අතීතයේ දී විහාරයේ පිටත බිත්ති දෙපස විවිධ සැරසිලිවලින් සිත්තම් ඇඳ තිබේ. ඒ අතර දහම් සොඬ ජාතකය, මහා කණ්ණක ජාතකය, ධර්මපාල ජාතකය ආදී ජාතකයන්ගේ විවිධ අවස්ථාවන් චිත්‍ර මගින් පෙන්වා තිබින. මීට අමතරව විහාරයේ ආලින්දය අවටින්, මල්ලව පොර සටන් ජවනිකා, හංස පූට්ටු, ලියවැල්, පද්ම කොටස්, මෝස්තර, නාරිලතා හා නාග වෘක්ෂ චිත්‍ර තිබූ බවට එච්. සී. පී. බෙල් මහතාගේ කෑගලු වාර්තාව සාක්ෂ්‍ය දරයි. පසුකාලීනව සිදුකල සුදු හුණු පිරියම් මගින් බොහෝ සිතුවම් වැසී ගොස් ය. ඒවා මේ වනවිට පුරාවිද්‍යා රසායන සංරක්ෂණ මගින් තරම ක්දුරට මතුකර ගෙන තිබේ.

ඉදිරි පස පිවිසුම අසල නාග පෙණය සහිත දොරටු පාලයන් පුන්කලසක් දරමින් සිටින සේද, අනෙක් දොරටු පාලයන් මුගුරක් අතින්ගත් අයුරු දිස්වන සේ ද මූර්තිමත් කර ඇත.

ඉහතින් දැක්වූ කලා නිර්මාණයන්ට අමතරව ලෙවන්ගම ටැම්පිට විහාරයේ අතීතයේ බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ හා ආයුධ සහිත යුධ භටයන්ගේ රූපයන් සිත්තම් කර තිබූ බවක් බෙල් වාර්තාවේ සඳහන් ය. එම සිත්තම් බෞද්ධ විහාරයකට කෙතරම් උචිත වන්නේ දැයි සිතා බැලිය යුතු අතර එකල පවතින ලද පරිසර හා දේශපාලනමය මෙන්ම පරිපාලනයන්ගේ බලපෑම් කෙතරම් දුරට ආගමික මධ්‍යස්ථානයන් වෙත පවා එල්ල වී ඇත්ද යන්න මින් බොහෝ පැහැදිලි ය. යම් විටක බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ගම්පතියන්ව සිටි අයට එල්ල වූ හා ඔවුන්ගේ පාලිතයන් තුටු කරවීමට මෙවැනි සිතුවම් විහාරස්ථානයන්ට පවා එක් කරන්නට ඇති බව අනුමාන කළ හැකිය.


ඒ අනුව අතීත දේශපාලන, සමාජ, ආර්ථික, යන ත්‍රිත්ව සහ සම්බන්ධය සොයායන්නෙකුට පර්යේෂණාත්මක ගවේෂකයෙකුට, බොහෝ දේ මතුකර ගැනීමට හැකිවනු ඇත. මෙම ටැම්පිට විහාරයේ මූර්ති, හා සිතුවම් අධ්‍යනයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් නුදුරු අනාගතය වෙනුවෙන් පවතින සංදර්භයේ කාලය වැඩි කිරීමට විවිධ පියවරයන් මේ වනවිට ලෙවන්ගම විහාරයේ ටැම්පිට විහාරයට ද ලබා දී ඇති අතර, ඒ අතරින් අතීත සිතුවම් චිත්‍ර හා මූර්ති සංරක්ෂණය, ගෘහ නිර්මාණ සංරක්ෂණය ආදිය ඉතා වැදගත් ය.

**සඳමාලි අප්සරා ගුණසේකර**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර (කැණීම්)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
සීතාවක.


## මැයි දිනය සැමරේ!

සෝදලා වේලලා
අල්මාරියෙ කොනක ලා
රෙදි ගොඩේ සැඟවුවා
කාටවත් නොපෙනෙන්න
රතු පාට තොප්පියයි, කමිසයයි
ලබන වසරේ මැයි දිනය නෙක්

රත්ගම උදේනි අරුණසිරි
සංවර්ධන නිලධාරි
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
කොටුව, ගාල්ල.



## පෙතන්ගොඩ උණ පඳුර කතා කරයි



සීතාවක පුරේ රජ පරපුරට ලඟයි
රසවත් කතා ජන වහරේ තවම තිබෙයි
පෙතන්ගොඩ උයනෙ නම රැක ගත්තෙ එයයි
කටු උණ පඳුර දැක්කම දැන් හිතට දුකයි

පෙතන්ගොඩ උයන වන අලි ඇතුන් ගෙන්
උයනට ඇතුල් වන තව වන සතුන් ගෙන්
රැකවරණය ද ලස්සන දුනි පිපුණු මලින්
සිරි නැරඹුවා කවුරුත් මගෙ ඉතා ඇගෙන්

මා ඉපදුනේ භාරතයේ දකුණු දෙසයි
ලංකාවට ආවෙ රජුගේ අණම නිසයි
කවුරුත් කියන්නේ මා රජු නැසුව විගයි
මා නොව රජු මැරුවෙ පඳුරේ සිටිය නයයි

අන් උණ පඳුරු මෙන් නොව මගේ කටු ද ඇති
ඒකයි හසුවුණේ වරදට කෙරුවෙ නැති
අනියත බවත් පෙන්වා මේ සසරේ ඇති
මම මිය ඇදෙමි මා හට දැන් සිටිය ඇති

ආර්. ඒ. චන්ද්‍රලතා
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
සීතාවක.

## හරස් පද ප්‍රහේලිකාව

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | 2 | ■ | 3 | | | 4 |
| | ■ | ■ | | ■ | | ■ | ■ | |
| 5 | | 6 | ■ | 7 | | 8 | ■ | |
| | ■ | | ■ | | ■ | | ■ | |
| ■ | 9 | | | | 10 | | ■ | |
| ■ | ■ | 11 | | | | ■ | 12 | |
| 13 | | 14 | ■ | 15 | | ■ | | ■ |
| | ■ | 16 | 17 | ■ | ■ | 18 | | |
| 19 | | ■ | | ■ | 20 | ■ | | ■ |
| | ■ | 21 | | | | ■ | 22 | 23 |
| | ■ | ■ | | ■ | ■ | 24 | ■ | |
| 25 | | ■ | 26 | | | | ■ | |

**හරහට**

1. පළඟ ගේ බිරින්දෑය.
3. කොට්ටය
5. සංග්‍රාමය
7. මෙනමින් දේවියක් සිටියේ ය.
9. ඉදිරි ගැබ හැඳින්වීමට යොදා ගැනේ.
11. දෙවනපෑතිස් රජු කළේ යැයි ප්‍රකට ප්‍රතිමාව
12. නැවත යන්නට පර්යාය වේ.
13. දෙවියන්ගෙන් ඉල්ලා සිටී.
15. උඩ යන්නට ප්‍රතිවිරුද්ධය.
16. මෙනමින් පැරණි නගරයක් විය.
18. කඳු මුදුන
19. ප්‍රකට දේශපාලනඥයකුගේ ඝාතකයා ලෙස හඳුනා ගැණින.
21. වඩාත් හොඳින් පැමිණි යන අරුත් ගැන්වේ.
22. මැරීම යන්නෙහි විධික්‍රියාව වේ.
25. අසුන් ගේ ප්‍රියතම ආහාරය කි.
26. සුඛ පබ්බත මෙනමින් හැඳින්වේ.

**පහළට**

1. තණ පැල
2. ගස් විශේෂයකි
3. ඉම සීමාව
4. සීතල යුද්ධය මෙනමින් හැඳින්වේ.
6. තව්තිසා දෙව්ලොව ඇති උද්‍යානයකි.
7. 108 මෙනමින් ද කියැවේ.
8. පුවත්පතක නමකි.
10. බුදුන් වහන්සේගේ ධාතු විශේෂයකි.
12. දැදිගම
13. කල්පාන්තයේ මුහුදින් හටගන්නා ගින්න
17. කලාමැදිරියා
20. අත යන්නට පර්යාය වේ.
23. එකැස් බෙරය මෙනමි.
24. පෘතුගීසීන් ගේ පෙරදිග මධ්‍යස්ථානය

*හරස් පද ප්‍රහේලිකාව සකසා අප වෙත එව්වේ,*
*අයි. ඩී. එච්. විජේබණ්ඩාර*
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, මහනුවර.*

# සිතුම්



## මඟුල් කෑම

නෑ සිය හිතවතුන්
හොඳින් කා බී
සතුටු වී සුභපතති.
මල් පිරුණු අසුන මත හිඳ
නව යුවළ සැලසුම් කරයි
මඟුල් කෑමට ගත්
ණය ගෙවීමේ සටන

රත්ගම උදේනි අරුණසිරි

## (අ) සාධාරණය




හැදවතින් පින් සිතා
රුපියලක් දෙන්නට.....
තනන විට යාචකයෙකුට
පිටුපසින් අයදියි
එකයි පණහක බද්ධක්
කවුද දන් දුන්නත්......

එච්. එම්. එස්. කේ. ඇරැගම,
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,*
*සීතාවක.*

## රකුසෙක් වූ පැන්පොද



පෙරදිග ලෝකයේ සුන්දර මුතු ඇටය
ගිනි කඳු නාය අහලකවත් නැති රටය
ජීවත්වන්න ලෝකෙම සුදුසු ම තැනය
කියවා දැන ගන්නෙ රට ගැන මේ ලෙසය

කැළණිතිස් නිරිඳු මහවස පුවත එදා
පිළිගනු ලැබුයේ සුනාමිය ආ කලය මෙදා
මහවැලි කැලණි වලවේ ගං ඉවුරු බිඳා
ජීවිත බිලිගනී නොසිතුව ලෙසින් මෙදා

ගස් ගල්වලට බිලි පූජා නිමක් නැති
දහස් ගණන් පොල් ගසනා රටක් මැති
කාණුව බෝක්කුම පාලම ඉඩම නැති
සංවර්ධනේ එල මහිමය බලනු නිති

අයි. ඩී. එම්. විජේබණ්ඩාර
*පුරාවිද්‍යා කාර්යාලය*
*මහනුවර*

## සුරකිමු උරුමය

වෙහෙර සිඳ බිඳ දමා
යස ඉසුරු සොයන්නට
වෙර දරන මිනිසුනේ
අසව් .......

අතීතය මතකයක්ව
මතකය උරුමයක්ව
අපවෙතට ළං කළේ
මහ පොළවෙ සැඟවගත්
ප්‍රෞඪ ඉතිහාසයයි

ප්‍රියදර්ශනී
නඩත්තු අංශය



## මිතුරෝ

හරියට මුහුද වගෙයි.....
පෙනුමයි වතුරයි විතරයි
තිබහ තිබුනට
බොන්න බෑ....?

එච්. එම්. එස්. කේ. ඇරැගම



# හංවැල්ල බලකොටුව



ලාංකීය ඉතිහාස කතාන්දරය තුලදී අපට මුලින්ම බලකොටු පිළිබඳව අසන්නට ලැබෙන්නේ අනුරාධපුරයුගයේදී එළාර දුටුගැමුණු ද්වන්ධ සටන සිදුවූ විජිතපුර බළකොටුව හා සීගිරි කාශ්‍යප රජසමයේ සීගිරිය මුල් කරගනිමින් ඉදිවූ බලකොටු විස්තර මගිනි. එය එකම හා පළමු දේශීය බලකොටු ද නොවන බව සැලකිය යුතුය. පැහැදිලි සාක්ෂි සහිත බලකොටු පමණක් අප කතා කළ ද අස්ථාවර අමුද්‍රව්‍ය යොදා ගොඩනගන ලද බොහෝ බලකොටු විනාශ වන්නට ඇත. ඒ අනුව මෙරට රාජවංශය තුළදී විවිධ අවස්ථාවන්හි දී ආරක්ෂිත ඒකකයන් ලෙසින් බලකොටු ඉදිකර ඇතිබව ස්ථිර ය. ඉන් පසුව මෙරට වැඩිවශයෙන්ම බලකොටු පිළිබදව අසන්නට ලැබෙන්නේ යටත් විජිත සමයේදී ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් විසින් ඉදිකරන ලද බලකොටු පිළිබදවය. ඒ සියල්ලක්ම ඉදිකරන ලද්දේ ආරක්ෂාව, පරිපාලන ඒකක, හා වෙළඳ උපායන්, ලෙසින් භාවිතයට ගැනීමටය.

කැලණි ගඟට මායිම් වන හංවැල්ල ප්‍රදේශය කෝට්ටේ හා සීතාවක යන යුගයන්හි දී වැඩි වටිනාකමකින් යුතු ප්‍රදේශයක් විය. ඒ මෙරට ආක්‍රමණය කරන ලද පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රිසි යන විදේශිකයන්ට මධ්‍ය කඳුකරයට ඇතුලු වීමට මං අහුරන දේශිය ආරක්ෂිත මර්මස්ථානයක් බවට මෙකී භූ පිහිටීම් සහිත ප්‍රදේශය වැදගත් වූ නිසාය. වත්මන් බෙදීම් අනුව හංවැල්ල යනු කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන වෙළඳ නගරයකි. අතීතයේ දී මෙන්ම වර්තමානයේ දී ද පහතරටින් උඩරටට ඇතුලු වීමට ඇති බොහෝ මංමාවත් වැටී ඇත්තේ මෙම ප්‍රදේශ හරහා ය.

මුල්කල කෝට්ටේ රාජධානියට විශාල භූමි වපසරියක් තිබූ අතර, ක්‍රිස්තු වර්ෂ 1521 දී විජයබා කොල්ලය නම් දේශීය කුමන්ත්‍රණය හමුවේ එය කොටස් තුනකට වෙන්ව ගියේ කෝට්ටේ, රයිගම හා සීතාවක යනුවෙනි. ඒ අනුව සීතාවක පාලනය බාරවූ මායාදුන්නේ රජු විසින් වර්ෂ 1521 දී ආරක්ෂිත උපාය මාර්ගයක් ලෙසින් හංවැල්ල කේන්ද්‍ර කරගනිමින් මෙම ස්ථානයේ බලකොටුවක් ඉදිකළ බව කියවේ. ඒ අනුව එම බලකොටුවේ සිට කෝට්ටේ රජකම් කරන ලද බුවනෙකබාහු රජු සමග සටන් කළ බව කියවේ. ඒ බවක් වේරෝස්රිබයි රෝගේ ලේඛන සාක්ෂ්‍ය දරයි. මෙම කරුණින් පැහැදිලි වන්නේ වත්මන් බලකොටුව මුලින්ම ගොඩනගා ඇත්තේ දේශීය යාන්ත්‍රණයක් මතින් දේශීය සතුරන්ගෙන් ආරක්ෂාව සඳහා ය.

කෙසේ වෙතත් හංවැල්ල බලකොටුව පෘතුගීසීන්ට යටත්වීමෙන් පසුව ඔවුන්ගේ තාක්ෂණය භාවිතයට ගනිමින් ගල්, දැව, පස්, හා ගල් මෙන්ම කබොක් ද යොදාගනිමින් යලි සකසා තිබේ. ඒ අනුව මෙම බලකොටුවේ යුධ සේනාවක් රඳවා සිටි බව ගෝවේ මැතියස්ද ඇල්බියුකර්ස් වෙතට යවන ලද පණිවිඩයක් පිළිබඳව සටහන් කර ඇති ජොඅබීරි බෙයිරෝගේ වාර්තාවක සදහන්වේ. ඒ අනුව පෘතුගීසි ජාතිකයන් විසින් තම යුධකටයුතු වෙනුවෙන් හංවැල්ල බලකොටුව භාවිතයට ගෙන ඇති බව මින් පැහැදිළි ය. ලංකාවේ බොහෝ බලකොටු සඳහා පෘතුගීසීන් විසින් අනුගමනය කර ඇත්තේ එකම ආකෘතිකමය රටාවක් හා නිර්මාණාත්මක ක්‍රමවේදයක් ය.

පෘතුගීසි පාලනයට පසුව මෙරට ආක්‍රමණය කරන ලද ලන්දේසි (ඕලන්ද) ජාතිකයන් විසින් මෙම බලකොටුවේ පාලනය ලබාගත්තේ වර්ෂ 1658 දී ය. ඒ අනුව ඔවුන් ද හංවැල්ල නම් යුධ මර්මස්ථානයට පෙම්බදිමින් ඔවුනට රිසි සේ සේවාවන් සලසා ගන්නා ලදී. විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණ වන්නේ ලංකාවේ වැඩිමණක් නිර්මාණාත්මක බලකොටු ඉදිකිරීමේ ගෞරවය ඇත්තේ ඕලන්ද ජාතිකයන්ට ය. ඔවුන් රට අභ්‍යන්තරයේ ගොඩනගන ලද බොහෝ බලකොටු සඳහා වැඩි වශයෙන් ම භාවිතයට ගෙන ඇත්තේ කබොක් ගල් හා ගල්ය. ඔවුන් බොහෝ ශක්තිමත් හා සනකම් පවුරුමතින් බලකොටුවේ ස්ථිර බව හා ආරක්ෂාව තරකර ගත්තේ ය. 1684 වනවිට හංවැල්ල බලකොටුවේ වැඩ අවසන් කරන ලද ලන්දේසින් එම බලකොටුව අනෙකුත් බලකොටු අභිබවා කැපී පෙනෙන හා ආකර්ශණීය ලෙසින් පවත්වා ගන්නට සමත්ව තිබේ.

ක්‍රිස්තු වර්ෂ 1760 - 1761 යනකාල වකවානු වලදී ලන්දේසීන් හා සිංහල සොල්දාදුවන් අතර මෙම බලකොටුවේ දී සටන් කීපයක් සිදුවේ. ඒ අනුව කන්ද උඩ පාලකයා වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ප්‍රබල සේනාවන් මෙම හංවැල්ල කොටුවට පහරදීම් සිදුකර තිබේ. ඉන් දෙපිරිසටම දැඩි හානි සිදුවූ බව කියවේ. ලන්දේසි ජාතිකයන් විසින් මෙරට පාලනය ගෙනගිය කාලය බිඳ වැටෙන්නේ යළි ඉංග්‍රීසි ජාතිකයන් විසින් මෙරට ආක්‍රමණය කිරීමත් සමගය. එකී සිදුවීම්වල විශේෂත්වය වන්නේ මෙරට ආක්‍රමණය කරන ලද සෑම කණ්ඩායමක්ම ඔවුන්ගේ ආරක්ෂිත බලකොටු ලෙසින් තනා ගන්නේ ඊට පෙර බලකොටු ලෙසින් පවත්වාගෙන ආ ස්ථානයන්ම ය. ඒවායේ මුල් තත්වයන් සොයායෑමේ දී පැහැදිලි වන්නේ වැඩිමනක් බලකොටුවල ආරම්භය සිංහල ජාතිකයන් විසින් පවත්වා ගෙන ආ බවකි.

වර්ෂ 1832 දී හංවැල්ල බලකොටුව ඉංග්‍රීසි ජාතිකයන් විසින් තම යුධ හා පාලන අවශ්‍යතාවයන් සඳහා භාවිතයට ගෙන ඇති අතර උඩරට පාලකයන් සමග වරින්වර සටන් කීපයක් ද මේ බලකොටුවේ දී සිදුකර ඇත. ඒ සෑම විටම ජයග්‍රහණයන් මෙන්ම සිංහල සොල්දාදුවන් අතින් දරුණු පරාජයන්ට ද මුහුණ දීමට ඔවුනට සිදුව තිබේ.

කල්පිටියේ ඇති බලකොටුවට සමානකම් දක්වන හංවැල්ල බලකොටුව ඕලන්ද සමයේ දී අශ්ව ලාඩමක හැඩයෙන් වූ බවත්, කැළණි ගං දියබට මුහුණලා ඇති කොටස විවෘත කොටසක් ලෙසින් අලංකාරවත්ව සකසා තිබූ බවත්, ආරක්ෂක අට්ටාල 07 ක් තිබූ බවත්, වර්ෂ 1758 බලකොටුවට පැමිණි ලන්දේසි ජාතික කොස්තා හා වෙට්සල් යන අය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක සදහන් ය. ඊට අමතර ලෙසින් හේවාශාලා, වෙඩි බෙහෙත් ගබඩා, වෙළඳ ගබඩා, හා වෙනත් ගබඩා ද, තිබූ බව ඔවුන් සඳහන් කරයි.



කොටුවේ ඇතුල් බැම්මේ ස්වල්පයක් වූ සාධක ද, දිය අගලේ සාධක ද, එවැනිම තවත් තැනින් තැන විසිරුණ කබොක් ගල් සාධකත් හැරෙන්නට අනෙකුත් දෑ පසින් වැසී ගොස්ය. වැසී ඇති පස් ස්තර අභ්‍යන්තරය හංවැල්ල කොටුවේ බොහෝ රසවත් දෑ සඟවා ගෙන සිටින බවක් පෙනේ. එනිසාම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම ස්ථානය ආරක්ෂිත ස්මාරකයක් ලෙසින් අංක 1459 දරන ගැසට් පත්‍රයෙන් ආවරණය කර ඇත්තේ ජාතික උරුම බිමක් ලෙසට පත්ව ඇති නිසාය. මොහොතක් හෝ ඔබත් මේ ස්ථානයට පැමිණ අතීතය ස්මරණය කර හිත පුරා විඳින්න. ඒ තරමින්ම මෙහි අතීතය රසවත්ය.

**එච්. එම්. සමන් කුමාර**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර (කැණීම්)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
සීතාවක.
**ඡායාරූප**
නිශ්ශංක විජයරත්න

# ගිලී ගිය පැරණි නැව් ත්‍රිමාන තාක්ෂණයෙන් ප්‍රතිනිර්මාණය කරයි



දිය යට සැඟව ඇති අතීත උරුමයේ අසිරිය සාමාන්‍ය ජනතාවට සමීප කිරීමේ අරමුණින්, එංගලන්ත පුරාවිද්‍යාඥයින් කණ්ඩායමක් විසින් ගිලී ගිය පැරණි නැව් දෙකක් 3D මුද්‍රණ තාක්‍ෂණය උපයෝගී කරගනිමින් සාමාන්‍ය ජනතාව වෙත දෘශ්‍යමාන කිරීමට කටයුතු කරමින් සිටියි.

ස්කොට්ලන්තයේ ඩ්‍රම්බෙග් (Drumbeg) ආසන්නයේ ගිලී ඇති 17 වැනි ශත වර්ෂ අයත් නැවක් සහ පළමු වන ලෝක යුධ සමයේ පාවෙන රෝහලක් ලෙස බ්‍රිතාන්‍ය හමුදාවට සේවය කළ HMHS Anglia නම් ගිලී ගිය නෞකාවක් ඔවුන් මේ සඳහා තෝරා ගෙන ඇත.

මෙම නැව්වල දියයට ඡායාරූප සහ ඒවායෙහි පිළිබිඹු වන ද්‍රව්‍ය එකිනෙක අතර දුර මැනීම මගින් ද, ඡායාමිතික (Photogrammetry) ක්‍රම උපයෝගී කරගනිමින්ද, මෙම 3D මුද්‍රණ කටයුතු සිදු කරනු මේ සඳහා විශේෂිත වූ 3D පිටපත් ලබාගත හැකි නවීන මුහුණ යන්ත්‍රයක් ප්‍රථම වතාවට භාවිත කිරීම විශේෂිත වෙයි. තවද මෙහිදී දියයට දුරස්ත සංවේදන ක්‍රමයක් වන සෝනාර් (Sonar) භාවිතයෙන්ද විශාල දත්ත ප්‍රමාණයක් ලබා ගනියි. එම සෝනාර් මගින් ලබාදෙන ශබ්ද සහ ආලෝක තත්ත්ව විවිධ ලෙස උපයෝගී කර ගනිමින් නැව්වල ත්‍රිමාන ස්වරූපයන් ඒ ආකාරයෙන්ම ප්‍රතිනිර්මාණය කිරීමේ හැකියාව ඇති බව, එම ත්‍රිමානකරණ ව්‍යාපෘතියේ ප්‍රධානි සහ එංගලන්තයේ වෙසෙක්ස් (Wessex) පුරාවිද්‍යා ආයතනයේ




කළමනාකාර දියයට පුරාවිද්‍යාඥ John McCarthy පවසයි. මෙම ත්‍රිමාන මුද්‍රණ පිටපත් උපයෝගීත්වයෙන් එම නැව් දෙකෙහි ත්‍රිමාන ආකෘති ( Replica ) නිර්මාණය කිරීම ඔවුන්ගේ අරමුණයි.

දියයට සැඟව ඇති ඓතිහාසික තොරතුරු පිළිබඳ උනන්දුවක් දක්වන්නන්ට මෙම පුරාවිද්‍යාත්මක දත්ත වෙත භෞතික වශයෙන් වඩාත් සමීප වීමේ හැකියාව මෙම ත්‍රිමාන ආකෘති මගින් සැපයෙනු ඇත. විශේෂයෙන් පාසල් සිසුන් සඳහා මෙම ගිලුණු නැව් දෙකෙහි ආකෘති ප්‍රදර්ශනය කිරීමටත්, පසුව මහජනතාවට ප්‍රදර්ශනය සඳහා කෞතුකාගාරයකට ප්‍රදානය කිරීමටත් තීරණය කර ඇති බව McCarthy මහතා වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

# ප්‍රථමවරට ඊජිප්තු මමියක් මත රූපමය පච්ච සොයා ගැනේ





වසර 3000 ක් පැරණි ඊජිප්තු කාන්තා මමියක් මත හමු වූ නෙළුම් මල්, එළදෙනුන් හා දිව්‍යමය නේත්‍රවල රූපමය පච්ච (Tattoo) සළකුණු රැසකින් ඇගේ ආගමික විශ්වාසයන් ගැන කරුණු අනාවරණය කරන බව පුරාවිද්‍යාඥයින් පවසයි. මෙලෙස හිඳුනාගත හැකි රූපමය පච්ච කොටා ඇති ඊජිප්තු මමියක් හමුවන්නේ පළමුවරට වීම මෙහි ඇති විශේෂත්වයකි.

බටහිර නයිල් ගං ඉවුරේ පිහිටි ක්‍රි. පූ. 1550 - 1080 අතර කාලයට අයත් වූ දේර් - එල් - මෙදිනා (Deir - el- Medina) ගම්මානයෙන් මෙම මමිය හමුවී ඇත. එම ගම්මානයේ වාසයකර ඇත්තේ'' රජවරුන්ගේ නිම්නයේ '' (Valley of Kings) සොහොන් ඉදිකළ ශිල්පීන් හා කම්කරුවන්ය මෙම මමිය පිළිබඳ පර්යේෂණයේ යෙදෙන ඇමරිකාවේ ස්ටැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යාඥ ඈන් ඔස්ටින් පවසන්නේ මුලින් මෙම සළකුණු චිත්‍රනය කර ඇතැයි සිතුවද ඒවා පච්චයන් බව සොයා ගැනීම සුවිශේෂි වන බවයි.

මමියේ ගෙල, උරහිස් සහ පිට ප්‍රදේශයේ මෙන්ම බාහු වලද මෙම පච්ච හමුවේ ගෙල මත කොටා ඇති වැජට් (Wadjet) නමින් හඳුන්වන දිව්‍යමය නේත්‍ර හා නෙෆර් (Nefer) සළකුණුවල සංයෝගය වැදගත් හෝඩුවාවක් සපයයි. මෙම සංයෝගයෙන් "යහපතක් සිදු කිරීම" යන්න කියවෙන බැවින්, එය ඇගේ ගෙලෙහි කොටා තිබීමෙන් ඇය කථාකිරීමෙන් හෝ ගීත ගායනයෙන් යහපතක් කිරීමට ආධ්‍යාත්මික බලයක් යදින්නට ඇතැයි මත පළවේ.

දැනට මෙවැනි පච්ච හමුවන්නේ කාන්තා මමියන් මත පමණක් වීම විශේෂිත කරුණක් වන බව පවසන පුරාවිද්‍යාඥ ඔස්ටින්, එය කාන්තාවන්ටම සීමා වූ අලංකරණයක් දැයි තවදුරටත් පර්යේෂණ කළ යුතු බව පැවසෙයි. කෙසේ වුවත් ප්‍රථමවරට හමුවන මෙවැනි රූපමය පච්චයන් පැරණි ඊජිප්තු සංස්කෘතියේ පච්චවලට හිමිවූ වැදගත්කම මෙන්ම ඒවායේ සංකේතාත්මක ස්වරූපය පිළිබඳ අගනා තොරතුරු සපයයි.

විදේශ පුරාවිද්‍යා තතු සැකසුම

**අමල්කා විජේසූරිය**

**කෞශල්‍යා ගුණසේන**



**මෙම සිතුවම කෑගල්ල දිස්ත්‍රික්කයේ මැණික්කඩවර ටැම්පිට විහාරයෙහි සිතුවම් කළ පැරණි චිත්‍රයකි. මෙයින් චුල්ල ධර්මපාල ජාතකයෙහි ධර්මපාල කුමරුගේ විවාහ මංගල්‍ය අවස්ථාව නිරූපණය කෙරේ. මහනුවර සම්ප්‍රදායට අයත් මෙම සිතුවමෙහි විශේෂතාව නම් මෙය පෘතුගීසි යුගයෙහි නිර්මාණය වීමයි. පෘතුගීසීන් විසින් භාවිත ඔවුනට ආවේණික චාරිත්‍ර විධි සිතුවම් නිර්මාණ සඳහා පාදක කොට ගෙන තිබේ.**

**සිතුවමට නගා අප වෙත සැපයූවේ බස්නාහිර පළාත් පුරාවිද්‍යා කාර්යාලයේ ගයාත්‍රි කාංචනා කුමාරපේලි විසිනි.**


## උපදේශකත්වය හා අධීක්ෂණය
මහාචාර්ය සෙනරත් දිසානායක - පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

**සංස්කාරක**
සුනිල් බණ්ඩාර කෝරළගේ

**විශේෂ සහාය**
දීපාල් විජේතිලක - වැ.බ. අධ්‍යක්ෂ (ප්‍රවර්ධන )

**සිතුවම් නිර්මාණය**
සමන් කළුබෝවිල



**පාඨක ඔබේ අදහස් යෝජනා හා ලිපි ලේඛන**

සංස්කාරක,
''දායාද'' පුවත් පත,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.
යන ලිපිනයට යොමු කරන්න.
දුරකථන අංකය: 0112-688326
0112-692840 දිගුව 301


## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දුරකථන නාමාවලිය

| | | | |
|---|---|---|---|
| පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | - 011-2695255 | අංශ ප්‍රධාන (රසායන අංශය) | - 011-2691960 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | - 011-2683470 | සහකාර අධ්‍යක්ෂ (කෞතුකාගාර) | - 011-2696808 |
| නියෝජ්‍ය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් | - 011-2696808 | සහකාර අධ්‍යක්ෂ (අභිලේඛන) | - 011-2695609 |
| අධ්‍යක්ෂ (පාලන) | - 011-2698604 | සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ) | - 011-2696514 |
| අධ්‍යක්ෂ (මුදල්) | - 011-2694728 | සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) | - 011-2692844 |
| ගණකාධිකාරී | - 011-2667154 | සහකාර අධ්‍යක්ෂ (සැළසුම්) | - 011-2692842 |
| සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | - 011-2676449 | පුරාවස්තු විනාශය වැළැක්වීමේ | |
| පරිපාලන නිලධාරී | - 011-2691985 | විශේෂ ඒකකය | - 011-7222333 |
| | | විශේෂ පොලිස් ඒකකය | - 011-2694727 |
| | | | - 011-2692840 දිගුව 509/510 |
| අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) | - 011-2693216 | නීති අංශය | - 011-2692843 |
| අධ්‍යක්ෂ (පොදුසේවා අංශය) | - 011-2688326 | පොදු දුරකථනය | - 0112-692840-41 |
| | | වෙබ් අඩවිය : www.archaeology.gov.lk | |


පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2016 ජූලි මස පාදුක්ක, පානළුව, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ දී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.